


# විනයාර්ථදීපිකා

නම්

## විනය විනිශ්චය සන්නය.

පරම මහාවෛයාකරණ භදන්ත

# බුද්ධදත්තාචාර්‍යවර ප්‍රණීත

# විනය විනිශ්චය.

අමරපුරමූලවංශික මහානිකාය පිළිබඳ කාරකසභාවෙහි සභාපති
ධුරය හා ප්‍රධාන අනුනායකධුරයද උසුලන්නාවූ
රන්දොඹේ මහාචෛතිය පරිවෙණාධිපති ගෞරවාහී ශාස්ත්‍රාචාර්‍ය
තොටගමුවේ
පඤ්ඤාමෝලිතිස්ස මහා ස්ථවිර
ස්වාමීන්ද්‍රයාණන් වහන්සේගේ ශිෂ්‍යවූ
ඊළගෙදර සෝමාලෝක තිස්ස ස්වාමිපාදයන්
වහන්සේ විසින් ලියනලද

# විනයාර්ථදීපිකා

සන්න සහිතයි.

මොල්ලිගොඩ ශ්‍රී බිම්බකොදස පරිවෙණාධිපති ශ්‍රී මහාවිහාර
වංශාලඞ්කාර විමලකීර්ති පූජ්‍යාචාර්‍ය
රසිකම ඉන්දජෝත්‍යභිධාන නායක ස්ථවිර
ස්වාමීන්ද්‍රයාණන් වහන්සේ විසින්
අවසාන ශුද්ධිපත්‍රාවලෝකනයෙන් පිළිගෙන වදාරනලදී.

වලගෙදර ඇල්. පීටර් ද සිල්වා
මහත්මයා විසින්
අම්බලම්ගොඩ විජය සහ විද්‍යාදර්ශණ යන්ත්‍රාලයන්හි
මුද්‍රාඞ්කනය කරවනලදී.

ශ්‍රී බු. ව. 2460.
ක්‍රි. ව. 1918.

# ස ඥ ප න ය.

—※—

සුවිමල විපුල ශ්‍රද්ධා ප්‍රඥාදිගුණ සමුදය ජනක ශික්ෂා ශාසන නම් ලද විනය පිටකය පූර්වකාලයෙහි පාලිඅට්ඨකථා මාත්‍රයකින් අර්ථ යනාඛ්‍යාපන දෙක්හි. පැලඹීමින් පැවතඑන අතර **අට්ඨකථාචාර්ය්‍ය** අනු බුද්ධ බුද්ධඝොෂ මාහිමිසාණන් වහන්සේට සමකාලිකවූ චොළිරට උරගපුරාදි වාසිවූ **පරම මහා වෛයාකරණ භදන්තාචාර්ය** බුද්ධදත්ත මහාස්ථවිර ස්වාමිපාදයාණන් වහන්සේ විසින් සකල ශාසනික ආධුනිකානුග්‍රහ පුරඃසරව ග්‍රහණ ධාරණය සුකර වනු සඳහා. ගාථාබන්ධක්‍රමයෙන් **මේ විනයවිනිශ්චය** නම් ප්‍රකරණය මීට වර්ෂ (1450) එක්දහස්හාරසියපනසකට පමණ පූර්වයෙහිදි රචනාකර වදාරන ලද්දේවිය, මේ ප්‍රකරණය වනාහි උන්වහන්සේ **විසින්ම** අභිධර්ම පිටකයට රචනාකර වදාළ **අභිධර්මාවතාරය** මෙන්ම සකල ශාසනික ලජ්ජි පෙසල ශික්ෂාකාමී කුලපුත්‍රයන් විසින් සාතිශය ගෞරවාදරයෙන් පරිශීලනය කරනුලැබේ. මේ ප්‍රකරණය ලක්දිව හා බුරුමාදි විදේශයන්හිද සියලු ආචාර්ය පරම්පරාවන්හි අදවනතුරුම විනයනයාව බොධනාර්ථීන්ට ශාසනිකපණ්ඩිතවරයන් විසින් ප්‍රගුණ කරවනු ලැබේ. ප්‍රකරණ කර්තෘ චරිතාදි සවිස්තර කථා ප්‍රවෘත්ති සූචි පත්‍රාදිය ග්‍රන්ථාවසානයෙහිදී ප්‍රකාශ කරනු ලැබේ. මේප්‍රකරණයට පුලස්තිපුර වැඩවිසූ ටීකාචාර්ය ශාරිපුත්‍ර සඞ්ඝරාජ මහා ස්වාමිපාදයන් වහන්සේගේ ශිෂ්‍යවූ බුරුම රට අරිමද්දන නුවර රෙවතාභිධාන පණ්ඩිතතුමා යන් විසින් විරචිත ප්‍රශස්ත ටීකාවක්ද. සියම් රට විසූ පඬිවරයෙකු විසින් විරචිත අත්ථයොජනාවක්ද. කලිකාල සාහිත්‍ය සර්වඥ පණ්ඩිත පරාක්‍රම බාහු මහරජතුමන් විසින් ලියනලද **"වන විනිස"** නම් ව්‍යාඛ්‍යානයක් හා දඹල්ලේ වාලුකාරාමාධිපතිව වැඩවිසූ පණ්ඩිතාචාර්ය සිරිධීරානන්ද මහාස්ථවිර පාදයන්වහන්සේ විසින් ලියනලද ව්‍යාඛ්‍යානයක්ද තිබෙනුඅසන්ට ලැබේ. යථොක්ත ග්‍රන්ථයන්ගෙන් **වන විනිස** දැනට සපයාගැනීම ඉතාම දුෂ්කරයයි හඟිමු. දෙවන වියකන ඒ පරපුරෙහි පමණක් හසත සාරයක්මෙන් ගුප්තව තබාගෙන තිබෙනු හෙයින් ඉන් ලාබ්ධික අවශෙෂ පාරම්පරික ශාසනික කුලපුත්‍රයන්ට ප්‍රතිකාර හිත බවද ආධුනිකයන්ට සපයා ගතහැකි ටීකා අප්‍රසෙයා ජනාවන් ගෙන් යථාර්ථාව බොධය දුෂ්කර බවද. ඊට අභිනව ව්‍යාඛ්‍යානයක්

ප්‍රකාශප්‍රදානහොත් ඒ ශාසනාභිවෘද්ධි දෘශ්‍යකාමයිද සලකා වදළ වැලිතොට අම්බරුක්ඛාරාමාධිපති ශ්‍රී සුධර අග්ගවංසාලංකාර ශීලක්ඛන්ධාභිධාන අමරපුර මූලවංසික මහා නිකායෙහි මහානායක ස්වාමීන්ද්‍රයාණන්වහන්සේ විසින් මෙහෙයවන ලද අපිකිප්පලා සඞ්ගින් ලැබුණු ටීකාපොත් සතරක් හා අත්ථයොජනාවක්ද. සමන්ත පාසාදිකාව හා ජිනි ටීකාවද එකිනෙකට සමකර බලමින් අප මාගේ ගුරුනාම මහාචෛත්‍ය පිරිවෙණාධිපතීන් වහන්සේගේද විශේෂටවාපදේශ අතිවෑ විනයාර්ථ දීපිකා නම් මේ සන්නය මහත් පරිශ්‍රමයෙන් ලියා මුද්‍රණය කරවාගෙන ලෑ ආකාර බොහෝ දෙනෙකුන්ගේ බලවත් අපේක්ෂාවෙන් මුද්‍රිතවූ මේ කොටස මෙවර ප්‍රසිද්ධියට පමුණුවාලීමු.

තවද අපගේ මේ සත්ක්‍රියාවෙහිදී අතිගෞරවාර්හ මොල්ලිගොඩ ශුද්ධාචාරෝදය පිරිවෙණාධිපති ශ්‍රී මහා විහාරවංශාලංකාර විමලකීර්ති ශ්‍රී ඥානජෝති නායක ස්ථවිර ස්වාමීන්ද්‍රයන් වහන්සේ විසින් අවසාන සුඛපත්‍රාව ලෙකනයෙන් පිළිගෙන වදාළබවද මහාචෛත්‍ය පිරිවෙන්හි උප.චාර්‍ය්‍ය කොටගමුවේ සිද්ධාර්ථතිස්ස ස්වාමිපාදයන් වහන්සේ විසින් විශේෂාධාර කරන ලද බවද. මාදම්පේ නිග්‍රොධාරාමාධිපති සොමානන්ද ස්ථවිර පාදයන් වහන්සේගෙන් ටීකාවක් දීමෙන්ද රත්දෙණි සාරාලංකාරතිස්ස ස්ථවිර පාදයන් වහන්සේද, කොටගමුවේ ඥාණජෝතිතිස්ස, බේරතුඩුවේ ධම්මාධාරතිස්සයන ආයුෂ්මතුන්වහන්සේලා සෙසු ටීකාපොත් සපයාදීම් ආදියෙන්ද ආධාර කළබවද කෘතඥතා පූර්වකව සිහිපත් කරම්හ. අපගේ ප්‍රමාදදීන් ජනිතඛලිත ස්ථාන වබලී කරණිය සුධීන් විසින්ම සමාධීන් සංවයුතුබව හා ප්‍රපාරම්ශ අසාධූන්ගැන අනුකම්පා කරනබවද සිත්වතක් කරමු.

සිට,

වලගෙදර සොමාලොකතිස්ස.
**W. Somaloka Tissa.**

2460/1918 ජනවාරිමස 25 දින

මහාචෛත්‍ය පිරිවෙනේදිය.

# විනයාර්ථදීපිකා නාම

## විනය විනිශ්චය සන්නය.

නමො තස්ස භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස.

1 වන්දිත්වා සිරසා A සෙට්ඨං බුද්ධමප්පටිපුග්ගලං,
භවාභවකරං ධම්මං ගණඤ්චෙව නිරඞ්ගණං.

2 භික්ඛූනං භික්ඛුනීනං ච B හිතත්ථාය සමාහිතො,
පවක්ඛාමි සමාසෙන විනයස්සවිනිච්ඡයං.

---

1 සෙට්ඨං, අතිශයින් ප්‍රශස්තවූ; අප්පටිපුග්ගලං, (තමහට සදෘශාධික පුද්ගලයෙකු නැතිහෙයින්) අප්‍රතිපුද්ගලවූ; බුද්ධංචෙව, සර්වඥයන්වහන්සේද; භවාභවකරං, භවයාගේ අභාවයකරන්නාවූ; ධම්මංචෙව, ධර්මයද; නිරඞ්ගණං. රාගාදිඅඞ්ගණරහිතවූ; ගණංචෙව, ආර්‍ය්‍යසඞ්ඝයාද; සිරසා, මස්තකයෙන්; වන්දිත්වා; (සකසා) වැඳ.

2 භික්ඛූනං, (උපසම්පන්න) භික්ෂූන්ගේද; භික්ඛුනීනංච, (උපසම්පන්න) භික්ෂුණීන්ගේද; හිතත්ථාය, හිතාභිවෘද්ධිය පිණිස; සමාහිතො, සමාධින්යුක්තවූයේ; විනයස්සවිනිච්ඡයං, විනයවිනිශ්චය නම් ප්‍රකරණය; සමාසෙන, සඞ්ක්ෂෙපයෙන් (හෙවත්) මධ්‍යම ක්‍රමයෙන්; පවක්ඛාමි, කියන්නෙමි.

---

A අයමෙතෙසං අතිසයෙන පසත්ථොති සෙට්ඨො-(පසත්ථසද්දතො අතිසයත්ථෙ ඉට්ඨප්පච්චයො පසත්ථස්ස සෙ ආදෙසොච) තං-නත්ථි එතස්ස පටිපුග්ගලො අධිකො සදිසො වා අප්පටිපුග්ගලො-තං, භවොවුද්ධි භවස්සවා අභාවංකරෙතීති භවාභවකරො, තං, (භවාභවසද්දූපපදකර කරණෙ අප්පච්චයො) අඞ්ගනාහි එතෙහි සත්තා නිහීනභාවං ගච්ඡන්තීති-අඞ්ගණානි,(රාගාදයො) තෙහි විමුත්තොති=නිරඞ්ගණො,තං, (නිපුබ්බ අඞ්ගගතියං.යු.)ගණීයතීති=ගණො(ගණ සංඛ්‍යානෙ-අ-)තං

B හිනොති ගච්ඡති යථාධිප්පෙතඵල සාධනෙ පවත්තතීති-හිතං(හි. ගතියං, ත; ස විභත්තිස්ස ආයාදෙසො) හිතත්ථාය, සමස්සතෙ සංඛිපියතෙති සමාසො.(සං.පුබ්බ අසු. සංඛෙපෙ.ණ)විනෙති සික්ඛාපෙතීති-විනයො-(විපුබ්බ. නී. නයෙ. අ) තස්ස-විනිච්ඡයනං විනිච්ඡයො-(වි නි පුබ්බ චි. චයෙ අ) විනයස්සවිනිච්ඡයොති, අලුත්තසමාසො-දෙවානංපියතිස්සොව,

3 අනාකුලමසංකිණ්ණං A මධුරත්ථපදක්කමං,
පටුභාවකරං එතං පරමං විනයක්කමෙ.

4 අපාරං ඔතරන්තානං සාරං B විනයසාගරං,
භික්ඛූනං භික්ඛුනීනං ච නාවාභූතං මනොරමං.

5 තස්මා C විනයූපායං විනයස්ස විනිච්ඡයං,
අවික්ඛිත්තෙන චිත්තෙන වදතො මෙ නිබොධථ.

---

3 අනාකුලං, (ශබ්දාර්ථවශයෙන්) පූර්වාපරවිරොධරහිතවූ; අසංකිණ්ණං, (නිකායාන්තර ලබ්ධීන් හා) අසම්මිශ්‍රවූ; මධුරත්ථපදක්කමං, මධුරවූඅර්ථ හා පදක්‍රමඇති; විනයක්කමෙ, විනයපිටකයෙහි; පටුභාවකරං, ප්‍රඥාවිශෙෂජනකවූ; පරමං, (එහෙයින්ම) උතුම්වූ; එතං, මේ විනයවිනිශ්චයනම්ප්‍රකරණය.

4 අපාරං, එතරක් නැත්තාවූ; සාරං, සාරවූ, විනයසාගරං, විනය (පිටක)නමැති සාගරයට; ඔතරන්තානං, (උද්ග්‍රහණධාරණාදිවශයෙන්) ප්‍රවිෂ්ටවන්නාවූ; භික්ඛූනංච, භික්ෂූන්ටද; භික්ඛුනීනංච, භික්ෂුණීන්ටද; මනොරමං, සිත්කලුවූ; නාවාභූතං, නෞකාවක්සදෘශවූයේවේද.

5 තස්මා, එසේහෙයින්; විනයූපායං, (භික්ෂුභික්ෂුණීන්ගේ) හික්මීමට කාරණවූ; විනයස්සවිනිච්ඡයං, විනයවිනිශ්චයනමප්‍රකරණය, වදතො, කියන්නාවූ; මෙ, මාකෙරෙහි; (ගෞරවයෙන්) අවික්ඛිත්තෙන චිත්තෙන, වික්ෂිප්තනොවූ (එකඟ)වූ චිත්තයෙන්; නිබොධථ, නිඃශෙෂයෙන් අවබොධකරව්.

---

A මධුරා ච තෙ අත්ථා චාති. මධුරත්ථා-පදානං කමො පදක්කමො. මධුරත්ථා ච පදක්කමො ච යස්ස-සො මධුරත්ථපදක්කමො; තං-පටති ගච්ඡති පජානාතීති-පටු, තස්ස භාවො පටුභාවො. තං (පඤ්ඤාවිසෙසං) කරොති ජනෙතීති පටුභාවකරො. තං;(පටුභාවස්ස පදකරකරණෙ, අ.) B සාගරොවියාති සාගරො. විනයොව සො සාගරො චාති විනයසාගරො තං-පවිසාමීති ක්‍රියා පදුස්සච විගතිනංවාචායං. තාන්තානං සාමි පච්චයො. තස්ස. ධාම්ආදෙසො.

C විවිධෙනාකාරෙන කායකම්මං කායකම්මෙසු සොජනවාරණ වසෙන නයති සික්ඛති-විනයං-උපෙච්චතං ඵලං ආයන්ති උපපජ්ජන්තීති උපායො=විනයස්ස උපායො විනයූපායො. තං. නිබොධථ-නිබුජ්ඣථ, බුධඤාණෙ.

6 තිවිධෙ තිලමත්තම්පි මග්ගෙ A සෙවනචෙතනො,
අඞ්ගජාතං පවෙසෙන්තො අල්ලොකාසෙ පරාජිතො.

7 පවෙසනං පවිට්ඨං වා ඨිත මුද්ධරණම්පි වා,
සසික්ඛො B සාදියන්තො සො ඨපෙත්වා කිරියං චුතො.

8 සන්ථතෙනඞ්ගජාතෙන සන්ථතං වා අසන්ථතං,
මග්ගං පන පවෙසෙන්තො තථෙවාසන්ථතෙන ච.

9 උපාදින්නෙ C නුපාදින්නෙ අනුපාදින්නකෙන වා,
ඝට්ටිතෙ අනුපාදින්නෙ සචෙ සාදියතෙ, න සො.

10 හොති පාරාජිකක්ඛෙත්තෙ පවිට්ඨෙ තු පරාජිතො,
ඛෙත්තෙ ථුල්ලච්චයං තස්ස දුක්කටඤ්ච විනිද්දිසෙ.

---

6-7 සසික්ඛො, (ශික්ෂාප්‍රත්‍යාඛ්‍යාන නොකොට) ශික්ෂාසහිතවූයේ; සෙවනචෙතනො, මෛථුනරාග නිශ්‍රිත චෙතනාවෙන් යුක්තවූයේ, තිවිධෙ, තුන්වැදෑරුම්වූ; මග්ගෙ, මාර්ගව්‍යවහාරගත ශරීර ප්‍රදෙශයෙහි; අල්ලොකාසෙ, (ප්‍රකෘතිවාත ස්පර්ශ නොවන) තෙත්වූ අවකාශයෙහි; අඞ්ගජාතං, පුරුෂනිමිත්ත; තිලමත්තම්පි, තල බිජුවක් පමණකුදු; පවෙසෙන්තො, ප්‍රවෙශකරන්නාවූ භික්ෂුතෙම; පරාජිතො, (කෙලෙස් සතුරන් විසින්) පරදවනලද්දේය; කිරියං ඨපෙත්වා, (ස්වකීය) ක්‍රියාව තබා; පවෙසනංවා, ප්‍රවෙශනක්ෂණයෙහි; පවිට්ඨංවා, ප්‍රවිෂ්ටක්ෂණයෙහි; ඨිතංවා, ස්ථිතික්ෂණයෙහි; උද්ධරණම්පිවා, උද්ධරණක්ෂණයෙහි; සාදියන්තො, ඉවසන්නාවූ; සො, ඒ භික්ෂුතෙම; චුතො, (ශාසනයෙන්) චුතවේ.

8 සන්ථතෙන, (සම් පිළි ආදියෙන්) වසනලද්දාවූ; අඞ්ගජාතෙන, පුරුෂනිමිත්තෙන්; සන්ථතංවා, (එබඳු) පිළි සන් ලද්දවූහෝ: අසන්ථතංවා, පිළි සන් නොලද්දවූහෝ; මග්ගංපන, මාර්ගය වනාහි; පවෙසෙන්තො, ප්‍රවේශකරන්නේ; අසන්ථතෙනච, පිළිසන් නොලද්දාවූ; අඞ්ගජාතෙන, පුරුෂනිමිත්තෙන්; සන්ථතංවා, පිළි සන්ලද්දාවූහෝ; අසන්ථතංවා, පිළි සන් නොලද්දාවූහෝ; මග්ගං, මාර්ගය; තථෙව, එපරිද්දෙන්ම; පවෙසෙන්තො, ප්‍රවෙශකරන්නේ; (තවරකලපාරාජිකාපන්නවේදයත්).

9-10 උපාදින්නෙන, (වස්ත්‍රාදීන් නිමිත්ත පිළිසන්නොකරනලද හෙයින්) නෂ්ටනොවූ කාය ප්‍රසාදයඇති; අඞ්ගජාතෙන, පුරුෂනිමිත්

---

A සෙවනෙ මෙථුනප්පයොගෙ චෙතනා අස්සාති-සෙවනචෙතනො.
B සික්ඛාය සහ වත්තතීති-සසික්ඛො.
C තණ්හාදිට්ඨීහි උපෙතෙන කම්මුනා අත්තනො ඵලභාවෙන ආදින්නානං ගහිතානන්ති උපාදින්නානං.(උප. ආ. පුබ්බ ද දෙත න)තෙන.

11 මතෙ අක්ඛායිතෙ චාපි යෙභුය්‍යක්ඛායිතෙ පිච,
මෙථුනං පටිසෙවන්තො හොති පාරාජිකො A නරො.
12. යෙභුය්‍යක්ඛායිතෙ චාපි උපඩ්ඪක්ඛායිතෙ පි ච,
හොති ථුල්ලච්චයාපත්ති B සෙසෙ ආපත්තිදුක්කටං. C

---

තෙන්; උපාදින්නවූ, අනෂ්ට කායප්‍රසාදවත් නිමිත්තෙක හෝ; අනුපාදින්නවූ, නිමිත්ත වසනලද වස්ත්‍රාදියෙකහෝ; පාරාජිකක්ඛෙත්තෙ, පාරාජිකක්ෂෙත්‍රයෙහි; ඝට්ටිතෙ, ඝැටුනකල්හිද; අනුපාදින්නකෙනවා, නිමිත්ත වසනලද වස්ත්‍රාදියෙන් යුක්තවූහෝ; අඞ්ගජාතෙන, පුරුෂනිමිත්තෙන්; උපාදින්නෙනවා, අනෂ්ටකාය ප්‍රසාදවත් නිමිත්තක හෝ; අනුපාදින්නෙනවා, නිමිත්ත ප්‍රතිච්ඡාදක වස්ත්‍රාදියෙහි හෝ; පාරාජිකක්ඛෙත්තෙ, පාරාජිකක්ෂෙත්‍රයෙහි; ඝට්ටිතෙ, ඝැටුනල; පරාජිතො. පරිජිවේ—එනම්, මේ සිව්තන්හි; පාරාජිකක්ඛෙත්ත; පරිජිකෙතෙහි; පවිෂ්ඨතු * පිවිටුකල්හිද; (යම් භික්ෂුවක්හතම)සෙව, ඉදින්, සාදියති (කාමරාගාභිභූතව) ඉවසාද; සොපි, හේතෙමේද; පරාජිතො, පැරදුනේවේ; ඛෙත්තෙ, ථුල්ලච්චයක්ෂෙත්‍රයෙහි; † ථුල්ලච්චයංච, ථුලසිඅැවැත්ද; (දුක්කටක්ෂෙත්‍රයෙහි) ‡ දුක්කටංච, දුකුළාද; තස්ස, ඒ භික්ෂුහට; විනිද්දිසෙ, දක්වන්නේය.

11 මතෙ, මළාවූ (මනුෂ්‍ය සත්‍රිආදීන්ගේ)ශරීරයෙහි; අක්ඛායිතෙ චාපි, (සර්වාකාරයෙන්) නොකනලදවූ නිමිත්තෙහිද; යෙභුය්‍යක්ඛායිතෙචඅපි(මදක්කෑලෙව) බොහෝනොකනලදවූ නිමිත්තෙහිද; මෙථුනංපටිසෙවන්තො, මෙවුන්දම් සෙවුනාවූ; නරො, භික්ෂුතෙම; පාරාජිකො හොති, පැරදුනේවෙයි.

12 යෙභුය්‍යක්ඛායිතෙචඅපි, සිව්භාගයෙන් තුන්භාගයක් පමණ කෑයවූ නිමිත්තෙහිද; උපඩ්ඪක්ඛායිතෙචඅපි, සමභාගවකෑයවූනිමිත්තෙහිද; (සෙවිනාහට) ථුල්ලච්චයාපත්ති හොති ථුලසිඅැවැත්වේ;

---

A පරාජීයතීති පාරාජිකො සික්ඛාකාරකයෙහි සිඬහෙයින් පරජිඅවුත් පුද්ගලයාවාච්‍යවේ—පරා-උපසර්ගයට දීර්ඝානකාරයටකකාරදවී.

B ථුලො අච්චයො-ථුල්ලච්චයො; ආපජ්ජතීති-ආපත්ති. (ආපුබ්බපද ගතිමහි පාති) ථුල්ලච්චයො යෙව ආපත්ති ථුල්ලච්චයාපත්ති—

C දුට්ඨුකතං. දුක්කටං. (දුපුබ්බකර කරණෙ ත.)නියතනපුංසකලිඞ්ග හෙයින් සවලිඞ්ගයෙන්ම විශෙෂණවී—

---

* තුශබ්දය සමුච්චයාර්ථහෙයින් ප්‍රවෙශන, සපිති. උඩාරයනසෙණ ත්‍රාද සඞ්ග්‍රහවේ, † ජීවමාන ශරීරයෙහි කන්. නාසා. ඇස්. වස්ති කොෂ. ව්‍රණ යනමොහු ථුල්ලච්චයක්ෂෙත්‍රයි.‡ හස්තමූලාන්තර උදර මඩ්ඩාදි අවශෙෂ ශරීර ප්‍රදෙශ දුක්කටක්ෂෙත්‍රයි—

13 නිමිත්තමත්තං සෙසෙත්වා ඛායිතෙ'පි සරීරකෙ,
නිමිත්තෙ මෙථුනං * තස්මිං සෙවන්තොපි පරාජයො.

14 උද්ධුමාතාදිසම්පන්නෙ සබ්බත්ථාපිච දුක්කටං,
ඛායිතාඛායිතං නාම සබ්බං මතසරීරකෙ.

15 ඡින්දිත්වා පන තච්ඡෙත්වා නිමිත්තුප්පාටිතෙ පන,
වණසඞ්ඛෙපතො තස්මිං සෙවං ථුල්ලච්චයං ඵුසෙ.

16 තතො මෙථුනරාගෙන පතිතායං නිමිත්තතො,
තායමුපක්කමන්තස්ස දුක්කටං මංසපෙසියං.

17 නඛපිට්ඨිප්පමාණෙ පි මංසෙ නහාරු(මහි) වා සති,
මෙථුනංපතිසෙවන්තො ජීවමානෙ පරාජිතො.

18 කණ්ණච්ඡිද්දක්ඛිනාසාසු වත්ථිකොසවණෙසු වා,
අඞ්ගජාතං පවෙසෙන්තො රාගා ථුල්ලච්චියං ඵුසෙ.

---

සෙසෙ, අවශෙෂ කිසිලි සම්පාදියෙහි; (සෙවනාහට) ආපත්ති දුක්කටං, දුකුලා ඇවැත් වේ.

13 නිමිත්තමත්තං, නිමිත්තමාත්‍රයක්; සෙසෙත්වා, ශෙෂකොට; සරීරකෙ ඛායිතෙඅපි, සියලුශරීරය ක්‍ෂයවූකල්හිද; තස්මිං නිමිත්තෙ, ඒනිමිත්තෙහි; මෙථුනං, මෛථුන්දම්; සෙවන්තොඅපි, සෙවනාහටද; පරාජයො, පාරාජිකාපත්තිවේ.

14 උද්ධුමාතාදිසම්පන්නෙ, ඉදිමකුණුවීම්ආදියට පැමිණිකල්හි; සබ්බත්ථාපිච, (පරිජී ථුලසි දුකුලා සඞ්ඛ්‍යාත) සියලුතන්හිද; දුක්කටං, දුකුලාවේ; ඛායිතාඛායිතංනාම, මේ ක්‍ෂයඅක්‍ෂයවිනලද්දනම්; සබ්බං, සියල්ල; මතසරීරකෙ, මළසිරුරෙහි; (දතයුතු.)

15 ඡින්දිත්වාපන, සිඳහෝ; තච්ඡෙත්වා, සැසහෝ; නිමිත්තුප්පාටිතෙ පන, නිමිත්තොත්පාටනයකළකල්හිවනාහි; වණසඞ්ඛෙපතො, ව්‍රණසඞ්ග්‍රහහෙයින්; තස්මිං, ඒනිමිති ඉඟුළුපෙදෙසෙහි; සෙවං, සෙවනයකරන්නේ; ථුල්ලච්චයං, ථුලසිඇවැත්; ඵුසෙ, අවදී.

16 තතොනිමිත්තතො, ඒ නිමිත්තප්‍රදෙශයෙන්; පතිතායං, (සිඳසැස) වැටුණාවූ; තායංමංසපෙසියං, ඒනිමිත්ත මාංසපෙශියෙහි; මෙථුනරාගෙන, මෛථුනරාගයෙන්; උපක්කමන්තස්ස, උපක්‍රමකරන භික්ෂුවහට; දුක්කටං, දුකුලාවේ.

17 ජීවමානෙ, දිවමන් සිරුරෙහි; නඛපිට්ඨිප්පමාණෙඅපි, නියපිටක්පමණවූද; මංසෙවා, (නිමිත්තොත්පාටනයකළ තන්හි) මස්හෝ; නහාරුමහිවාසති, නහරහෝශෙෂවූවක්ඇතිකල; මෙථුනංපතිසෙවන්තො, මෛථුනසෙවනයකරන්නේ; පරාජිතො, පරිජී අවදනාලද්දේවේ.

18 කණ්ණච්ඡිද්දක්ඛිනාසාසුවා, (ජීවමාන මනුෂ්‍ය ශරීරයෙහි) කන් සිදුරු ඇස් නාසාවන්හි හෝ; වත්ථිකොසවණෙසුවා, වස්ති

---

* මිථුනානං ඉදං මෙථුනං ඉදමෙත්ථ [illegible]

19 අවසෙස සරීරස්මිං උපකච්ඡ'රුකාදිසු,
වසා මෙථුන රාගස්ස සෙවමානස්ස දුක්කටං.
20 අස්සගොමහිසාදීනං ඔට්ඨගද්‍රභ දන්තිනං,
නාසාසු වත්ථිකොසෙසු සෙවං ථුල්ලච්චයං ඵුසෙ.
21 තථා † සබ්බතිරච්ඡානං අක්ඛිකණ්ණවණෙසුපි,
අවසෙස සරීරෙසු සෙවමානස්ස දුක්කටං.
22 තෙසං අල්ලසරීරෙසු මතානං සෙවතො පන,
තිවිධාපි සියා පත්ති ඛෙත්තස්මිං තිවිධෙ සති.
23 බහි මෙථුන රාගෙන නිමිත්තං ඉත්ථියා පන,
නිමිත්තෙන ඵුසන්තස්ස තස්ස ථුල්ලච්චයං සියා.

---

කොෂ වණයන්හි හෝ: රාගා, රාගචිත්තයෙන්; අඞ්ගජාතං, පුරුෂනිමිත්ත; පවෙසෙන්තො, ප්‍රවෙශකරන භික්ෂුතෙමේ; ථුල්ලච්චයං, ථුලසිඇවැත්; ඵුසෙ, ස්පර්ශකරන්නේය.

19 අවසෙසසරීරස්මිං, (නොකියනලද) සෙසු සිරුරෙහි; උපකච්ඡ'රුකාදිසු, උපකැස් කලවා ආදි තන්හි; මෙථුනරාගස්සවසා, මෛථුනරාගවශයෙන්; සෙවමානස්ස, සේවනාහට; දුක්කටං, දුකුළාවේ.

20 ඔට්ඨගද්‍රභදන්තිනං, * ඔටු කොටලු ඇත් යන මොවුන්ගේද, අස්සගොමහිසාදීනං, අශ්ව ගවමහිෂාදීන්ගේද; නාසාසු, නාසාවන්හි හෝ; වත්ථිකොසෙසු, වස්තිකොෂයන්හි හෝ; (මෛථුනරාගවශයෙන්)සෙවං, සෙවනතැනැත්තේ; ථුල්ලච්චයං, ථුලසිඇවත; ඵුසෙ, ස්පර්ශකරන්නේය.

21 සබ්බතිරච්ඡානං, සියලු තිරිසනුන්ගේ; අක්ඛිකණ්ණවණෙසුපි, ඇස් කන් වණයන්හිද; අවසෙසසරීරෙසු, අවශෙෂශරීරයෙහිද; තථා, එසේ (මෛථුනරාගයෙන්)සෙවමානස්ස, සෙවනයකරන්නාහට; දුක්කටං, දුකුළාවේ.

22 මතානං, මළාවූ; තෙසං, ඒ තිරිසනුන්ගේ; අල්ලසරීරෙසු, ආර්ද්‍රශරීරයන්හි; සෙවතොපන, සෙවනයකරන්නාහට වනාහි; තිවිධෙ, (අක්ෂයාදි ක්‍රමයෙන්) තුන්වැදෑරුම්වූ; ඛෙත්තස්මිංසති, (පරිජිථුලසිදුකුළා යන) ක්ෂෙත්‍රයන් ඇතිකල්හි; තිවිධාපිආපත්ති සියා, (පරිජිආදි) ත්‍රිවිධවූම ඇවැත්වේ.

23 ඉත්ථියාපන, (මනුෂ්‍යාමනුෂ්‍ය) ස්ත්‍රියගේවනාහි; නිමිත්තං බහි, නිමිත්තෙන් පිටත; නිමිත්තෙන, පුරුෂනිමිත්තෙන්;

---

* මෙහිදී ජීවමාන, සත්වයාම සඞ්ග්‍රහකටයුතු [illegible].

† තිරශ්චං අඤ්ඡන්ති ති=තිරච්ඡා–[illegible] [illegible]

24 කායසංසග්ගරාගෙන නිමිත්තෙන මුඛෙනවා,
නිමිත්තං ඉත්ථියා තස්ස ඵුසතො ගරුකං සියා.

25 තථෙ'වො භයරාගෙන නිමිත්තං පුරිසස්සපි,
නිමිත්තෙන ඵුසන්තස්ස හොති ආපත්ති දුක්කටං.

26 නිමිත්තෙන නිමිත්තංතු තිරච්ඡාන ගතිත්ථියා,
ථුල්ලච්චයං ඵුසන්තස්ස හොති මෙථුන රාගතො.

27 කායසංසග්ග රාගෙන තිරච්ඡානගතිත්ථියා,
නිමිත්තෙන නිමිත්තස්ස ඵුසනෙ දුක්කටං මතං,

28 අඞ්ගජාතං පවෙසෙත්වා තමාවත්ත කණ්ණ මුඛෙ,
තත්ථාකාසගතං කත්වා නීහරන්තස්ස දුක්කටං,

29 තථාචතුහිපස්සෙහි ඉත්ථියාසහසිමංතලං.
අඡුපන්තං පවෙසෙත්වා නීහරන්තස්ස දුක්කටං.

---

මෙථුනරාගෙන, මෛථුනරාගයෙන්; ඵුසන්තස්ස, ස්පර්ශකරන්නාවූ; තස්ස, ඒ භික්ෂුවට; ථුල්ලච්චයංසියා, ථුලසිවන්නේය.

24 ඉත්ථියා,(ජීවමාන මනුෂ්‍ය)ස්ත්‍රියගේ; නිමිත්තං, නිමිත්තය, කායසංසග්ගරාගෙන, කායසංසර්ගරාගයෙන්; නිමිත්තෙනවා,පුරුෂ නිමිත්තෙන් හෝ; මුඛෙනවා, මුඛයෙන්හෝ; ඵුසතො, ස්පර්ශක රන්නාවූ; තස්ස, ඔහට; ගරුකංසියා, ගරුකාපත්තිවන්නේය.

25 පුරිසස්සපි, ජීවමාන පුරුෂයාගේද; නිමිත්තං, නිමිත්තය; උභයරාගෙන, (කායසංසර්ග මෛථුන යන) උභයරාගයෙන්; නිමි ත්තෙන, අඞ්ගජාතයෙන්; තථාඑව, එපරිද්දෙන්ම; ඵුසන්තස්ස, ස්පර්ශකරන්නාහට; ආපත්තිදුක්කටංහොති, දුකුලාඇවැත්වේ.

26 තිරච්ඡානගතිත්ථියා, තිරිසන්ගියමාගමනගේ; නිමිත්තංතු, නිමිත්ත (පිටත) වනාහි; නිමිත්තෙන, (පුරුෂ) නිමිත්තෙන්; මෙථු නරාගතො, මෛථුනරාගයෙන්; ඵුසන්තස්ස, ස්පර්ශකරන්නාහට; ථුල්ලච්චයංහොති, ථුලසිඇවැත්වේ.

27 තිරච්ඡානගතිත්ථියා, තිරිසන්ගියමානමකගේ; නිමිත්තස්ස, නිමිත්තය; කායසංසග්ගරාගෙන, කායසංසර්ගරාගයෙන්; නිමිත්තෙ න, පුරුෂව්‍යඤ්ජනයෙන්; ඵුසනෙ, ස්පර්ශකිරීමෙහි; දුක්කටං,දුකුලා ඇවැත්වේයයි; මතං, දන්නාලදී.

28 ආවත්තකණෙහු, මව්‍යතකරනලද; මුඛෙ, මුඛයෙහි; අඞ්ගජා තං, අඟදිය; පවෙසෙත්වා, ප්‍රවෙශකොට; තත්ථ, එහි; තං, ඒඅඞ්ග ජාතය; ආකාසගතංකත්වා, (ස්පර්ශනොකිරීමෙන්)ආකාශගතකොට; නීහරන්තස්ස, ගන්නාහට; දුක්කටං, දුකුලාවේ.

29 තථා, එලෙස; ඉත්ථියා, ස්ත්‍රියගේ; චතුහිපස්සෙහි, (නිමිත්ත සම්බන්ධ) සිවුපසින්; සහසීමංතලං, සමතාගය, අඡුපන්තං, ස්පර්ශනොකරමින්; පවෙසෙත්වා, ප්‍රවෙශකොට; නීහරන්තස්ස, ඉබට ගන්නාහට; දුක්කටං, දුකුලාවේ.

30 උප්පාටිතොට්ඨ මංසෙසු බහිනික්ඛන්තකෙසු වා,
දන්තෙසු වායමන්තස්ස තස්ස ථුල්ලච්චයං සියා,
31 අක්ඛිසඞ්ඝට්ටනං කත්වා මග්ගෙ දුවිධ රාගතො,
සුක්ඛෙමුත්ත'පිවා'මුත්තෙ වායමන්තස්ස දුක්කටං,
32 ඉත්ථිංමෙථුන රාගෙන ආලිඞ්ගන්තස්ස දුක්කටං,
හත්ථග්ගාහ පරාමාස චුම්බනාදීස්වයං නයො.
33 අපදෙ අහයොමච්ඡා කපොතා දිපදෙපි ච,
ගොධා චතුප්පදෙහෙට්ඨා වත්ථුපාරාජිකස්සිමෙ.
34 සෙවෙතු කාමතා චිත්තං මග්ගෙමග්ගප්පවෙසනං,
ඉදමඞ්ගද්වයං වුත්තං පඨමන්තිම වත්ථුනො.

---

30 උප්පාටිත, උපුටනලද; ඔට්ඨමංසෙසුවා. ඔෂ්ඨමාංශය ඇතිවූ හෝ; බහිනික්ඛන්තකෙසුවා, (ප්‍රකෘතියෙන්) පිටතට නික්මියාවූ හෝ; දන්තෙසු, දත්තයන්හි; වායමන්තස්ස, (අඞ්ගජාත ස්පර්ශ කිරීම්වශයෙන්)ව්‍යායාම්කරන්නාවූ; තස්ස, ඔහට; ථුල්ලච්චයංසියා ථුලසිවන්නේය.

31 අක්ඛිසඞ්ඝට්ටනංකත්වා,(නිමිතිමස ඇසුරුකළ)ඇටඑක්කොට; මග්ගෙ, ඒ (ඇටමුවා) මාර්ගයෙහි; දුවිධරාගතො, (මෛථුනරාගකාය සංසර්ගරාගයන) දුවිධරාගයෙන්; වායමන්තස්ස, (නිමිත්ත ප්‍රවේශකොට) ව්‍යායාම්කරන්නාහට; සුක්ඛෙ, සමඝවය; මුත්තෙපිවා, මිදුණුකලහෝ; අමුත්තෙපිවා, නොමිදුණුකලහෝ; දුක්කටං, දුෂ්කෘතාපත්තිවේ.

32 මෙථුනරාගෙන, මෛථුනරාගයෙන්; ඉත්ථිං, ස්ත්‍රිය; ආලිඞ්ගන්තස්ස, වැළඳගන්නාහට; දුක්කටං, දුකුළාවේ; හත්ථග්ගාහපරාමාස චුම්බනාදිසු, අතින්ගැන්ම පරාමර්ශනය චුම්බනය යනාදියෙහිද; අයංනයො, මේක්‍රමයයි, (දුකුළාවේ.)

33 අපදෙ, පානැති සත්වකොටසෙහි; අහයොපිච, නාගයෝද; මච්ඡාපිච, මත්ස්‍යයෝද; දිපදෙ, දෙපාඇති සත්වකොටසෙහි; කපොතාච, පරවියෝද; චතුප්පදෙ, සිවුපාඇති සත්වකොටසෙහි; ගොධාපිච, ගොයිද යන; ඉමෙ, මේ සත්වයෝ, හෙට්ඨා, යටත්පිරිස යෙන්; පාරාජිකස්ස, (මෛථුනධර්ම) පාරාජිකාවට; වත්ථු, වස්තුහු වෙත්.

34 සෙවෙතුකාමතාචිත්තං, (මෙවුන්දම්) සෙවනකරනු කැමති සිතද; මග්ගෙ, (තෙවැදෑරුම් මංඅතුරෙහි එක්තරා) මඟෙක; මග්ගප්පවෙසනංච, (තමාගේ) නිමිත්ත ප්‍රවේශකරණයද යන; ඉදංඅඞ්ගද්වයං, මේ අඞ්ගද්වය; පඨමන්තිමවත්ථුනො, ප්‍රථම පාරාජිකාවට; වුත්තං, කියනලදී.

35 දුක්කටං පඨමස්සේව සාමන්තන්ති වණ්ණිතං,
සේසානං පන තිණ්ණම්පි ථුල්ලච්චය-මුදීරිතං.

36 අනාපත්තීති ඤාතබ්බා අජානන්තස්ස භික්ඛුනො.
තථේවා'සාදියන්තස්ස ජානන්තස්සා'දි කම්මිනො.

37 විනයෙ A අනයූපරමෙ පරමෙ B සුජනස්ස සුඛාපනයෙ නයනෙ,
පටු හොති පධානරතො නරතොඉධ යොපන සාරමතෙරමතෙ.

---

35 පඨමස්ස, ප්‍රථම පාරාජිකාවට; දුක්කටංඑව, දුකුළාවම; සාමන්තංඉති, සාමන්තයයි; වණ්ණිතං, කියනලදී; සෙසානංපන, සෙසුවූ; තිණ්ණම්පි, (අදත්තාදානාදි) තුන්පරිජිඇවැතුන්ටම; ථුල්ලච්චයං, ථුලසිය; (සාමන්තයයි) උදීරිතං, කියනලදී.

36 අජානන්තස්ස, (අනුන්විසින් කරනලද ව්‍යතික්‍රමය) නොදන්නාවූ; භික්ඛුනො, භික්ෂුවහට; අනාපත්තිඉති, අනාපත්තියයි; ඤාතබ්බං, දතයුතු; තථාඑව, එපරිද්දෙන්ම; අසාදියන්තස්ස, (ආස්වාදනොකිරීම්වශයෙන්) නොඉවසන භික්ෂුහටද; ජානන්තස්ස, දන්නාවූ; ආදිකම්මිනො, ආදිකර්මික (සුදින්න) භික්ෂුවහටද; (අනාපත්තියයි දතයුතු.)

37 සාරමතෙ, අර්ථසාරව්‍යඤ්ජනසාරදෙකින් යුක්තවූ; ඉධ, මේ විනයවිනිශ්චයනම් ප්‍රකරණයෙහි; යොපන, යමෙක් වනාහි; රමතෙ, (ග්‍රහණධාරණවශයෙන්) ඇලේද; (නොඑනම්) අනයූපරමෙ, (කායවාග්ද්වාරයන්ගේ අසංවරසඞ්ඛ්‍යාත) අනයයාගේ නැවැත්මට ආධාරවූ; පරමෙ, (එහෙයින්) උතුම්වූ; (නොහොත්) උත්තම ශාසනසම්පත්තියෙන් යුක්තවූ; සුජනස්ස, (ශික්ෂාකාමී සිල්වත්) කුලපුත්‍රයාහට; සුඛාපනයෙ, (ලෞකිකලොකොත්තර) සැපගෙනදෙන්නාවූ; නයනෙ, නයනොපමවූ (හෙවත්) ප්‍රඥාචක්ෂුසවූ; විනයෙ, විනයපිටකයෙහි; රතො, (අතිශයින්) ඇලුනේ; පධානරතො, (උච්චාරණවිභජනාදි වශයෙන්) පධන්හි ඇලුනේ; පටුහොති, (විනයෙහි) දක්ෂ වේ. (ඉකාරය පදපූරණයෙහි නිපාතයි)

---

A නෙති සීලසම්පදං පාපෙතීති-නයො. නත්ථි නයො එතස්සාති අනයො උපරමතීති උපරමො-අනයස්ස උපරමො-අනයූපරමො-තස්මිං-- B ලොකියලොකුත්තරභෙදං. සුඛං ආනෙතීති-සුඛානයනං. තස්මිං --

38 ඉමං C හිතවිභාවනං භාවනං අවෙදි D සුරසඞ්ගවං E සමඞ්ගවං,
F සමාරබලිසාසනෙ සාසනෙ සමෙමා භවතු'පාලිනා. G පාලිනා.

—0—

**ඉති විනයවිනිච්ඡයෙ පඨමපාරාජිකකථා නිට්ඨිතා—**

—※—

39 ආදියන්තො හරන්තො'ව හරන්තො ඉරියාපථං,
විකොපෙන්තො තථාඨානා චාවෙන්තොපි පරාජිතො. A

---

38 හිතවිභාවනං, (ලෞකික ලොකොත්තර සම්පත්ති සාධක ප්‍රාතිමොක්ෂසංවරශීලසඞ්ඛ්‍යාත) හිතසම්පත්තිප්‍රකාශකවූ; භාවනං, නැවත නැවත සිත්හි වැඩියයුතුවූ; සුරසඞ්ගවං, (ශබ්දවිරසයෙන් හා විමුක්තිරසයෙන්ද අතිශයාස්වාදනීයවූ (හෙවත්) සොභනරස වත්වූ; සමඞ්ගවං, (කායික චෛතසික) සැපඋපදවන්නාවූ; ඉමං, මේ විනයවිනිශ්චය නම් ප්‍රකරණය; (යො, යම් කුලපුත්‍රයෙක්) අවෙදි,(ග්‍රහණධාරණවශයෙන්) අවබොධකෙළේද සො, හෙතෙම; මාරබලිසාසනෙ, මාරගොචරය හිංසාකරන්නාවූ (හෙවත්) කෙලශ මාර ගොචරභාවයෙන් බලිසඞ්ඛ්‍යාත සත්‍රිශරීරාදි නිශ්‍රයසපශීාදි විෂය පරිත්‍යාගය කරවනලද හෙයින්) මාරබලිසාසන නම්වූ; සාසනෙ, ත්‍රිවිධ ශාසනයෙහි; පාලිනා, විනයප්‍රඥප්තිපාලකවූ; උපාලිනා, (විනයධර භික්ෂූන්ගෙන් අග්‍රවූ) උපාලිනම් මහාක්ෂීණාශ්‍රවයන් වහන්සේ හා; සමෙමාභවති, (විනයාධිගම හෙතුවෙන්) සමවේ.

**මෙසේ විනයවිනිශ්චයෙහි ප්‍රථම පාරාජික කථාව නිමියේය.**

—※—

39 ආදියන්තො, (අන්සතුආරාමාදිය සොරසිතින් යුක්තකිනා) අයිතිකරගන්නැතැත්තේ; පරාජිතො, (ඔහුමග්ද තමාගේද ධුරනි

---

C හිතංවිභාවෙතීති–හිතවිභාවනො. තං. D රසීයති අස්සාදීයතීති–රසො–සොභනො රසො සුරසො. සුරසං භවතීති සුර...සඞ්ගවො–තං E සංසුඛං එතස්මා භවතීති සමඞ්ගවො, තං F බලිසං ...ති බලිසං, මාරස්ස බලිසං මාරබලිසං–තං අසති. විපතිඑතෙනාති–මාරබලිසා සනං මාරබලියසඥුපපදඅසුබෙපතෙ. යු. මාරස්ස බලිමාරබලි–මාරබලිස්සසාසනං හිංසනංවා–මාරබලිසාසනං. තස්මිං–G සාසනං පාලෙතීති පාලො–පාලොඅස්ස අත්ථීති පාලි–තෙන.

A පරසන්තකං ආරාමාදිං අභියුඤ්ජිත්වා සාමිකා පරාජෙත්වා ථෙය්‍යචිත්තෙන ගණ්හන්තො තදත්ථායකතෙ පුබ්බපයොගෙ දුක්කටං සාමිකස්ස විමතුප්පාදනෙන ථුල්ලච්චයංච ආපජ්ජිත්වා තස්සච අත්තනො ධුරනික්ඛෙපෙන පාතිමොක්ඛසංවරසීලසම්පත්තියා අද්‍යාසෙද හුත්වා පාරාජිකො හොති–ඉති. ටීකා.

40 නානා B නානෙකභණ්ඩානං පඤ්චකානං වසා පන
අවහාරා දසෙවෙතෙ විඤ්ඤාතබ්බා විභාවිනා.

41 සාහත්ථාණත්තිකා C චෙව නිස්සග්ගා අත්ථසාධකා,
ධුරනික්ඛෙපනං චා'ති ඉදං සාහත්ථපඤ්චකං.

ක්ෂෙපයෙන්) පරදිනලද්දේවේ; හරණතොපි, (අන්සතුබඩුහිසිම්‍රාදින් ගෙනයමින් සොරසිතින් සකන්ධාදියට බැස්වීමාදිවශයෙන්) හරණය කරනතැනැත්තේද; අවහරණතොපි, (අන්‍යයාවිසින් රක්නා සඳහා තමාවෙත තබනලදදේ තැවත ඉල්වූකල නොගත්තෙමැයි වංචාකර සොරසිතින් ගැනීම්වශයෙන්) අවහරණය කරනතැනැත්තේද; ඉරියාපථං විකොපෙන්තොපි, (අන්සතුබඩු ගෙනයන මිනිසුන්ආදීන්ගෙන්එකකු ඒබඩුසමග ගනිමැයි සොරසිතින් තමා කැමතිදෙසකට ගෙනයාමෙන් පියවි) ඉරියව් විකොපනය කරන තැනැත්තේද; ඨානාචාවෙන්තොපි, තුබූතැනින් (කෙසගක්පමණ කුදු සොරසිතින්)තොරකරනතැනැත්තේද; තථාපරාජිතො, එසේ පරදිනාලද්දේවේ

40 නානෙ, ඒගාථාවෙහි(හෙවත්)ආදියනාදිපඤ්චකයෙහි; නානෙකභණ්ඩානං පඤ්චකානං වසාපන, නානාභණ්ඩපඤ්චකය එකභණ්ඩපඤ්චකය ‡යන මොවුන්ගේ වශයෙන් වනාහි; එතෙදස, (නානාභණ්ඩපඤ්චකය එකභණ්ඩපඤ්චක වශයෙන්වූ)මොහුදසදෙන; අවහාරා, අවහාරනම්වෙත්යසි; විභාවිනා, විනයඥයාවිසින්; විඤ්ඤාතබ්බා, දතයුත්තාහුය.

41 සාහත්ථොචෙව, (අන්සතුද්‍රව්‍යයන් සොරසිතින් ගැනීම සංඛ්‍යාත) සාහත්ථිකාවහාරයද; ආණත්තිකොචෙව, (මෙතම් බඩුව

B නානා එකොච භණ්ඩා යෙසං-තෙ නානෙකභණ්ඩා-තෙසං-පඤ්චපරිමානා යෙසං තෙ පඤ්චකා-තෙසං-විසෙසං විනිච්ඡයං භාවෙති උප්පාදෙතීති විභාවී. (වි. පු. ගු. සන්නාගං ණී-)තෙන.

C සකො හත්ථො සහත්ථො සහත්ථෙන නිබ්බත්තො සාහත්ථිකො-ආණාපනං ආණත්ති. ආණත්තියා නිබ්බත්තො ආණත්තිකො. නිස්සජ්ජනං-නිස්සග්ගො. (නිපුබ්බ සජ විස්සග්ග. ණ.) ක්‍රියාසිද්ධියා පුරෙතරමෙව පාරාජිකා පත්තිසංඛාතං අත්ථං සාධෙතීති-අත්ථසාධකො-ධුරස්ස ආලයසංඛාතස්ස භාරස්ස නික්ඛිපනං විස්සජ්ජනං-ධුරනික්ඛෙපනං-පඤ්චන්නං අවහාරානං සමූහො-පඤ්චකං සාහත්ථාදිපඤ්චකං-සාහත්ථපඤ්චකං

‡ සවිඤ්ඤාණක අවිඤ්ඤාණක භාණ්ඩයන්ගේ ආදියන. හරණ අවහරණ. ඉරියාපථවිකොපන. ඨානාචාවන. වශයෙන් පැවැත්තේ නානාභණ්ඩපඤ්චකයවේ. සවිඤ්ඤාණක භාණ්ඩයන්ගේ වශයෙන් පැවති එම ආදියනාදිපඤ්ච එකභණ්ඩපඤ්චකයවේ.

42 පුබ්බසහපයොගො ච සංවිදාහරණම්පි ච,
සඞ්කෙතකම්මං නෙමිත්තං පුබ්බයොගාදිපඤ්චකං A.

---

ගනුවයි යම්කිසිවෙකුට නියමකිරීමෙන් සිදුවන) ආණත්තිකාවහාරයද, නිස්සග්ගොචෙව, (සුංකඝාතාදියෙහි සිට සොරසිතින් බඩු පිටතදැමීම් සංඛ්‍යාත) නිස්සග්ගාවහාරයද; අත්ථසාධකොචෙව, (නොවරදවා ගන්නෙකුහට අසවල් බඩු හැකිකලක අවහරණය කරවයි නියොගකිරීම්ආදිලක්‍ෂණවූ අවහරණයට පළමුව පාරාජිකාපත්තියවන) අත්ථසාධකාවහාරයද; ධුරනික්ඛෙපනංච ඉති, (තමාවෙත තුබූබඩුආදියෙහි තමාගේද භාණ්ඩස්වාමියාගේද දීමෙහිද ගැනීමෙහිද ආලයහැරීම් සංඛ්‍යාත) ධුරනික්ඛෙපාවහාරයද යන; ඉදං, මේදක්වනලද්දේ; සාහත්ථපඤ්චකං, සාහත්ථිකාදි * (අවහාර) පඤ්චකයවේ.

42 පුබ්බපයොගොච, (නියොග නොවරදවා ගන්නෙකුහට අසවලාගේ මෙනම් බඩු ගනුවයි නියොගකිරීම්සංඛ්‍යාත) පූර්වප්‍රයොගාවහාරයද; සහපයොගොච, (අන්සතු බිම්ගැනීමෙහි සීමාසංක්‍රමණාදිය ඉක්මවීම් ආදිවශයෙන් පැවති) සහප්‍රයොගයද; සංවිදාහරණම්පි ච, (බොහෝදෙනා එකතුව සමානච්ඡන්දයෙන් ඒ එකකුගේ සියල්ලන්විසින් අන්සතු බඩු සොරසිතින් ගැනීම්සංඛ්‍යාත) සංවිදාවහාරයද; සංකෙතකම්මංපිච, (පූර්වාහ්ණාදි කාලපරිච්ඡෙදවශයෙන් මෙකල මෙනම්දෑගනුවයි දැන්වීමෙන් කරනලද) සංකෙතකර්මාවහාරයද; නෙමිත්තංපිච, (කරනලද මාත්‍රනයපරිදි පරභාණ්ඩාවහරණයට හේතුවූ ඇස ඉඟිකිරීම්ආදි නිමිත්තකර්මයෙන් උපදනාලද) නෙමිත්තාවහාරයද; යනමොහු පුබ්බයොගාදි පඤ්චකං, පූර්වප්‍රයොගයආදිකොටඇති (අවහාර) පඤ්චකයවේ.

---

A කායෙන වා වාචාය පයුජ්ජනං ආණාපනං—පයොගො (ප පුබ්බ යුජ. යොගෙ ණ.) (ආණත්තස්ස භණ්ඩග්ගහණතො පුබ්බත්තා) පුබ්බො ච සො පයොගො චාති පුබ්බපයොගො—පයොගෙන සහ වත්තමානො අවහාරො—සහපයොගො—සංසම්මන්ත්‍රිතා විදහෙත්වා මන්තෙත්වා අවහරණං—සංවිදාහරණං (සං වි පුබ්බ. හර හරණෙ යු) කාලපරිච්ඡෙදන සංජානනං සඞ්කෙතො—සඞ්කෙත කතං කම්මං සඞ්කෙතකම්මං—නිමිත්තකතං නිබ්බත්තං නෙමිත්තං—පුබ්බපයොගොආදි යස්සාතං පුබ්බපයොගාදි පුබ්බයොගාදිච. තං. පඤ්චකං චාති— පුබ්බයොගාදි පඤ්චකං—

---

* ආදිසෙ අලුත්තාති ඤෙසො.

43 ථෙය්‍ය පසය්හ පරිකප්ප පටිච්ඡන්න කුසාදිකා,
අවහාරා ඉමෙ පඤ්ච වෙදිතබ්බාව විඤ්ඤුනා B.

44 වත්ථුකාල ග්ඝ දෙසො C ච පරිභොගො ච පඤ්චපි,
ඤත්වා එතානි කත්තබ්බො පණ්ඩිතෙන විනිච්ඡයො.

45 දුතියං වා පි කුද්දාලං පිටකං පරියෙසතො,
ගච්ඡතො ථෙය්‍යචිත්තෙන D දුක්කටං පුබ්බයොගතො.

---

43 ථෙය්‍ය-පසය්හ-පරිකප්ප-පටිච්ඡන්න-කුසාදිකා, ථෙය්‍ය, පසය්හ, පරිකප්ප, පටිච්ඡන්න, කුස, යන මොහු ආදි(උපපද)කොට ඇත්තාවූ; ඉමෙ පඤ්ච අවහාරා, මේ පස් අවහාරයෝ; විඤ්ඤුනා, විනයඥයාවිසින්; වෙදිතබ්බා එව, දතයුත්තාහුමවෙත්.

44 වත්ථු; සොරකම්කළ වස්තුවද; කාල, සොරකම්කළ කාලයද; අග්ඝ සොරකම්කළ වස්තුවෙහි අගයද; දෙසො ච, සොරකම් කළ දෙශයද; (යනසතරහා) පරිභොගො ච, (සොරකම්කිරීමට පළමුඅනුන්කළ) පරිභොගයද; ඉති-එතානි පඤ්චපි, මේ (වස්තුවාදි) කාරණාපසද; ඤත්වා, (විනිශ්චයට පළමුව) දැන; පණ්ඩිතෙන, විනයඥයාවිසින්; විනිච්ඡයො, (අදත්තාදානප රාජිකා) විනිශ්චයතෙම, කත්තබ්බො, කටයුත්තේය.

45 ථෙය්‍යචිත්තෙන, * සොරසිතින්; දුතියං වාපි, දෙවනපුද්ගලයෙක් හෝ; කුද්දාලං වා, උදැල්ලක් හෝ; පිටකං වා, පැසක් හෝ; පරියෙසතොපි, සොයන්නාහටද; ගච්ඡතොපි, (සොයාලැබ හෝ නොලැබ) යන්නාහටද; පුබ්බයොගතො, (අදත්තාදාන යො) පූර්වප්‍රයොගහෙයින්; දුක්කටං, දුකුළාඇවැත්වේ.

---

B ථෙය්‍යංච පසය්හංච පරිකප්පොච පටිච්ඡන්නොච. කුසොච-ථෙය්‍යපසය්හපරිකප්පපටිච්ඡන්නකුසා. තෙ ආදිකාඋපපදභූතා යෙසං-තෙ. ථෙය්‍ය-පෙ-කුසාදිකා —

C වත්ථුච. කාලොච අග්ඝොච දෙසොච-වත්ථුකාලග්ඝදෙසො-සමාහාරමඥෙහි සමාහාරතැනක නපුංසකත්වය නොවනබැවින් ආධිපච්චපරිවාරෙරා" යනතන්හි මෙන් මෙහිද නපුංසකත්වය නොවී—

D ථෙනස්සකම්මං. ථෙය්‍යං-ආරම්මණං චින්තෙතීති-චිත්තං. චිත්තායං-ථෙය්‍යං චිත්තං යස්ස. සො ථෙය්‍යචිත්තො-තෙන

---

* ථෙය්‍යචිත්තෙන. දක්කීමෙන් මේ නිධානය ලැබ බුද්ධපූජාදිපිනක් කරන්නෙමි යනාදි කුශල චිත්තප්‍රවෘත්තියක් ඇතිකල්හි ඇවැත් දු නොවේ.

46 තත්‍ථ ජාතකකාළං වා ලතං වා ජිඤ්ඤතො පන,
දුක්කටං ^ උභයස්සාපි වුත්තං සහපයොගතො.
47 පචිත්තිං බන්ධතො වා පි චුම්බන්තො පංසුකම්ම වා,
ආමසන්තස්ස වා කුම්භිං හොති ආපත්තිදුක්කටං.
48 මුඛෙ පාසං පවෙසෙත්වා ඛාණුකෙ බද්ධකුම්භියං,
බන්ධනාන්තං විසා ඡෙදෙය්‍ය ඨානභෙදෙ විජානතා.
49 එකට්ඨානාති පනෙ'ත්‍ථ යස්මිං ඛාණුකෙ බද්ධකුම්භියා,
වලයං රුක්ඛමූලස්මිං පවෙසෙත්වං කතාය වා.
50 උද්ධරන්තස්ස ඛාණුං වා ජිඤ්ඤතො සඞ්ඛලිම්පි වා,
චුල්ලවච්ඡං තතො කුම්භිං ඨානා චාවෙති චෙ චුතො.

---

46 තත්‍ථ, ඒ නිධානමයනතෙහි; ජාතකකාළංවා, හටගත් තාළයක් හෝ; ලතංවා, ලතාවක් හෝ; ජිඤ්ඤතොපන, සිඳින් නාහට වනාහි; උභයස්සාපි, වියලිනොවියලි දෙකෙහිම; සහපයොගතො, අවහාරයසහිත ප්‍රයොගයෙහයින්; දුක්කටං, දුෂ්කෘතය; වුත්තං, කියනලදී.

47 පචිත්තිං,(කැපඅකැප) පොලොව; බන්ධතො වාඅපි, කණින් නාහටද; පංසුං, පස්; චුම්බන්තොඑවවා, එකතැන් කරන්නාහටද; කුම්භිං, නිධිකුම්භිය; ආමසන්තස්සවා, අංමර්ශනයකරන්නාහටද; ආපත්තිදුක්කටංහොති, (සහප්‍රයොගයෙහයින්) ඇවත දුකුලාවේ.

48 මුඛෙ, (නිධිකුම්භියෙහි) මුවවිට; පාසං පවෙසෙත්වා, පාසය ප්‍රවෙශකොට; ඛාණුකෙ, කණුවෙහි; බද්ධකුම්භියා, බඳනාලදසැලට බන්ධනාන්තංවසා, බන්ධනයන්ගේවශයෙන්; ඨානභෙදෙ, ස්ථාන භෙදය; විජානතා, දත්තනුවිසින්; ඡෙදයෙය්‍යා, දතයුත්තේය.

49 එකස්මිංඛාණුකෙ එක්කණුවෙක්හි;බද්ධකුම්භියාවා,‡ බඳනා ලදසැළුවද; රුක්ඛමූලස්මිං, රුක්මුලෙහි; වලයං, වලයම; පවෙසෙ ත්වාකතායවා, ලංකරනලදකුම්භියටද; ඨානාතිපන, ස්ථානයෝ වනාහි; චෙ (හොනාති) දෙදෙනෙක් වෙත්

50 ඛාණුං, කණුව; උද්ධරන්තස්සවා, උදුරන්නාහටද; සඞ්ඛලිං, හැකිල්ල; (දම) ජිඤ්ඤතොපිවා, සිඳින්නාහටද; චුල්ලවච්ඡං, ධූලිසි වේ; තතො, අනතුරුව; කුම්භිං, සැල; චෙ, ඉදින්; ඨානාචාවෙති, කුඹුතැනින්(සදිසාවෙන් කොසගස්පමණකුදු)පහකෙරේද; චුතො, (එහෙතෙම සස්තෙන්) චුතවූයේ වේ.

---

^ දුක්කටංච අඨවිධංහොති පුබ්බපයොග දුක්කටං.සහපයොගදුක්ක ටං. අනාමාසදුක්කටං. දුරුපචිණ්ණ දුක්කටං. විනයදුක්කටං ඤාත දුක්කටං. පතිස්සවදුක්කටංති-ඉතිටීකා.

---

‡ මෙහිවාශබ්දය. සමුච්චයාර්ථයෙහිවේ. රජතොවාචොරතොවාය නාදියෙහි මෙනි.

51 පඨමං පන කුම්භිං වා උබ්බරිත්වා තථා පුන,
ඨානා චාවෙති ඛාණුං වා සඞ්ඛලිං වා පි සො තයො.
52 ඉතො චිතො ච සංසෙන්තො මූලෙ සාරෙති රක්ඛති,
වලයං ඛෙගතං තත්ථ කරොන්තො'ව පරාජිතො.
53 ජාතං ඡින්දති චෙ රුක්ඛං දුක්කටං කුම්භිමත්ථකෙ,
සමීපෙ ඡින්දතො තස්ස පාචිත්තිය'මනත්‍රජං.
54 අන්තො කුම්භිගතං භණ්ඩං ඵන්දාපෙති සචෙපන,
අපබ්‍යූහති තත්ථෙව තස්ස ථුල්ලච්චයං සියා.
55 හරන්තො කුම්භියා භණ්ඩං මුඛං ඡින්දති අත්තනො,
භාජනෙ වා ගතංකත්වා හොති භික්ඛු පරාජිතො.

---

51 පඨමංපන, පළමුකොටවනාහි; කුම්භිංවා, නිධිකුම්භියහෝ; උබ්බරිත්වා, උදුරා; තථා, එසේ; පුන, නැවත; ඛාණුංවා, කණුවහෝ, සඞ්ඛලිම්පිවා, දමදහෝ; ඨානා, තුබූතැනින්; චාවෙති, පහකෙරේද; සො තයො, (පළමුඉදිරිමෙහි ථුලසිද දෙවනඨානාචාවනයෙහි පාරාජිකාදවීම්සඞ්ඛ්‍යාත) එම ක්‍රමයවේ.

52 වලයං,(කුම්භියෙහිබැඳිදමයඅගෙහිවූ රැක්මූලෙකලූ)වලයම; මූලෙ, මූලෙහි; සංසෙන්තො, සටමින්; ඉතොචිතොච, ඔබ මොබ; සාරෙති, චාරණයකෙරේද; රක්ඛති, (පරිජියෙන්) රැකේ; තත්ථ, ඒ මූලෙහි; ඛෙගතංකරොන්තොව, (සියලුපසින් මූල ඡෙදය නොකොට) අහස්ගතකරන්නේම; පරාජිතො, (තුබූතැනින්පහකලහෙයින්) පරිජි ඇවැත් පැමිණියේවේ.

53 කුම්භිමත්ථකෙ, කුම්භියමත්තෙහි; ජාතං, හටගත්; රුක්ඛං රුකක්; චෙ, ඉදින්; ඡින්දති, කපාද; දුක්කටං, (ඔහට) දුකුළාවේ; සමීපෙ, සමීපයෙහිවූ; අනත්‍රජං, ඒසැළමතුයෙහි නූපන් රුකක්; ඡින්දතො, සිඳින්නාවූ; තස්ස, ඒ මහණහට; පාචිත්තියං, පචිතිවේ.

54 අන්තොකුම්භීගතං, සැළඇතුළතවූ; භණ්ඩං. භාණ්ඩ; සචෙ පන, ඉදින්වනාහි; ඵන්දාපෙති, (සැළෙහිලූතම්බදුනෙහි ලීමට රැස් කිරීම්වශයෙන්) සොලවාද; තත්ථෙව, ඒ සැලතුළම; අපබ්‍යූහති, (යටබඩුපිණිස මත්තෙහි තිබූබඩු) පහකෙරේද; තස්ස, ඒ භික්‍ෂුවට ථුල්ලච්චයංසියා, ථුලසිවන්නේය.

55 කුම්භියා, නිධිකුම්භියෙහි; භණ්ඩංහරන්තො, බඩුඅවහරණ යකරන්නේ; මුඛං, මිට; ඡින්දති, පිරිසිඳිද හෙවත් සැළෙහිබඩුභා ජනෙහි බඩු මිශ්‍රනොවේද;(එසේ පිරිසිඳපාදශීවසතුවක්ගනීද) අත්තනො, තමාගේ; භාජනෙගතංවාකත්වා, භාජනගතහෝකොට (කුම්භිගතභාණ්ඩය ඝාමිශ්‍රනොව) ඡින්දති, (එසේ) පිරිසිඳීද, භික්ඛු, ඒ මහණතෙමේ; පරාජිතොහොති, පරදිනලද්දේවේ.

56 හාරංවා පනපාමඞ්ගං A සුත්තාරූළ්හගත්තු කුම්භියා B,
පක්ඛිපෙති යථාවත්ථුං ඨාතා වාමෙති චෙ චුතො.

57 සප්පිආදිසු යං කිඤ්චි පිවතො C පාදපූරණං,
එකෙනෙව පයොගෙන පීතමත්තෙ පරාජයො.

58 කත්වාව ධුරනික්ඛෙපං පිවන්තස්ස පුනප්පුනං,
සකලංපිව තං කුම්භිං පිවතො නපරාජයො.

---

56 කුම්භියා, සැලෙහිතිබූ; හාරංවා, මුක්තාහාරයක්හෝ; පාමඞ්ගංවාපන, (රන්රිදීමුවා) පාමඞ්ගදාමයක් හෝ වනාහි; සුත්තාරූළ්හගත්තු (රන්රිදීආදි)හුයෙහිඅවුනාකළවැලක්හෝ සූත්‍රමයභාණ්ඩයක්හෝ; පක්ඛිපෙති,(සොරසිතින්) සොලවාද; යථාවත්ථුං, වස්තු ක්‍රමානුරූපවූ චූලසිවේ; චෙ, ඉදින්; ඨාතා, තුබුතැනින්; වාමෙති, (කෙසගක්පමණකුදු) පහකෙරේද; චුතො, (ශාසනයෙන්) චුතවූයේවේ.

57 සප්පිආදිසු, ගිතෙල්ආදි ද්‍රව වස්තු අතුරෙහි; පාදපූරණං, පාදයක් අගනාවූ; යංකිඤ්චි (පියයුතු) යම්කිසිවක්; එකෙනපයොගෙනෙව, (ධුරනික්ෂේපනොකොට එකාබද්ධකොට තෙල්ඇදබොන) එකප්‍රයොගයකින්ම; පිවතො, පානයකරන්නාහට; පීතමත්තෙ, (පාදයක් අගනාපමණ) පානයකළමාත්‍රයෙහි; පරාජයො, (සීලසම්පදයෙන්) පරාජයවේ. *

58 ධුරනික්ඛෙපං, ධුරනික්ෂේපය; කත්වාඑව, කොටම; පුනප්පුනං, නැවත නැවත; පිවන්තස්ස, පානයකරන්නාහට; සකලං අපිච, සියලුවවූද; තංකුම්භිං, ඒ සැල; පිවතො, බොන්නාහට; නපරාජයො † පරිජිතොවන්නේය.

---

A සුත්තංච සුත්තාරූළ්හංච, සුත්තාරූළ්හං එකසෙසො.
B කෙනජලෙන උම්භියති පූරියතීති කුම්භි-උම්භ-පූරණෙ-ආමසී යතීයි-ඊපච්චයො-මසආමසනෙ. කුම්භීනාමපදෙකො-කුම්භිමත්ථකො-තසම්ං.
C පිබතීතිපිවනෙතා. තස්ස (පා: පංතෙ. අත්ත) "පාපිබො,,ති පිබාදෙසො "ඔවිධාතවා,,දිනා. බකාරස්සවො) පරාජයනං. පරාජයො (පරාපුබ්බජි. ජයෙ. ණ.)

---

* විස්තර මුද්‍රිතසම්බන්ධපාසාදිකාවෙහි 168 වෙනි පිටපටන් බලනු.
† ධුරනික්ෂේපනොකොට නැවත නැවත බොන්නාහට පරිජ්වේ.

59 සචෙ ඛිපති යං කිඤ්චි භණ්ඩකං තෙලකුම්භියං,
තං පාදග්ඝනකං තෙලං ධුවං පිවති තාවදෙ.

60 හත්ථතො මුත්තමත්තෙව ථෙය්‍යචිත්තො විනස්සති,
ආවිඤ්ඡිත්වා පිවං කුම්භිං තෙලං ගළෙති චෙ තථා.

61 තෙලසොසාකිරණං X ඤත්වා ඛිත්තං රිත්තාය කුම්භියා,
පිවං තෙලඤ්ච තං භණ්ඩං උද්ධරන්තො'ව ධංසිතො

62 තත්ථෙව භින්දතො තෙලං ඡඩ්ඩෙන්තස්ස තථෙව ච,
ඣාපෙන්තස්ස අභොගං වා කරොන්තස්ස ච දුක්කටං.

භුම්මට්ඨ කථා.

---

59 තෙලකුම්භියං,(අන්සතු) තෙල්සැළෙහි; යංකිඤ්චිභණ්ඩකං, (දුහුල්සලුආදි) යම්කිසි (තෙල්බොන) භාණ්ඩයක්; සචෙ, ඉදින්; ඛිපති,(සොරසිතින්)දමාද; ධුවං, ඒකාන්තයෙන්; තං,ඒ දැමූ භාණ්ඩය; පාදග්ඝනකං, පාදයක්අගනාවූ; තෙලං, තෙල්;පිවති, බොන්නේද; තාවදෙ, එකෙණෙහි; (ඒක්‍ෂණයනම්)

60 හත්ථතො, අතින්; මුත්තමත්තෙඑව,මිදීම්මාත්‍රයක් ඇතිකල්හිම; ථෙය්‍යචිත්තො, සොරසිත්ඇති මහණතෙම, විනස්සති, (පූර්ව ප්‍රයොගහෙයින් තෙල්බොන්ට පළමුවම සීලවිනාශයෙන්) නැසේ; චෙ, ඉදින්; කුම්භිං, සැල; ආවිඤ්ඡිත්වාවා, නමාහෝ; තෙලං,තෙල්; ගළෙති, (සොරසිතින්)වගුරවාද; තථා, එසේ; (වැනසෙනුලැබේ)

61 තෙලසොසාකිරණං, තෙල්වත්කරනබව; ඤත්වා, දැන; රිත්තාය කුම්භියා, හිස්භාජනයෙහි; ඛිත්තං, බහනලද; තෙලං ච පිවං, තෙල්බොන්නාවූ වස්තුවක්වූයේද; තංභණ්ඩං, ඒ භාණ්ඩය; උද්ධරන්තොඑව, උදුරන්නේම; (ඒ සොරසිත්ඇති මහණතෙම) ධංසිතො, (ශාසනසැපතින්) විනාශවනලද්දේවේ.

62 තත්ථෙව, ඒ තුබූතන්හිම; භින්දතොව, (ඨානාචාවනඅභිප්‍රායෙන් නොරව)සැලබිඳින්නාහටද; තථාඑව, එපරිද්දෙන්ම;තංතෙලං, ඒ තෙල; ඡඩ්ඩෙන්තස්සව,(උතුරායනපිණිස වැලිආදිය)දමන්නාහටද; ඣාපෙන්තස්සව, (දරලා) දවන්නාහටද; අභොගංවා, (මලමූත්‍රාදියදමා)පරිභොග නොකළහැකිසේහෝ; කරොන්තස්සව, කරන්නාහටද; දුක්කටං, දුකුලාවේ.

භූම්‍යස්ථ කථාව නිමියාය.

---

X තෙලසොසාකිරණං. මුද්‍රිත.

63 ඨපිතං පසාරිත්වා ච සාටකත්ථරණාදිකං A,
වෙඨෙත්වා උද්ධරන්තස්ස මූලෙන්ත ඨානා පරාභවො.

64 ඔරිමන්තෙන වා පුඤ්ඡමොකාසං පාරිමන්තතො,
පාරාජික මතික්කන්තෙ කඩ්ඪතො උජුකම්පි වා.

ථලට්ඨ කථා.

65 පුරතො මුඛතුණ්ඩං ච කලාපග්ගං ච පච්ඡතො,
වීසු පස්සෙසු පක්ඛන්තා හෙට්ඨා පාදනඛා තථා.

66 උද්ධඤ්චා'පි සිඛග්ග න්ති ගගනෙ ගච්ඡතො පන,
මොරස්ස ඡ පරිච්ඡෙදා වෙදිතබ්බා විභාවිනා.

67 භික්ඛු සස්සාමිකං මොරං ගණ්හිස්සාමී'ති ඛෙ ගතං,
හත්ථං වා පි පසාරෙති පුරතො වා 'ස්ස තිට්ඨති.

---

63 පත්ථරිත්වා, අතුරා; ඨපිතං, තුබුවාවූ; සාටකත්ථරණාදිකංච, *වස්ත්‍රාස්තරණාදියද; වෙඨෙත්වා, (කලාලසේ) හකුළා; උද්ධරන්තස්ස, උදුරන්නාහට; ඨානා, තුබූතැනින්; මූලෙන්ත, මිදුණුකල්හි; පරාභවො, (සස්තෙන්) පිරිහීමවේ.

64 උජුකං, (අතුරනලද වස්ත්‍රාදිය එක්දිශාවකට) සෘජුකොට; කඩ්ඪතොඅපි, අදින්නාහටද; ඔරිමන්තෙනවා. (තමදිග) ඔරිමාන්තයෙන්හෝ; පුඤ්ඡංඔකාසං, සපශීලත් අවකාශය; පාරිමන්තතො, පාරිමාන්තය කරණකොටගෙන; අතික්කන්තෙපිවා, අතික්‍රාන්තකල කල්හිද; පාරාජිකං, පරිජිවේ.

ථලට්ඨකථාව නිමියේය.

65 පුරතො; ඉදිරියෙහි; මුඛතුණ්ඩංච, මුවතුඩද; පච්ඡතො, පස්සෙහි; කලාපග්ගංච, කලාපාග්‍රයද; වීසුපස්සෙසු, දෙපස; පක්ඛන්තාච, පක්ෂපත්‍රාන්තයද; තථා, එසේ; හෙට්ඨා, යට; පාදනඛාච, පාද හා නියද.

66 උද්ධංඅපි, උඩදිග; සිඛග්ගංචඉති, සිළුඅගදැයි; ගගනෙ, අහසෙහි; ගච්ඡතො, යන්නාවූ; මොරස්සපන, මයූරයාගේවනාහි; පරිච්ඡෙදා, (ස්ථානවශයෙන්) පිරිසිඳීම්; ඡ, සදෙනෙක්; විභාවිනා, ප්‍රාඥයාවිසින්; වෙදිතබ්බා, දතයුත්තාහුය.

67 භික්ඛු, (යම්) භික්ෂුවක්; සස්සාමිකං, හිමියෙක්ඇති; ඛෙගතං, අහස්ගතවූ; මොරං, මොණරෙකු; ගණ්හිස්සාමිඉති, (අල්වා)

---

* මෙහි ච ශබ්දය සමුච්චයාර්ථහෙයින් ථලයෙහි රැස්කළ ධාන්‍යාදියෙහි විනිශ්චයද යටකී නිධිකුම්භීයෙහි විනිශ්චයානුසාරයෙන් කටයුතුවේ.

68 මොරො'පි ගගනෙ පක්ඛෙ චාරෙති නච ගච්ඡති,
දුක්කටං ගමනච්ඡෙදෙ ආමසන්තස්ස ඛෙ ගතං.

69 ඨානා මොර මමොචෙන්තො එකූපෙති සචෙ පන,
එවං එකූපනෙ තස්ස ථුල්ලච්චය මුදීරිතං.

70 අගහෙත්වා ගහෙත්වා වා හත්ථෙන පන අත්තනො,
ඨානං චාවෙති චෙ මොරං සයං ඨානා චුතො සියා.

71 ඵුඨො'කාසං මුඛග්ගෙන කලාපග්ගෙන වා පන,
කලාපග්ගෙන වා ඵුඨං මුඛතුණ්ඩෙන භික්ඛු චෙ.

72 අතික්කාමෙය්‍ය යො මොරං ඨානා චාවෙති නාම සො,
එසෙ'වච නයො පාද සිඛා පක්ඛෙසු දීපිතො.

---

ගන්නෙමියයි; හත්ථංවාඅපි, හස්තයද හෝ;පසාරෙති, දිගුකෙරේද; අස්ස, ඒ මයුරයාගේ; පුරතොවා, ඉදිරියෙහි හෝ; තිඨති, සිටි නේද.

68 මොරොඅපි, මයුරයාද; ගගනෙ, අහසෙහි; පක්ඛෙ, පක්ෂපත්‍රයන්;චාරෙති. චාරණයකෙරේද;නචගච්ඡති, නොමයේද;ගමනච්ඡෙදෙ,(මයුරයාගේ)ගමන්වැළැක්වීමෙහිද; ඛෙගතං, අහස්ගතවූ; තං, ඒ මයුරයා; ආමසන්තස්ස, ආමර්ශනයකරන්නාහටද; දුක්කටං, දුකුළා වේ.

69 සචෙපන, ඉදින්වනාහි;ඨානා, (පරිච්ඡින්නවූ)ස්ථාන(ෂට්ක)යෙන්; මොරං, මයුරයා; අමොචෙන්තො, නොමුදන්නේ, එකූපෙති, කම්පාකෙරේද; එවං, මෙසේ; තස්ස, ඔහුගේ; එකූපනෙ, කම්පාකිරීමෙහි; ථුල්ලච්චයං, ථුලසිවේයයි; උදීරිතං, කියනලදී

70 මොරං, මයුරයා; හත්ථෙනපන, හස්තයෙන්වනාහි; අගහෙත්වාවා, අල්වානොගෙන හෝ; ගහෙත්වාවා, අල්වාගෙන හෝ; අත්තනො ඨානා, මයුරයා තමාසිටි (ෂට්විධ) ස්ථානයෙන්; චෙ, ඉදින්; චාවෙති, චුතකෙරේද;(ඒ මහණතෙම)සයං ඨානා, තෙමේ ස්වකීය(ශ්‍රමණභාව)ස්ථානයෙන්; චුතො සියා, චුතවූයේවන්නේය.

71-72 යොපන භික්ඛු, යම් මහණෙක්තෙම් වනාහි; මුඛග්ගෙන, මුඛාග්‍රයෙන්; ඵුඨං, ස්පර්ශිකල; ඔකාසං, අවකාශය; කලාපග්ගෙනවා, කලාපාග්‍රයෙන් හෝ; කලාපග්ගෙන, කලාපාග්‍රයෙන්; ඵුඨං, ස්පර්ශිකල අවකාශය; මුඛතුණ්ඩෙනවා, මුවතුඩින්හෝ; චෙ, ඉදින්; මොරං, මයුරයා; අතික්කාමෙය්‍ය, ඉක්මවන්නේද; සො, ඒමහණ තෙම; ඨානාචාවෙතිනාම, ඨානාචාවනයකෙළේනම්වේ; පාද,(මයුරයාගේ) පාදය; සිඛා, සිළුවද;පක්ඛෙසුච, පක්ෂපත්‍රයන්හිද; එසොනයොඑව, මෙම ක්‍රමයම; දීපිතො, දක්වනලද්දේය.

73 ගගනෙ පන ගච්ඡන්තො කරෙ මොරො නිලීයති,
තං කරෙනෙව චාරෙන්තො ඵන්දාපෙතීති වුච්චති.

74 සචෙ ගණ්හාති තං මොරං ඉතරෙන කරෙන සො,
චාවිතත්තා පන ඨානා භික්ඛු ඨානා චුතො සියා.

75 ඉතරං පන මොරස්ස උපනෙත් සචෙ කරං,
න දොසො තත්‍ථ උඩ්ඩෙත්වා සයමෙව නිලීයති.

76 දිස්වා අඞ්ගෙ නිලීනං තං ථෙය්‍යචිත්තෙන ගච්ඡතො,
පාදෙ ථුල්ලච්චයං හොති දුතියෙ ච පරාජයො.

77 භූමියං ඨිතමොරස්ස තීණිඨානානි පණ්ඩිතො,
පාදනං ච කලාපස්ස වසෙන පරිදීපයෙ.

78 තතො කෙසග්ගමත්ත මපි මොරං පඨාපිතො පන,
හොති පාරාජිකං තස්ස උක්ඛිපන්තස්ස භික්ඛුනො.

මොර කථා.

---

73 ගගනෙ, අහසෙහි; ගච්ඡන්තො, යන්නාවූ; මොරොපන, මයුරයා වනාහි; කරෙ, ප්‍රසාරිතහස්තයෙහි; නිලීයති, ලගීද; තං, ඔහු; කරෙනඑව, හස්තයෙන්ම; චාරෙන්තො, චංරණයකරන්නේ; ඵන්දාපෙතිඉති, කම්පාකෙරේයයි; වුච්චති. කියනුලැබේ.

74 සචෙ, ඉදින්; තං මොරං, ඒ මොණරු; ඉතරෙනකරෙන, අනික්අතින්; ගණ්හාති, ගනීද; ඨානං, ස්ථානයෙන්; චාවිතත්තා, පන, චාවනයකලබැවින්වනාහි; සො, ඒමහණතෙම; භික්ඛුඨානා, ශ්‍රමණභාවයෙන්; චුතොසියා, චුතවූයේවන්නේය.

75 සචෙපන, ඉදින් වනාහි; ඉතරංකරං, අනික් අත; මොරස්ස, මයුරයාහට; උපනෙති, එලවාද; තත්‍ර, ඒ හස්තයෙහි; උඩ්ඩෙත්වා, නැගී; සයංඑව, තෙමේම; නිලීයති, ලගීද; නදොසො, දොෂයක් නැත්තේය.

76 අඞ්ගෙ, ශරීරාවයවයෙක්හි; නිලීනං, ලගිනාලද; තං, ඒ මයුරයා; දිස්වා, දැක; ථෙය්‍යචිත්තෙන, සොරසිතින්; ගච්ඡතො, යන්නාහට; පාදෙ, (පළමු)පියවරෙහි; ථුල්ලච්චයංච, ථුලසිඇවැත්ද; දුතියෙ, දෙවනපියවරෙහි; පරාජයොච, පරිජිද, හොති, වේ.

77 භූමියං,භූමියෙහි;ඨිතමොරස්ස,සිටිමයුරයාහට;පාදනංච,පාදයන්ගේද; කලාපස්සච, (භූමිස්පර්ශවූ) කලාපයාගේද; (යනමොවුන්ගේ)වසෙන, වශයෙන්; ඨානානි, ස්ථානයෝ; තීණි,තුන්දෙනෙක්; පණ්ඩිතො, විනයඥපණ්ඩිතතෙමේ; පරිදීපයෙ, දක්වන්නේය.

78 තතොපඨාපිතො, ඒ පෑදුම්හෙන්; කෙසග්ගමත්තංඅපි, කෙසගක්පමණකුදු; මොරංපන, (පෑදූ)මයුරයාවනාහි; උක්ඛිපන්තස්ස

79 ඡිජ්ජමානං සුවණ්ණාදිං පත්තෙ පතති චෙ පන,
ගහෙත්වා උද්ධරන්තස්ස තස්ස පාරාජිකං සියා.
80 සචෙ අනුද්ධරිත්වා’ව ථෙය්‍යචිත්තෙන ගච්ඡති,
දුතියෙ පදවාරස්මිං පාරාජික මුදීරයෙ.
81 එසෙව ච නයො ඤෙය්‍යො හත්ථෙ වත්ථෙ ච මත්ථකෙ;
තං තං තස්ස භවෙ ඨානං යත්ථ යත්ථ පතිට්ඨිතං.

ආකාසට්ඨකථා.

82 ථෙය්‍ය චිත්තෙන යං කිඤ්චි මඤ්ච පීඨාදි සු ඨිතං,
ආමාසමපි අනාමාසං ආමසන්තස්ස දුක්කටං.
83 සංහරිත්වා සචෙ වංසෙ ඨපිතං හොති චීවරං,
කත්වා පුනොරතො භොගං තථා අන්තං ච පාරතො.

---

ඔසවන්නාවූ, තස්සභික්ඛුනො, ඒ භික්ෂුවහට; පාරාජිකං හොති, පාරාජිකාපත්තිවේ.

මයූරකථාව නිමියාය.

79 චෙ, ඉදින්; ඡිජ්ජමානං, සිඳිණුලබන්නාවූ; සුවණ්ණාදිං, ස්වර්ණාදිය; පත්තෙපන,(පිඩුපිණිසසිටියහුගේ)පාත්‍රයෙහිවනාහි; පතති, වැටේද; ගහෙත්වා, අතින්; උද්ධරන්තස්ස, (ඒරන්) උදුරන්නාවූ; තස්ස, (සොරසිත්ඇති) ඒ භික්ෂුවහට; පාරාජිකං, පරිජිඇවැත්; සියා, වන්නේය.

80 සචෙ, ඉදින්; අනුද්ධරිත්වාඑව, උද්ධරණයනොකොටම; ථෙය්‍යචිත්තෙන, සොරසිතින්; ගච්ඡති,යාද; දුතියෙ පදවාරස්මිං, දෙවැනි පියවරෙහි; පාරාජිකං, පරිජිඇවැත්; උදීරයෙ, කියන්නේය.

81 හත්ථෙච, හස්තයෙහිද; වත්ථෙච, වස්ත්‍රයෙහිද; මත්ථකෙච, මස්තකයෙහිද; (යනතන්හි) එසොනයොඑව, මේ ක්‍රමයම; ඤෙය්‍යො, දතයුත්තේය; යත්ථයත්ථ, යම් යම් ස්ථානයක; පතිට්ඨිතං, පිහිටියේවේද; තස්ස, ඒවස්තුවහට; තං තං, එය එය; ඨානංභවෙ, ස්ථානයවන්නේය.

ආකාශට්ඨ කථාව නිමියාය.

82 මඤ්චපීඨාදිසු, මඤ්චපීඨාදි (කිසියම් ආසන) යෙහි; ඨිතං, තුබුණාවූ; යංකිංචි, යම්කිසි; ආමාසමපි,(අතින් හෝ කයින්) ආමර්ශනයකළයුතු (වස්ත්‍රාදි)වස්තුවක්හෝ; අනාමාසංපි, ආමර්ශනයනො කටයුතු (ස්වර්ණාදි) වස්තුවක්හෝ; ථෙය්‍යචිත්තෙන, සොරසිතින්; ආමසන්තස්ස, (හස්තාදීන්)ආමර්ශනයකරන භික්ෂුවහට: දුක්කටං, දුකුළා * වේ.

83 ඔරතො, තමන්සිටි දිශාභිමුඛයෙහි; භොගංච, තමාතුබූ චීවරයාගේ මධ්‍යස්ථානයද; අන්තඤ්ච, තමාඑක්කරතලද අනුවා

---

* එනැඳපතනඨාන වාචක දෙක්හි දුලසී හා පරිජිද ක්‍රමයෙන්වේ.

84 චීවරෙන ඵුට්ඨොකාසො ඨානං තස්ස පවුච්චති,
තතු චීවරවංසො සො හොතීති සකලො මතො.
85 ඔරිමන්තෙන ඔකාසං ඵුට්ඨං න මිතරෙන වා,
ඉතරෙන පි වා ඵුට්ඨං ඔරිමන්තෙන වා පුන.
86 දක්ඛිණන්තෙන ඵුට්ඨංවා වාමන්තෙනාති තරෙන වා,
වාමන්තෙන ඵුට්ඨානං අතික්කාමයතො චුති.
87 උද්ධංවා උක්ඛිපන්තස්ස චීවරං පන වංසතො,
කෙසග්ගමත්තෙන උක්ඛිත්තෙන තස්ස පාරාජිකං භවෙ.
88 රජ්ජුකෙන ච බන්ධිත්වා ඨපිතං පන චීවරං,
ථුල්ලච්චයං විමොචෙන්තො මුත්තෙන පාරාජිකං ඵුසෙ.

---

තාන්තදෙකද; පාරතො කත්වා පන,චීවරවංසපරභාගයෙහි කොට වනාහි; තථා,එසේ; සංහරිත්වා, තාමා; වංසෙ, (දඬුරැහැන්ආදී) චීවරවංසයෙහි; සචෙ, ඉදින්; චීවරං, සිවුරක්; ඨපිතංහොති, තබන ලද්දේවේද.

84 තස්ස, ඒ චීවරයට; චීවරෙන, සිවුරෙන්; ඵුට්ඨොකාසො, ස්පර්ශකරනලද අවකාශය;ඨානං, ස්ථානයයි;පවුච්චති, කියනුලැබේ; සො සකලො චීවරවංසො,ඒසියලු(රැහැන්ආදි)චීවරවංසය; ඨානං, ස්ථානය; තතුහොතිඉති, තොමවේයයි; මතො, දන්නාලදී.

85 ඔරිමන්තෙන, තමාදෙස (චීවරවංස ස්පර්ශකොට සිටි) චීවරපර්යන්තයෙන්; ඵුට්ඨං, ස්පර්ශකරනලද; තං ඔකාසං, ඒ (චීවරවංස) අවකාශය; ඉතරෙනවා, (භික්ෂුපාර්ශ්වයෙහි චීවරවංස ස්පර්ශවසිටි) සිවුරැ කෙළවරින් හෝ; ඉතරෙන, පාරිමාන්තයෙන්; ඵුට්ඨං, ස්පර්ශකරනලද; තංඔකාසං, ඒඅවකාශය;ඔරිමන්තෙනඅපිවා, තමාදෙස (චීවරවංසස්පර්ශකොටසිටි)චීවරපර්යන්තයෙන්ද හෝ;පුන, නැවත.

86 දක්ඛිණන්තෙන, (චීවරාභිමුඛවූ සොරැගේ) දකුණුපස සිවුරැ කොණින්; ඵුට්ඨං, ස්පර්ශකළ අවකාශය; වාමන්තෙනවා, වම්පස සිවුරැ කොණින් හෝ; වාමන්තෙන, වම්පස සිවුරැ කෙළවරින්; ඵුට්ඨානං, ස්පර්ශකළ ස්ථානය; ඉතරෙනවා. දකුණුපස චීවරාන්තයෙන් හෝ; අතික්කාමයතො, ඉක්මවන්නාවූ භික්ෂුවහට; චුති, (ශාසනයෙන්) චුතියවේ.

87 චීවරංපන, (රැහැණෙහිතුබූ) සිවුරවනාහි; වංසතො, චීවරවංසයෙන්; උද්ධං වා,උඩටහෝ;උක්ඛිපන්තස්ස, නගන්නාවූ; තස්ස, ඒ භික්ෂුවහට;කෙසග්ගමත්තෙන,(චීවරවංසයෙන් උඩට)කෙසගක්පමණකුදු; උක්ඛිත්තෙන, උත්ක්ෂේපකළකල්හි; පාරාජිකං භවෙ; පරිජි ඇවැත් වන්නේය.

88 රජ්ජුකෙන,රැහැණකින්;බන්ධිත්වා,(දෙකෙළ)බැඳ;ඨපිතං,තබනලද;චීවරංපන,සිවුරවනාහි;විමොචෙන්තො, ඉන්මුදන්නේ; ථුල්ල

89 ඔවෙඨෙත්වා ඨපිතං වංසෙ නික්ඛෙපෙන්තස්ස භික්ඛුනො,
වලයං ඡින්දතො වා පි මොචෙන්තස්සා'ප යං නයො.
90 චීවරස්ස පසාරෙත්වා ඨපිතස්ස හි A වංසකෙ,
සංහරිත්වා තු B නික්ඛිත්තෙ චීවරෙ විය නිච්ඡයො.
91 සික්කාය පක්ඛිපිත්වා යං ලග්ගිතං හොති භණ්ඩකං,
සික්කාතො තං හරන්තො වා සහසික්කාය වා චුතො.
92 කුන්තාදිං නාගදන්තෙසු ඨිතෙසු පටිපාටියා,
අග්ගෙ වා පන බුන්දෙ වා ගහෙත්වා පරිකඩ්ඪතො.
93 පාරාජිකං ඵුට්ඨො'කාසම තික්කාමයතො සියා,
උජුකං උක්ඛිපන්තස්ස කොසග්ගෙන පරාජයො.

---

චවයං, ථුලසිඇවැත්; ඵුසෙ, ස්පර්ශකරන්නේය; මුචෙන්ත, (සිවුර අතර තොරඳ ඉන් වැටෙණහෙයින්) මිදිකල්හි; පාරාජිකං; පරිජි ඇවැත්; ඵුසෙ, ස්පර්ශකරන්නේය.

89 වංසෙ, චීවරවංශයෙහි; ඔවෙඨෙත්වා, වෙලා; ඨපිතං, තබනලද චීවරය; නික්ඛෙපෙන්තස්ස, විනිවේෂ්ඨනයකරන්නාවූ; භික්ඛුනොඅපි, භික්ෂුවහටද; වලයං, (සිවුරැ රැඳැණෙහි) වලයම; ඡින්දතොවඅපි, සිඳින්නා(වූ භික්ෂුව)හටද; මොචෙන්තස්සඅපි, (එය)මුදන්නාවූ මහණහටද, අයංනයො, මේ ක්‍රමයම (හෙවත් බන්නම්දීමෙහිද වලයම සිඳිම හා මිදීමෙහිද ථුලසිහා මිදුණුසිඳුණුකල්හි පරිජිද)වේ.

90 වංසකෙ, චීවරවංශයෙහි; පසාරෙත්වා, දිගහැර; ඨපිතස්සතු, තබනලද වනාහි; චීවරස්ස, චීවරයාගේ; නිච්ඡයො, විනිශ්චයතෙම; සංහරිත්වා, හකුළා, නික්ඛිත්තෙ, නික්ෂිප්තවූ; චීවරෙ විය හි, සිවුරෙහි මෙන්; (වෙදිතබ්බො) දතයුතු.

91 සික්කාය, සාල්ලෙක්හි; පක්ඛිපිත්වා, බහා; යං භණ්ඩකං, යම් කිසි භාණ්ඩයක්; ලග්ගිතංහොති, එල්වනලද්දේවේද; සික්කාතො, සහල්ලෙන්; (මවනස්කොට) තං, ඒ භාණ්ඩය; හරන්තොවා, හරනේ හෝ; සහසික්කායවා, සහල්ල හාසමග හරනේ හෝ; චුතො, (සස්නෙන්) චුතවේ.

92 පටිපාටියාඨිතෙසු, (භිත්තියෙහි)පිළිවෙළින්භිත්තිස්පර්ශකොට තුබූ; නාගදන්තෙසු, (මුවඅංආදී) නාගදන්තයන්හි; (තබනලද) කුන්තාදිං, කුන්තහෙණ්ඩිවාලාදිය, අග්ගෙවා, අගහෝ; බුන්දෙවා, මුලහෝ; ගහෙත්වා, ගෙන; පරිකඩ්ඪතොපන, අදින්නාහට වනාහි.

93 ඵුට්ඨො'කාසං, (නාගදන්තයෙහි) ස්පර්ශකළ අවකාසය; අතික්කාමයතො, ඉක්මවන්නාවූ මහණහට; පාරාජිකං, පරිජිඇවැත්; සියා, වන්නේය; උජුකං, සෘජුකොට; උක්ඛිපන්තස්ස, (කුන්තාදිය)

---

A වෙසසකෙ හි සදෙ, B පසිබ්බියං තු සදෙ.

94 පාකාරා'භිමුඛො ඨත්වා ආකඩ්ඪති සචෙ පන,
ඔරිමන්ත ද්ධො'කාස මි A තරන්තච්චයෙ චුතො.

95 තථෙව පරතො තස්ස පෙල්ලෙන්තස්සා'පි භික්ඛුනො
භිත්තිං පන ච නිස්සාය ඨපිතෙ'පි අයං නයො.

96 චාලෙන්තස්ස ච තාලස්ස ඵලං වත්ථුං හි පූරති
යෙනස්ස බන්ධනා මුත්තෙ තස්මිං පාරාජිකං භවෙ.

97 පිණ්ඩිං ඡින්දති තාලස්ස සචෙ පාරාජිකං සියා
එසෙවච නයො සෙස රුක්ඛ පුප්ඵ ඵලෙසු පි

වෙහාසට්ඨකථා.

---

උඩටගන්නාහට; කෙසග්ගෙන, කෙසගක්පමණ වෙන්කිරිමෙන්; පරාජයො, පරිජිවේ.

94 සචෙපන, ඉදින් වනාහි; පාකාරාභිමුඛො, පවුරඅභිමුඛව, ඨත්වා, සිට; ආකඩ්ඪති(මැදින් ගෙන)අදින්ද; ඔරිමන්තද්ධොකාසං; තමදිසාවෙහි කුඤ්ඤදණ්ඩෙන් සපශීලද අවකාශය; ඉතරන්ත වචයෙ පාරිමාන්තයෙන් කතීවාතික්‍රමණයකළකල්හි; චුතො, (සස්නෙන්) චුතවනලදී.

95 තථාඑව, එපරිද්දෙන්ම; පරතො, පරභාගයෙහිකොට; පෙල්ලෙන්තස්ස, පෙලන්නාවූ; තස්සභික්ඛුනොඅපි. ඒභික්ෂුවහටද;(කෙසගක්පමණ ඉක්මවීමෙන්පරිජිවේ)භිත්තිංචපන, භිත්තියදවනාහි; නිස්සාය, නිශ්‍රයකොට; ඨපිතෙඅපි. තබනලද කුන්නාදියෙහිද; අයංනයො. මේ ක්‍රමයම; (කෙසගක්පමණඉක්මවිමෙහි පරිජි)වේ

96 තාලස්සඵලං. තාලඵලය; චාලෙන්තස්සච, සොලවන්නාවූද; අස්ස, ඒ මහණහට; යෙන. යම් ඵලයකින්; වත්ථුංහි, පාරාජිකා වස්තුව වනාහි; පූරති. පිරේද; තස්මිං, ඒ ඵලය; බන්ධනා. නටුයෙන්; මුත්තෙ. මිදුණුකල්හි; පාරාජිකං. පරිජිඇවැත්; භවෙ, වන්නේය.

97 සචෙ. ඉදින්; තාලස්සපිණ්ඩිං. (පාරාජික වස්තුපූරණයට සමර්ථ) තාලඵලකණිණිකාව;(තල්පොකුර)ඡින්දති. සිඳීද;පාරාජිකං. ඔහට පරිජිඇවැත්;සියා. වන්නේය;සෙස රුක්ඛ පුප්ඵ ඵලෙසු අපි. සෙසු රුක් මල් ගෙඩිවලද; එසො. එවවනයො; මේක්‍රමයමවේයයි (වෙදිතබ්බො) දතයුත්තේය.

වෙහාසට්ඨ කථාව නිමියාය.

---

A ඉතරන්තන්ත කෙතො අච්චයො-ඉතරන්තච්චයො-මජ්ඣපදලොප සමාසො-ටීකා

98 ගච්ඡතො හි නිධිඨානං පදවාරෙන දුක්කටං
උදකෙ පන ගම්භීරෙ තථා නිමුජ්ජනාදිසු.

99 තත්ථ ජාතක පුප්ඵෙසු යෙන පුප්ඵෙන පූරති
වත්ථුං තං ඡින්දතො පුප්ඵං තස්ස පාරාජිකං වදෙ.

100 එකනාළස්ස වා පණ්ණස්ස වාකො උප්පලජාතියා
නඡිජ්ජති තතො යාව තාව නංපරිරක්ඛති.

101 සාමිකෙහෙ A ච පුප්ඵෙසු ඡින්දිත්වා ඨපිතෙසු පි
පුබ්බෙ B වුත්තනයෙනෙව වෙදිතබ්බො විනිච්ඡයො.

---

98 උදකෙ, (අගම්භීර) ජලයෙහි; නිධිඨානං, නිධානස්ථානයට; ගච්ඡතො, යන්නාහට; පදවාරෙනහි, පියවරගණිතින් (හා ගැඹුරු දියෙහි හස්තවාරගණිතින්ද) වනාහි; දුක්කටං, (ප්‍රයොගභෙදයෙහෙයින්) දුකුලාවේ; ගම්භීරෙපන, ගැඹුරුජලයෙහිවනාහි; නිමුජ්ජනාදිසු, ගිලීමෙහිද ඉල්පීමෙහිද; තථා, එසේ; (හස්තවාරපදවාරගණිතින් ප්‍රයොගයක්පාසාදුකුලාවේ *)

99 තත්ථ, ඒදියෙහි; ජාතකපුප්ඵෙසු, හටගත්පුෂ්පයන්අතුරෙන්; යෙනපුප්ඵෙන, යම්පුෂ්පයකින්; වත්ථුං, පාරාජිකාවස්තුව; පූරති, සම්පූර්ණවේද; තංපුප්ඵං, ඒපුෂ්පය; ඡින්දතො; සිඳියාහු; තස්ස, ඒභික්ෂුවහට; පාරාජිකං, පාරාජිකාපත්තිය; වදෙ, කියන්නේය-

100 උප්පලජාතියා, උත්පලජාතියෙහි; නාළස්ස, නළයපිළිබඳ; එකපණ්ණස්සවා, එක්පණ්සකහෝ; වාකො, සූත්‍රයක්; තතො, ඒනළයෙන්; යාව, යම්තාක්; නඡිජ්ජති, නොසිඳේද; තාව, එතාක්; නං, ඒපුද්ගලයා; පරිරක්ඛති, (පාරාජිකාපත්තියෙන්) රක්‍ෂාකෙරේ-

101 සාමිකෙහි එව, හිමියන්විසින්ම; ඡින්දිත්වා, සිඳ; ඨපිතෙසු, තබනලද, පුප්ඵෙසුඅපි, (අබඩ) පුෂ්පයන්හිද; පුබ්බෙ, පෙර; වුත්තනයෙනඑව, කියනලදක්‍රමයෙන්ම; විනිච්ඡයො, විනිශ්චය; වෙදිතබ්බො, දතයුතුවේ-(පාරාජිකාවස්තුපූරණයට සම්පිමල් ගත්කල්ද පරිජිවේ.)

---

A සංධනං එතස්සඅත්ථීති-සාමී-සාමියෙව සාමිකො ලෙ.හි (සකත්ථෙකො.) B වදීති ඤාති වුත්තො (වද වචනෙ ත) නයතීති-නයො (නීතනයෙ අ.) වුත්තො ච සො නයො චාති වුත්තනයො-තෙන:

* මෙහිසහපුණ්‍යානාදිණෙහි ඇවැත්නිධිකුම්භියෙහි කීක්‍රමයෙන් දතයුතු.

102 හාරබද්ධානි C පුප්ඵානි ජයව්හාකාරසු සොභවී
ආකාසරෙත සබ්බ තානි ඨානා වාසෙන්ති හසන්ති.

103 ඨපිතං පන පුප්ඵානං කලාපං ජලපිඤ්ජරං
වාතෙලිත්වා උදකං පුප්ඵඨානා වාසෙන්ති වෙ චුතො

104 පරිකප්පෙති ගච්ඡන්තා ගන්ධසාමීති රක්ඛති
උද්ධරන්තා ගතං ඨානා භට්ඨො D නාම පබ්බජති.

105 අව්හාගතස්ස තංඨානං ජලතො සකලං ජලං
උප්පාටෙත්වා තතො පුප්ඵ ඉජ්ජු මුද්ධරතො පන.

---

102 හාරබද්ධානි, හාරකොට බඳනාලද; තානිපුප්ඵානි, ඒමල්; ජයව්හාකාරෙසු, (සෙළවිමාදි සදිසාවන් අතුරෙහි ශිල්පීමිආදි) සසා කාරාඅතුරෙහි; සොභනීආකාරෙන, හිසියම්ආකාරයකින්; සචෙ, ඉදින්; ඨානාවාසෙන්ති, තුබුතැනින්චුතකෙරේද; හසන්ති, (ගුණම්රණයෙන්) කියනුලැබේ-

103 ජලපිඤ්ජරං, දියබිඳුපිරි; ඨපිතං, තබනලද; පුප්ඵානංකලාපන, (සාදුකිඋත්පලාදි) පුෂ්පකලාපය වනාහි; උදකං, ජලය; වාලෙත්වා, (රළනගනසේ) සොලවා; පුප්ඵඨානා, මල්තුබුනැතින්; වෙ, ඉදින්; වාසෙන්ති, (සෙසගඳපමණ) තොරකෙරේද; චුතො, (බණුසස්සනන්) චුතවූයේවේ-

104 එත, මෙහි; වෙ, ඉදින්; (ගතං, පැමිණිපුෂ්පකලාපය;) ගන්ධසාමීති, ගන්ධෙහිමැයි; පරිකප්පෙති, (තැන්පිරිසිඳ) පරිකල්පනාකෙරේද; රක්ඛති, (බනු) රකීද; ගතං, පරිකල්පිතස්ථාන ගත පුෂ්පකලාපය; උද්ධරන්තා, තුබුතැනින්උදුරන්නේ; ඨානාභට්ඨො නාම, (ප්‍රාතිමොක්ෂසංවරශීලසඞ්ඛාත) ස්ථානයෙන්භ්‍රෂ්ටනමැයි; පබ්බජති, කියනුලැබේ-

105 ජලතො, ජලයෙන්; අව්හාගතස්ස, උස්වනැංගාවූ පුෂ්පසව; තංසකලංජලං, ඒසියලුජලය; ඨානං, ස්ථානයවේ; පුප්ඵං, පුෂ්පාග්‍රය; උප්පාටෙත්වා, උපුටා; (ඇද)තතො, (ස්ථානයවූ)ඒසියලුජලයෙන්; උජුං, ඍජුව; උද්ධරතොපන, උපුටන්නාහට වනාහි-

---

C හාරංකත්වා බද්ධානි හාරබද්ධානි මජ්ඣපදලොපො පුප්ඵන්ති විකසන්තීති-පුප්ඵානි (පුප්ඵ විකසනෙ අ.) තිට්ඨන්ති එත්ථාති-ඨානං-(ඨාගතිනිවුත්තියංයු) පංම්හා.

D අභස්සීති-භට්ඨො (භස අධොපතනෙත.)

106 නාළෙනෙව ජලෙනෙව මුත්තමත්තෙන පාරාජිකං භවෙ
අමුත්තෙන ජලෙනා තස්මිං ථුල්ලච්චයමුදීරිතං.

107 පුප්ඵෙ ගහෙත්වා නාමෙත්වා උප්පාටෙති සචෙ පන
න තස්ස උදකං ඨානං නට්ඨො උප්පාටිතක්ඛණෙ.

108 යොපි සසාමිකෙ මච්ඡෙ පොසාපීළෙත්වාන ගණ්හති
බලිසෙන පි ජාලෙන ගහෙත්වා කුමීනෙන වා.

109 තස්සෙවං ගණ්හතො වත්ථුං යෙන මච්ඡෙන පූරති
තස්මිං උද්ධටමත්තස්මිං ජලා හොති පරාජයො.

110 ඨානං සලිලජානං හි කෙවලං සකලං ජලං
සලිලට්ඨං විමොචෙන්තො ජලා පාරාජිකො භවෙ.

111 නීරතො A උප්පතිත්වායො තීරෙ පතති වාරිජො
ගණ්හතො තං පනාපත්තිං භණ්ඩෙය්‍යෙන විනිද්දිසෙ.

---

106 තස්මිං නාළෙනෙව, ඒ; (උත්පාටිතපුෂ්ප) නළ මුල්හෙනා ණ; ජලෙනා, දියෙන්; මුත්තමත්තෙන, මිදුණුකෙණෙහි; පාරාජිකං භවෙ, පරිජිකාපත්තියෙයි; ජලෙනා, දියෙන්; අමුත්තෙන, නොමිදුණුකල, ථුල්ලච්චයං, ථුල්සි (වෙයි) උදීරිතං, කීයතලදී-

107 සචෙපන, ඉදින්වනාහි; පුප්ඵෙ, පුෂ්පයන්; ගහෙත්වා, ගෙන; නාමෙත්වා, නමා; උප්පාටෙති, උපුටාද; තස්ස, ඒපුෂ්පයට; උදකං, ජලය; නඨානං, ස්ථානයනොවේ; උප්පාටිතක්ඛණෙ, උපුලකෙණෙහි; නට්ඨො, (සස්නෙහ්) නටුයේවේ-

108 යොපි, යමෙක්වනාහි; සසාමිකෙ, සස්වාමිකවූ; මච්ඡෙ; (නොමළ) මත්ස්‍යයන්; පොසාපීළෙත්වාන, පොසාරසිතීන්; බලිසෙනඅපි බිලියෙන්ද; ජාලෙනවා, දැලින්හෝ; ගහෙත්වා, අතින්හෝ; කුමිනෙනවා, කෙමිනන්හෝ; ගණ්හාති, ගනීද-

109 එවං, මෙසේ, ගණ්හතො, (සස්වාමිකමත්ස්‍යයන්)ගන්නාවූ; තස්ස, ඒභික්ෂුහට, යෙනමච්ඡෙන, යම්මත්ස්‍යකුගෙන්; වත්ථුං(පාරාජිකාවස්තුවූ) පාදය; පූරති, පිරේද; ජලා, ජලයෙන්; තස්මිං උද්ධටමත්තස්මිං,ඒමත්ස්‍යයා ඉදුරූ මාත්‍රයෙහි; පරාජයොහොති, පරිජිවේ.

110 සලිලජානං, මත්ස්‍යයන්ට; කෙවලං * සකලංජලං,සියලුම ජලය; ඨානංහි, ස්ථානසවේදැයි; සලිලට්ඨං, ජලයෙහිසිටිමත්ස්‍යයා; ජලා,දියෙන්; විමොචෙන්තො, මුදාහරින්නේ; පාරාජිකොභවෙ, පැරදුණේවේ-

111 යොවාරිජො, යම්මත්ස්‍යයෙක්; (නීරතො, ජලයෙන්; උප්පතිත්වා, උඩපැන; තීරෙ, ඉවුරෙහි; පතති, වැටේද; තං, එමසු;

---

A නීරතො ජරා කාමෙ පෙතනානී-නීරො-(නී නසෙ-ඊර) තතො වංරීමිනිජාතො * මෙහි කෙවලශබ්දය අවධාරණාර්ථසි-වාරිජො (ජනී ජාතුභාවෙක්ති)

112 ආරඤ්ඤාය මච්ඡානං තළාකෙ නදියාපි වා
නින්නෙ මච්ඡවිසං නාම පක්ඛිපිත්වා ගතෙ පන.

113 පච්ඡා මච්ඡවිසං මච්ඡා ඛාදිත්වාන පලවන්තිචෙ
පාරාජිකං මතෙ මච්ඡෙ ථෙය්‍යචිත්තෙන ගණ්හතො.

114 පංසුකූලික සඤ්ඤාය B න දොසො කොචි ගණ්හතො
සාමිකෙසු ‘හරන්තෙසු භණ්ඩදෙය්‍ය C මුදීරිතං.

115 ගහෙත්වා සාමිකා මච්ඡෙ සචෙ යන්ති නිරාලයා
ගණ්හතොපන තෙසං සෙසෙ ථෙය්‍යචිත්තෙන දුක්කටං.

---

ගණ්හතො, ගන්නා (භික්ෂුව) හට; ආපත්තිංපන, ඇවැත්වනාහි; භණ්ඩග්ඝෙන, භාණ්ඩග්ඝවශයෙන්; (දුකුලාඩුලසිආදිය) විනිශ්චය, කියන්නේය-

112 මච්ඡානං, මසුන්; ආරඤ්ඤාය, මැරීමපිණිස; තළාකෙවා, විලකහෝ; නදියාපිවා, ගඟකහෝ; නින්නෙවා, වළකහෝ; මච්ඡ විසං නාම, මත්ස්‍යවිෂනම්වූ ද්‍රව්‍යයක්; පක්ඛිපිත්වා, බහා; ගතෙපන, ගියකල්හිවනාහි-

113 මච්ඡා, මත්ස්‍යයෝ; චෙ, ඉදින්; මච්ඡවිසං, ඒමත්ස්‍යවිෂය; ඛාදිත්වාන, කා; පච්ඡා, පසුව; පලවන්ති, ඉපිලෙද්ද; මතෙමච්ඡෙ ඒමළමසුන්; ථෙය්‍යචිත්තෙන, සොරසිතින්; ගණ්හතො, ගන්නාහට; පාරාජිකං, පාරාජිකාවේ-

114 පංසුකූලිකසඤ්ඤාය, පාංශුකූලසංඥාවෙන්; ගණ්හතො, ගන්නහුට; නකොචිදොසො, කිසිදොසෙක් නැත්තේය; සාමිකෙසු (විෂයොදාගිය)මස්හිමීයන්; ආහරන්තෙසු, ගෙන්විතකල්හි; භණ්ඩදෙය්‍යං, ගත්වස්තුවහෝ එපමණඅගනායමක්හෝ දියයුතුයයි; උදීරිතං, කියනලදී-

115 සාමිකා, මත්ස්‍යස්වාමීයෝ; මච්ඡෙ, මළමසුන්; ගහෙත්වා, ගෙන; නිරාලයා, නිරාලයවූවාහු; යන්ති, යෙත්ද; සෙසෙ, ශෙෂවූ; තෙ, ඒමත්ස්‍යයන්; ථෙය්‍යචිත්තෙන, සොරසිතින්; ගණ්හතොපන, ගන්නහුටවනාහි; දුක්කටං, දුකුළාඇමැත්වේ-

---

B පංසුවිය කුච්ඡිතභාවං උලති ගච්ඡතීති-පංසුකූලං-පංසුකූලමිති සඤ්ඤා, පංසුකූලසඤ්ඤා-න්‍යාය.

C භණ්ඩං ච තං දෙය්‍යං චාති භණ්ඩදෙය්‍යං-

116 අමතෙසු අනාපත්තිං වදන්ති විනයඤ්ඤුනො
එසෙව නයො සෙසෙ කාචජපාදිම්හි දීපයෙ

—— උදකට්ඨකථා ——

117 නාවං නාවට්ඨං වා භණ්ඩං ථෙනෙත්වා ගණ්හිස්සාමීති
පාදුද්ධාරෙ දෙසා වුත්තා භික්ඛුනො සවං ගච්ඡතස්ස.

118 බද්ධාය නාවායහි චණ්ඩසොතෙ ඨානංමතං බන්ධනමෙතමෙව
භික්ඛුස්ස තස්මිං පනමුත්තමත්තෙ පාරාජිකං තස්සවදන්ති ධීරා

119 නිච්චලෙ උදකෙ නාවමබන්ධන මචලිතං
පුරතො පච්ඡතොවාපි පස්සතොවාපි කඩ්ඪතො.

---

116 අමතෙසු,† නොමළමිනුන් කෙරෙහි; අනාපත්තිං,(අදත්තා දානයෙන්) ‡ ඇවැත්නැතැයි; විනයඤ්ඤුනො, විනයදන්නාහු; වදන්ති, කියත්; සෙසෙ, සෙස්සු; (නොමිළාවූ) කාචජපාදිම්හි, කැපුර්ආදිවූ; චාරිත්‍රඵව, මින්සනයෙන්ගෙනෙයිද; එසොඑවනයො, මෙමක්‍රමයම්; (දක්වන්නේය)-

—— උදකට්ඨ භාණ්ඩ නිමිත්තය ——

117 නාවංවා, නැවක (ආදිජලතරණිකා) වක්හෝ; නාවට්ඨංභණ්ඩංවා,(ඉඤ්ඤියඅනිඤ්ඤියප්‍රතිබද්ධ) නාවෙහිසිටිභාණ්ඩයක්හෝ; ථෙනෙත්වා, සොරකම්කොට; ගණ්හිස්සාමිඉති, ගන්නෙමියයි; එවං, මෙසේ(සිතා) ගච්ඡතස්ස, යන්නාවූ; භික්ඛුස්ස, භික්ෂුවහට; පාදුද්ධාරෙ, (ස්ථානයෙන්ගෙනයෑම) පාඉදිරිමෙහි; දෙසා, * දුෂ්කෘතාපත්තීහු; වුත්තා, කියනලද්දාහ-

118 චණ්ඩසොතෙ, වෙගවත්දියපහරෙහි; බද්ධාය, බඳනාලද; නාවායහි, නැවටවනාහි; බන්ධනංඑව, බන්ධනයම; ඨානං, එක්ස්ථානයකැයි; මතං, දන්නාලදී; තස්මිංපන, ඒබන්ධනයවනාහි; මුත්තමත්තෙ, මිදුනකෙණෙහි; තස්සභික්ඛුස්ස, ඒභික්ෂුවට; පාරාජිකං, පාරාජිකාපත්තිය; ධීරා, විනයඥයෝ; වදන්ති, කියත්-

119 නිච්චලෙ, නිශ්චලවූ; උදකෙ, ජලයෙහි; අබන්ධනං, බන්ධනරහිතව; අචලිතං, නිශ්චලවසිටි; නාවං, නැව; පුරතොවාඅපි, ඉදිරියෙන්දහෝ; පච්ඡතොවාඅපි, පස්සෙන්දහෝ; පස්සතොවා, පසකින්හෝ; කඩ්ඪතො, අදින්නාහට; පරිජිචෙ-

---

† නිමිත්තාර්ථයෙහි සප්තමීයයි. ‡ මරණින්වන පචිත්තියවිමය-
* මේගාථාවෙන් පූර්වප්‍රයොග සහප්‍රයොගයෙහි දුකුළාඇවැත්ද සෙල්වීමෙහි ථුලසීඇවැත්ද තුබූතැනින් තොරකිරීමෙහි පරිජිද වනබැව්දක්වනලද්දැයි උපලක්ෂණවශයෙන් සලකත්

120 එකෙන’ඤ්ඤෙන සම්ඵුට්ඨං ඔකාසං ඉතරෙන තං
අතික්කාමයතො නාවං තස්ස පාරාජිකං සියා.

121 උද්ධං කෙසග්ගමත්තම්පි උදකම්හා විමොචයෙ
අධො නාවාතලං නෙත්වා ඵුට්ඨං ච මුඛවට්ටියා.

122 බන්ධිත්වා පන යා තීරෙ ඨපිතා නිච්චලෙ ජලෙ
බන්ධනං ච සීසතො කායතො ඨානං තස්සා ඡධා මතං.

123 හොති ථුල්ලච්චයං පුබ්බං බන්ධනස්ස විමොචනෙ
පච්ඡා තෙනඋපායෙන ඨානා චාවෙති චෙ චුතො.

124 චාවෙත්වා පඨමං ඨානා පච්ඡා බන්ධනමොචනෙ
එසෙවච නයො වුත්තො ථෙය්‍යචිත්තස්ස භික්ඛුනො.

---

120 තංනාවං, ඒ නැව; එකෙන අඤ්ඤෙනවා, එක් අනෙකකින්; සම්ඵුට්ඨං, ස්පර්ශකරනලද; ඔකාසං, අවකාශය; ඉතරෙන, අනික් අවකාශය හතුරුකොටගෙන; අතික්කාමයතො, ඉක්මවන්නාවූ; තස්ස, ඒ භික්ෂුවහට; පාරාජිකං, පරිජිතවේ-(මේ සිවුපස ඇදීමෙන් පරිජිතවීමයි)

121 අධොනාවාතලං, නැව්තලෙහි යට; උද්ධං, උඩට; කෙසග්ගමත්තංඅපි, කෙසගක් පමණකුදු; උදකම්හා, ජලයෙන්; විමොචයෙ, මිදුකල්හි; නෙත්වා; ඒ යට නැව්තලයෙන්; ඵුට්ඨංච, ස්පර්ශකරනලද ජලයද; මුඛවට්ටියා, මුවවිටින්; විමොචයෙ,(කෙසගක් පමණකුදු) මිදුකල්හි; පාරාජිකාවේ-

122 යාපන, යම් නෞකාවක්වනාහි; තීරෙ, ඉවුරෙහි; බන්ධිත්වා, බැඳ; නිච්චලෙ, නිශ්චලවූ; ජලෙ, ජලයෙහි; ඨපිතා, තබනලද්ද; තස්සා, ඒ නෞකාවට; බන්ධනංච, බන්ධනයද; සීසතො කායතොච, තුඹුඅව කායශරීරයන; ඡධා, සදපරිද්දකින්; ඨානං, ස්ථානය; මතං, දන්නාලදී.

123 පුබ්බං, පළමුකොට; බන්ධනස්ස, බන්ධනයාගේ; විමොචනෙ, මිදීමෙහි; ථුල්ලච්චයංහොති, ථුලසිවේ; පච්ඡා, පසුව; තෙනඋපායෙන, කිසිඋපායකින්; චෙ, ඉදින්; ඨානාචාවෙති, තුඹුතැනින් තොරකෙරේද; චුතො, (ඒමහණසස්නෙන්) චුතවූයේවේ-

124 පඨමං, පළමුකොට; ඨානා, තුඹුතැනින්; චාවෙත්වා, තොරකොට; පච්ඡා, පසුව; බන්ධනමොචනෙච, බන්ධනයෙන්මිදීමෙහිද; ථෙය්‍යචිත්තස්ස, සොරසිත්ඇති; භික්ඛුනො, භික්ෂුවහට; එසො එවනයො, මේ (ඨානාචාවනයයි; ථුල්ලච්චබන්ධනමොචනයෙහි පරිද්දේදීයයන) ක්‍රමයම; වුත්තො, කියනලදී-

125 උස්සාරෙත්වා නිකුජ්ජිත්වා ඨපිතාය ථලෙ පන
ඵුට්ඨොකාසොව හි ඨානං නාවාය මුඛවට්ටියා.

126 ඤෙය්‍යා ඨානපරිච්ඡෙදෙ ආකාරෙහෙව පඤ්චහි
ගන්තුකාමොපි චාවෙන්තො හොති පාරාජිකො නරො.

127 එසෙව නයො ඤෙය්‍යො නාවායුක්කුජ්ජිතාය පි
ඨපිතාය පි නාවාය ඝටිකානං ච උපරි.

128 ථෙය්‍යා තිත්ථෙ ඨිතං නාවං ආරුහිත්වා සචෙ පන
අරිත්තෙන ඵියෙනාපි පාජෙන්තස්ස පරාජයො.

129 සචෙ ඡත්තං පණාමෙත්වා උස්සාපෙත්වාව චීවරං
ලඞ්කාරසදිසං කත්වා ගණ්හාපෙති සමීරණං.

---

125 උස්සාරෙත්වා, ජලයෙන් ගොඩනගා; නිකුජ්ජිත්වා, අධොමුඛකොට; ථලෙ, ගොඩබිමෙහි; ඨපිතාය, තබනලද; නාවාය පන, නෞකාවගේවනාහි; මුඛවට්ටියා, මුවවිටින්; ඵුට්ඨොකාසොඑවහි, ස්පර්ශකළ අවකාශයම වනාහි; ඨානං, ස්ථානයවේ-

126 ඨානපරිච්ඡෙදෙ, (ඒ නෞකාවගේ) ස්ථානපරිසිඳීම; පඤ්චහි ආකාරෙහිඑව; (පූර්වාදිසිදුවූගත උඩදීනදයන) පස්ආකාරයෙන්ම; ඤෙය්‍යා, දතයුතුවේ-ගන්තුකාමොපි, යම්කිසිදිශාවක් අභිමුඛකොට; චාවෙන්තො, පහකරන්නාවූ; නරො, භික්ෂුතෙම; පාරාජිකොහොති, පාරාජිකාවූයේවේ-

127 උක්කුජ්ජිතාය, උඩුකුරුව තබනලද; නාවාය අපි, නෞකාවටද; එසො එව නයො, මෙම ක්‍රමයම; ඤෙය්‍යො, දතයුත්තේය-ඝටිකානං, දැරුඛණ්ඩයන්ගේ; උපරිමත්තෙහි, ඨපිතාය, තබනලද; නාවාය අපි, නෞකාවටද; තථා. එසේ; * (දතයුත්තේය)

128 තිත්ථෙ, තීර්ථයෙහි; ඨිතං, තුබුණාවූ; නාවං, නැව; ථෙය්‍යා, සොරසිතින්; ආරුහිත්වා, නැඟී; සචෙපන, ඉදින්වනාහී; අරිත්තෙන, රිටකින්හෝ; ඵියෙනඅපි, පලුපතකින්හෝ; (ඒනැව) පාජෙන්තස්ස, පදවන්නාහටද; පරාජයො, පරාජිකවේ-

129 සචෙ, ඉදින්; ඡත්තං, ඡත්‍රය; පණාමෙත්වාවා, (වාතගහණාකාරයෙන්) පණමනය කොටහෝ; චීවරං, චීවරය; ලඞ්කාරසදිසං කත්වා, රුවලසමානකොට; උස්සාපෙත්වාවා, ඔසවාහෝ; සමීරණං, සුළඟ, ගණ්හාපෙති, ගන්වාද-

---

* මේ විනිශ්චය උඩුකුරුව තිබතුබූ නැවගැන යෙදේ නවීකා මතු තුබුනැවගැන නාගදොනාසෙහිතුබූ ඝටානාදීන්ගේ නිවිනිශ්චය දතයුතුවේ-

130 ආගම්ම බලවාවාතො නාවං හරති චෙපන
වාතෙනෙව හටානාවා නදොසො තස්ස විජ්ජති.

131 සයමෙවච යංකිඤ්චි ගාමතිත්ථ මුපාගතං
අචාලෙන්තනාව * තං ඨානා කිණිත්වා චෙ පලායති.

132 අවහාරො නභික්ඛුස්ස භණ්ඩදෙය්‍යං මුදීරිතං
සයමෙවච ගච්ඡන්තිං ඨානා චාවෙති චෙ චුතො.

~ නාවට්ඨකථා ~

133 යානං ‡ නාමරථො වය්හං සකටං සන්දමානිකා
යානං අවහරිස්සාමි යානට්ඨම්පි වාපන.

---

130 චෙපන, ඉදින්වනාහි; බලවාවාතො, බලවත්වාතය; ආගම්ම, අවුත්; නාවං, නැව; හරති, ගෙනයේද; වාතෙනෙව, වාතයෙන්ම; නාවා, නෞකාවතොමේ; හටා, හරනලද්දීය; තස්ස, ඕහට; දොසො, දොෂයෙක් නවිජ්ජති, (සුළංනැතිකලකළ ප්‍රයොගයෙහි සිත්) නැත්තේය (සුළං හමනකලමෙසේ කළහොත් ඇවැත්මය)

131 යංකිඤ්චිගාමතිත්ථං, යම්කිසිග්‍රාමනාතීර්ථයකට; සයං එව, තෙමේම; උපාගතං, එළඹියාවූ; තං, ඒනැව; ඨානා, (භූමියෙන්හෝ විවරයෙන් ගත්සුළඟින්හෝ ග්‍රාමනාතීර්ථයෙහි) සිටි තැනින්; අචාලෙන්තනාව, චලනයනොකරමින්ම; කිණිත්වා, විකිණ; චෙ, ඉදින්; පලායති, පැනයේද–

132 භික්ඛුස්ස, (ඒ) භික්ෂුවට; නඅවහාරො, අවහාරයෙක්නැත්තේය; භණ්ඩදෙය්‍යං, භාණ්ඩදෙය්‍යයයි; උදීරිතං, කියනලදී; සයංඑවච, (භූමියෙන්හෝ විවරයෙන් ගත්සුළඟින්) තමාවිසින්මද; ගච්ඡන්තිං, යන්නාවූ; (නැව)චෙ, ඉදින්; ඨානාචාවෙති, ඨානාචාවනයකෙරේද; චුතො, (ඒභික්ෂුතෙමසස්නෙන්) චුතවූයේවේ–

— නාවාස්ථකථාව නිමියාය —

133 යානංනාම, යානාවනම්; රථො, රථය; වය්හං, මත්තෙහි මණ්ඩලසමානව ලෑහැලිවසාකළරථය; සකටං, ගැළය; සන්දමානිකා දෙපාර්ශ්වයෙහි සවණීමයාදිගොහැස්වයාද, ගරුඩපක්ෂාකාරයෙන් කළරථය; යනමානුවෙති. යානංවාපන, යානාවක්හෝ; යානට්ඨංවා, යානස්ථවස්තුවක්හෝ; අවහරිස්සාමීයයි, අවහරණයකරන්නෙමියයි

---

‡ ගන්තිචෙතනාකියානං (ගාථාපජ්ජා) රථින්ති ලපෘදීඝකීථ– රථො– (රථඋපාදනෙත ථ) වහතිවුයහති ආවහති චනකානි–වය්හං–වහපාපුණනෙ ණ්‍ය– සකටකානිහාරංවසිතුනති සකටො–සක සන්නිවෙසීඅටො– * අචාලෙන්තොති පීපාඨො.

134 ගච්ඡතො දුක්කටං වුත්තං දුතියං පරියෙසතො
ඨානා චාවන යොගස්මිං විජ්ජමානෙ පරාජයො.

135 යානස්ස දුකයුත්තස්ස දසඨානානි දීපයෙ
යානං පාජයතො තස්ස නිසීදිත්වා ධුරෙ පන

136 ථුල්ලච්චයං තු ගොණානං පාදුද්ධාරෙ විනිද්දිසෙ
චක්කානංපි ඨිතොකාස මතික්කන්තෙ පරාජයො

137 අයුත්තකස්සා'පි ච යානකස්ස ධුරෙතූපත්ථම්භනියා ඨිතස්ස
වසෙනුපත්ථම්භනි චක්කකානං ඨානානි තීණෙව භවන්ති තස්ස

138 තථා ධුරෙන දූරූහං උපරි ඨපිතස්ස ච
භූමියං පි ධුරෙනෙව තථෙව ඨපිතස්ස ච

---

134 ගච්ඡතො, යන්නාහට; දුතියං, දෙවන පුද්ගලයකු; පරියෙසතො, සොයන්නහුට; දුක්කටං, දුක්කටාපත්තිය; වුත්තං, කියනලදී; ඨානා චාවනයොගස්මිං, ස්ථානචාවනප්‍රයොගයක්; විජ්ජමානෙ, විද්‍යමානකල්හි; පරාජයො, පරිජීවේ-

135 දුකයුත්තස්ස, ගොයුගයෙදනලද; යානස්ස, යානාවට; දසඨානානි, (චක්‍රයුග්මය හා ගොන්දෙදෙනාගේ පාඅටදයන) ස්ථාන දශකයක්; දීපයෙ, දක්වන්නේය; ධුරෙ පන, ගැල්හිසෙහි වනාහි; නිසීදිත්වා, හිඳ; යානං, ගැල්ආදියානාව; පාජයතො, පදනාවූ; තස්ස, ඒමහණහට-

136 ගොණානං, ගවයන්ගේ; පාදුද්ධාරෙ, පාඉදිරීමෙහි; ථුල්ලච්චයංතු, ථුලසිඅැවැත් වනාහි; විනිද්දිසෙ, කියන්නේය; චක්කානංපි, චක්‍රයන්ගේ; ඨිතොකාසං, සිටිඅවකාශය; අතික්කන්තෙ, ඉක්මවීමෙහි, පරාජයො, පිරිහීමවේ-

137 ධුරෙන, ධුරයුක්තස්ථානයසමීපයෙන්; උපත්ථම්භනියා, උපස්ථම්භනිය ත්තෙහි; ඨිතස්ස, සිටියාවූ; අයුත්තකස්ස අපි, ගොන් නොයෙදූවාවූද; තස්සයානකස්ස ච, ඒයානාවටද; උපත්ථම්භනීචක්කකානං වසෙන, උපස්ථම්භනියහා චක්‍රයුග්මයාගේවශයෙන්; ඨානානි, ස්ථානයෝ; තීණි එව, තිදෙනෙක්ම; භවන්ති, වෙත්-

138 දූරූහංඋපරි, දූරුබණ්ඩයන්ගේමතුයෙහි; තථා, එසේම; ධුරෙන, ගැල්හිසින්; ඨපිතස්ස ච, තබනලද යානාවටද; (ස්ථානතුනෙක්වෙති) භූමියම්පි, බිමද; ධුරෙනඑව, ගැල්හිසින්ම; තථා එව, එපරිද්දෙන්ම; ඨපිතස්ස ච, තබනලදයානාවටද; (ධුරයුභාවචක්‍රයුග්මයාගේවශයෙන් ස්ථානතුනෙක්වෙති)

139 පුරතො පච්ඡතො වා පි ඨානා චාවෙති චෙ පන
ථුල්ලච්චයං තු තිණ්ණං පි ඨානා චාවෙ පරාජිකා.

140 අපනෙත්වාන චක්කානි අක්ඛානං සීසකෙහි තු
ඨිතස්ස පරි ධුරූනං ඨානානි ඡ විනිද්දිසෙ.

141 කඩ්ඪන්තො උක්ඛිපන්තො වා ඵුට්ඨො'කාසච්චයෙ චුතො
ඨපිතස්ස පන අඤ්ඤස්ස භූමියං යස්ස කස්සචි.

142 අක්ඛුද්ධීනං ධුරස්සා ති පඤ්ච ඨානානි දීපයෙ
උද්ධිසු වා ගමෙන්තො තං ඨානා චාවෙති චෙ චුතො.

143 ඨපිතස්ස හි චක්කස්ස නාභියා පන භූමියං
එකමස්ස සියා ඨානං පරිච්ඡෙදෙ පි පඤ්චධා.

---

139 චෙපන, ඉදින්වනාහි; පුරතොවා, ඉදිරියෙන්හෝ; පච්ඡතොවාපි, පසුපසින්දහෝ (ඇද) ඨානාතු, ස්ථානයෙන්වනාහි; චාවෙති (සාවශෙෂ)චාවනයකෙරේද; ථුල්ලච්චයං (ඕහට) ථුලසිවේ; ඨානාචාවෙ. (නිරවශෙෂවශයෙන්)ස්ථානච්‍යවනයෙහි; තිණ්ණංඅපි, ඒතිදෙනාටම; පරාජිකා, පරිජිදුවේ-

140 චක්කානි, රථචක්‍රයන්; අපනෙත්වාන, පහකොට; ධුරූනංඋපරි, ධුවමත්තෙහි; අක්ඛානං, † අක්ෂයාගේ; සීසකෙහිතු, ශීර්ෂයන් (හෙවත්) දෙකෙළින් වනාහි; ඨිතස්ස, සිටියානාවට; ඡ ඨානානි, ස්ථාන සයක්; විනිද්දිසෙ, කීයත්තේය-

141 කඩ්ඪන්තොවා, (අක්ෂශීර්ෂාධාරද්‍රව්‍යන්ගිහටා)අදින්නේහෝ; උක්ඛිපන්තොවා,(තුබූතැනින්)උඩටනගන්නේහෝ; ඵුට්ඨොකාසච්චයෙ, ස්පර්ශකළඅවකාශය ඉක්මවීමවූ කල්හි; චුතො, (සස්නෙන්) චුතවනලදී; භූමියං, බිමෙහි; ඨපිතස්ස, තබනලද; අඤ්ඤස්ස, අන්‍යවූ; යස්ස කස්සචි පන, යම්කිසි යානාවකටවනාහි-

142 අක්ඛුද්ධීනං, චතුර්විධ අක්ෂවුර්ධීන්ගේද; ධුරස්සඉති, රථශීර්ෂයාගේදයි(යනමොවුන්ගේවශයෙන්)පඤ්චඨානානි,ස්ථානපසක්; දීපයෙ,දක්වන්නේය; චෙ, ඉදින්; උද්ධිසුවා, වුර්ධින්හෝ; ගමෙන්තො, ගෙන; තං,ඒයානාව; ඨානා, තුබූතැනින්; චාවෙති,තොරකෙරේද; චුතො, (ඔහු සස්නෙනන්) චුතවනලදී-

143 භූමියංපන, බිමවනාහි; නාභියා, නාභිමුඛයෙන්; ඨපිතස්ස, තබනලද්දවූ; අස්සචක්කස්ස, ඒචක්‍රයට; ඨානංහි, ස්ථානය වනාහි; එකංසියා. එකක්වන්නේය; පරිච්ඡෙදෙඅපි,පරිච්ඡෙදයෙද; පඤ්චධා, (නැබසිවිදිග හා උඩදිගදයි) පස්වැදෑරුම්වේ-

---

† ජාත්‍යාපෙක්ෂාවෙන් එකාර්ථයෙහි බහුවචනයි.

* චශබ්දයෙන් "අයුත්තං" යනාදීන් අටුවාවෙහි දක්වනලද විනිශ්චයසමුච්චයවේ.

144 ඵුසිත්වා යං ඨිතං භූමිං නෙමිපස්සෙන නාභියා
ඨානානි ද්වෙ භවන්තස්ස තදො තෙස මතික්කමෙ.

145 දිස්වා යාන මනාරක්ඛං පටිපන්නං මහාපථං
ආරුහිත්වා අචොදෙත්වා කිණිත්වා යාති වට්ටති.

### යානකථා

146 සීසක්ඛන්ධ කටොලම්බ වසා භාරා චතුබ්බිධා
තත්ථ සීසගතං භාරං ආමසන්තස්ස දුක්කටං.

147 ඉතො චිතො ච සංසෙන්තො පොථාවීතෙන්ත යො පන
සිරස්මිං යෙව සාරෙති තස්ස ථුල්ලච්චයං සියා.

148 ඛන්ධං ඔරොපිතෙ භාරෙ තස්ස පාරාජිකං මතං
සීසතො කෙසමත්තම්පි මොචෙන්තොපි පරාජිතො.

---

144 නෙමිපස්සෙන, නෙමිපාර්ශ්වයෙන්ද; නාභියා, නාභියෙන්ද; භූමිං, භූමිය; ඵුසිත්වා, ස්පර්ශකොට; යං, යම්රථචක්‍රයක්; ඨිතං, සිටියේද; අස්ස, ඒරථයට; ද්වෙඨානානි, (නෙමිනාභිස්පර්ශිලත්) ස්ථානයෝදෙදෙනෙක්; භවන්ති, වෙත්; තෙසං, ඒස්ථානයන්ගේ; අතික්කමෙ,අතික්‍රමයෙහි; තදො, තවුයේවි-

145 මහාපථං, මහාමාර්ගයට; පටිපන්නං, පිළිපන්නාවූ; අනාරක්ඛං, ආරක්ෂාරහිතවූ; යානං, ගැල්ආදි යම්කිසි යානාවක්; දිස්වා, දැක; ආරුහිත්වා, (එහි) නැඟී; අචොදෙත්වා, (ස්වකීයප්‍රයොගයෙන්) ගවයන්නොයවා; කිණිත්වා යාති, (ඔවුන්මගනගියරථය) විකිණීයේද; වට්ටති, වටනේය-

### යානස්ථකථාව නිමියාය

146 සීස ක්ඛන්ධ කටි ඔලම්බ වසා, ශීර්ෂ ස්කන්ධ කටි අවලම්බන යන්ගේ; (නොහොත්) ශීර්ෂභාරය, ස්කන්ධභාරය, කටිභාරය, අවලම්බනභාරය, යනමොවුන්ගේවශයෙන්; භාරා, භාරයෝතොම; චතුබ්බිධො, සිවුවැදෑරුම්වේ; තත්ථ, ඒභාරයන්අතුරෙහි; සීසගතංභාරං, ශීර්ෂගතභාරය; ආමසන්තස්ස, (හස්තයෙන්) ආමර්ශනයකරන්නාහට; දුක්කටං, දුකුළාවේ-

147 යොපන, යම්භික්ෂුවක් වනාහි; සිරස්මිංඑව, හිසෙහිම; ඉතොචිතොච, (උඩටනොනගා) ඔබ්මොබ; සංසෙන්තො, ඝර්ෂණය කරමින්; පොථාවිතෙන්ත,සොරසිමින්; සාරෙති, චාරණයකෙරේද; තස්ස, ඕහට; ථුල්ලච්චයංසියා, ථුලසිඇවැත්වේ-

148 භාරෙ, භාරයන්; ඛන්ධං, ස්කන්ධයට; ඔරොපිතෙ, බැස්වූ කල්හි; තස්ස, ඒභික්ෂුවට; පාරාජිකං, පරිජිවේයයි; මතං, දන්නා

149 භාරං පථවියං කිඤ්චි ඨපෙත්වා සුද්ධමානසො
පච්ඡා තං ථෙය්‍යචිත්තෙන උද්ධරන්තො පරාජිතො.

150 එත්ථ වුත්තනයෙනෙව සෙසෙසුපි අසෙසතො
භාරෙසු මතිසාරෙන වෙදිතබ්බො විනිච්ඡයො.

භාරට්ඨ කථා

151 දුක්කටං මුනිනා වුත්තං ආරාමං අභියුඤ්ජතො
පරාජෙති පරං ධම්මං චරන්තො චෙ පරාජිතො.

152 විමතිං ජනයන්තස්ස තස්ස ථුල්ලච්චයං සියා
පරජ්ජති සයං ධම්මං චරන්තො යොපි තස්ස ච.

---

ලදී; සීසතො, හිසමතුයෙන්; කෙසග්ගමත්තංඅපි, කෙසගස්පමණකුදු; මොචෙන්තොඅපි, මුදන්නේද; පරාජිතො, (කෙලෙසුන් විසින්) පරදවනලදී-

149 කිඤ්චිභාරං, කිසියම් බරක්; සුද්ධමානසො, (පාතරාසාදී හෙතුවකින් සොරසිත්නැතිව) පිරිසිදුසිතින්; පථවියං, පෘථිවියෙහි; ඨපෙත්වා, තබා; පච්ඡා, පසුව; තං, ඒභාරය; ථෙය්‍යචිත්තෙන, සොරසිතින්; උද්ධරන්තො, උදුරන්නේ; පරාජිතො, පරදිනලද්දේවේ-

150 එත්ථ, මේ ශීර්ෂභාර ඔලම්බකභාර දෙක්හි; වුත්තනයෙන එව, කීක්‍රමයෙන්ම; සෙසෙසුභාරෙසුඅපි, ශෙෂවූස්කන්ධභාර කටිභාරදෙක්හිද; අසෙසතො, අනවශෙෂවශයෙන්; මතිසාරෙන, විනයඥයාවිසින්; විනිච්ඡයො, ආපත්තිවිනිශ්චය; වෙදිතබ්බො, දතයුත්තේය-

භාරට්ඨ කථාව නිමියේය

151 ආරාමං, (පුෂ්පාදි) ආරාමය; අභියුඤ්ජතො, (පරායත්තබැව්දනද තමසතුයයි යුක්තිකියා අයත්කිරීමට සහයබැව්පිණිස සොරසිතින්දෙවනපුද්ගලයෙකු සෙවීමාදිවශයෙන්)චොදනාකරන්නාහට; දුක්කටං, දුකුළාවේයයි; මුනිනා, මුනිඳුවිසින්; වුත්තං, වදාරනලදී- චෙ, ඉදින්; ධම්මංචරන්තො, යුක්තියෙහි හැසිරෙන්නේ; පරං, අන්‍යයා (කෙවත්) ආරාමස්වාමියා; පරාජෙති, පරදවාද; පරාජිතො, (ඔහුසස්නෙන්) පරදිනලදී-

152 විමතිං ජනයන්තස්ස, (අරම්හිමියාට ලැබීම් නොලැබීම් දෙක්හි) සැකඋපදවන්නාවූ; තස්ස, ඒසොරභික්‍ෂුවටද; යො, යම්භික්‍ෂුවක්; ධම්මං චරන්තොඅපි, යුක්තියෙහිහැසිරෙන්නේද; සයං පරජ්ජති, තමන්පැරදීනිද; තස්සච, ඔහටද; ථුල්ලච්චයං, ථුල්ලඅවැත්; සියා, වන්නේය-

153 සාමිනො ධුරනික්ඛෙපෙ න දස්සාමීති චින්තනො
පාරාජිකං භවෙ තස්ස සබ්බෙසං කූටසක්ඛිනං.

ආරාමචොර කථා

154 විහාරං සඞ්ඝිකං කිඤ්චි අච්ඡින්දිත්වාන ගණ්හිතුං
සබ්බෙසං ධුරනික්ඛෙපා භාවතො 'ව න සිජ්ඣති.

විහාරචොර කථා

155 සීසානි සාලිආදීනං නිරුම්භිත්වාන † ගණ්හතො
අසිතෙන ච ලායිත්වා ඡින්දිත්වා වා කරෙන ච

156 යස්මිං බීජෙ පි වා වත්ථුං සීසෙ පූරති මුට්ඨියං
බන්ධනා මොචිතෙ තස්මිං තස්ස පාරාජිකං භවෙ.

---

153 සාමිනො, ආරාමස්වාමියාගේ; ධුරනික්ඛෙපෙ, (භයාදිහෙතුවෙන් මේ ආරාමින් කම් නැතැයි) ධුරනික්ෂෙපය ඇතිකල්හි; න දස්සාමීති, නොදෙන්නෙමියි; චින්තනො, සිතන්නාගේ; ධුරනික්ඛෙපෙ ච; ධුරනික්ෂෙපය ඇතිකල්හිද; තස්ස, ඒ භික්ෂුවට; පාරාජිකං භවෙ, පරිජිවන්නේය; සබ්බෙසං, සියලු; කූටසක්ඛීනං ච, (අස්වාමිකභාවය දැනත් සොරහුට අයිතිකිරීමපිණිස) කූටසාක්ෂිකීභික්ෂූන්ටද; පාරාජිකං භවෙ, පරිජිවන්නේය-

— විහාරස්ථ කථාව නිමියාය —

154 සඞ්ඝිකං, සඞ්ඝසන්තක වූ; කිඤ්චි විහාරං, කිසියම් (කුඩා හෝ) වෙහෙරක්; (ආවාසයක්) හෝ; අච්ඡින්දිත්වාන ගණ්හිතුං, අසිඳ ගන්නට; සබ්බෙසං, (සිවුදික්හි) සියලු සඞ්ඝයාගේ; ධුරනික්ඛෙපාභාවතො එව, ධුරනික්ෂෙපය සම්භව නොවනහෙයින්ම; න සිජ්ඣති * පරිජිසිද්ධ නොවේ-

— විහාරස්ථ කථාව නිමියාය —

155 සාලිආදීනං, ශාල්‍යාදීන්ගේ; සීසානි, කිරිමාන් (හෙවත්) කරල්; නිරුම්භිත්වාන, නිරුම්භනයකොට (හෙවත්) සූරා; ගණ්හතො ච, (සොරසිතින්) ගන්නාහටද; අසිතෙන ච, දෑකැත්තෙන්ද; ලායිත්වා, කපාගෙනහෝ; කරෙන, අතින්; ඡින්දිත්වා වා, සිඳහෝ; ගණ්හතො ච, ගන්නාහටද-

156 යස්මිං බීජෙ පි වා, යම්කිසි ධාන්‍යවෙකෙක්හිදහෝ, සීසෙ වා, කරලෙක්හිහෝ; මුට්ඨියං වා, මිටෙක්හිහෝ; වත්ථුං, පාරාජිකාවස්තුව; පූරති, පිරේද; තස්මිං, ඒබීජාදිය; බන්ධනා මොචිතෙ, බන්ධනස්ථානයෙන් මිදුකල්හි; තස්ස, ඔහට; පාරාජිකං භවෙ, පාරාජිකාපත්ති වන්නීය-

---

† නිරුම්පීළිත්වාන: * පුද්ගලිකවූද ගණසන්තකවූද ආරාමයක් අසිඳගැන්මෙහි ආරාමස්ථානයෙහි කී ක්‍රමය දතයුතු-

157 අවජ්ඣන්තො පන දණ්ඩො වා තණ්ටො වා අප්පමත්තකො
විතිනාළම්පි වා දීඝං අනික්ඛමන්තො ච රක්ඛති.

158 සචෙ සො පරිකප්පෙති මද්දිත්වා පන'දං අහං
පප්පොටෙත්වා ඉතො සාරං ගණ්හිස්සාමීති රක්ඛති.

159 මද්දනුද්ධරණෙ නත්ථි දොසො පප්පොටනෙ පි වා
අත්තනො භාජනගතං කරොන්තස්ස පරාජයො.

160 ජානං කෙසග්ගමත්තම්පි පළවිං පරසන්තකං
ථෙය්‍යචිත්තෙන චෙ බීජං සංකාමෙති පරාජයො.

161 තං ච ඛො සාමිකානන්තු ධුරනික්ඛෙපනෙ සති
අනග්ඝා භූමි නාමෙ සා තස්මා එව මුදීරිතං.

---

157 දණ්ඩොවා, (වස්තුපූරක)මිදණ්ඩහෝ; තටොවා, ඒමිදණ්ඩ සම්බන්ධවූසිවියහෝ; අප්පමත්තකො, ස්වල්පමාත්‍රයක්; අවජ්ඣන්තො, නොසිඳුනේද; විතිනාළම්පිවා, විතළසිවිආදියදහෝ; දීඝං, දිර්ඝවේද; අනික්ඛමන්තොඑව, (ඒනළින්මිදණ්ඩ)නොනික්මුණේම; රක්ඛති, (දුක්කටාදිආපත්තීන්ගෙන්) රක්ෂාවේ–

158 සො, හෙතෙම; අහං, මම; ඉදංමද්දිත්වාපන, මේ වීකරල් මැඩවනාහි; පප්පොටෙත්වා, බොල්ආදියපොළාහැර; ඉතො, මෙයින් සාරංගණ්හිස්සාමිඉති, සාරබීජකොටස ගන්නෙමියයි; සචෙ,ඉදින්; පරිකප්පෙති, පරිකල්පනාකෙරේද; රක්ඛති, ඇවැතින්රැකේ–

159 මද්දනෙපි, කරල්මැඩීමෙහිද; උද්ධරණෙපි, ඉදිරීමෙහි; (හෙවත්) පිදුරුපහකිරීමෙහිද; පප්පොටනෙපිවා, බොල්පොළාබුපෙළීමෙහිද; දොසො, (සඝපයෝදුකුලාවිනා)දොසයෙක්; නත්ථි,නැත්තේය; අත්තනො, තමාගේ; භාජනගතංකරොන්තස්ස, පාදකීයක් භාජනගත කරන්නාහට; පරාජයො, පරිජිවේ–

160 පළවිං, (අන්සතු) පෑපිවිය, පරසන්තකං, අන්සතුයයි; ජානං, දන්නේ; කෙසග්ගමත්තංඅපි, කෙසගක්පමණකුදු; ථෙය්‍යචිත්තෙන, සොරසිතින්; බීජං, (ශෛලාදි) බීජය (හෙවත්) ඉම්සල කුණු; චෙ, ඉදින්; සංකාමෙති, (අන්සතුබිම්නමා අයත්කරනු පිණිස) සඞ්ක්‍රමණයකරවාද; පරාජයො, [ඔහට] පරිජිවේ–

161 තඤ්චඛො, හෙදවනාහි, සාමිකානං,බිම්හිමියන්ගේ; ධුරනික්ඛෙපනෙතුසති, ධුරනික්ෂෙපය(හානාමාගේ ධුරනික්ෂෙපය) ඇති කල්හිවේ; එසාභූමිනාම්,මේපෑපිවිගනම්; අනග්ඝා, අනර්ඝවන්නීය; තස්මා, එසේහෙයින්; එවං, මෙසේ; උදීරිතං, කියනලදී–

162 ගහෙතබ්බා සචෙ හොති වීහි බීලෙගී යා පන
ආදෙ ථුල්ලච්චයං තෙසු දුතියෙව පරාජයො.

163 ඤාපෙතුකාමො යො භික්ඛු මමෙදං සන්තකන්ති ච
රජ්ජුං වාපි පසාරෙති යට්ඨිං පාතෙති දුක්කටං.

164 යෙහි වීහි පයොගෙහි අත්තනො සන්තකං සියා
ආදෙ ථුල්ලච්චයං තෙසු දුතියෙව පරාජයො.

**ඛෙත්තට්ඨකථා**

165 ඛෙත්තෙ වුත්තනයෙනෙව වත්ථුට්ඨස්ස විනිච්ඡයො
ගාමට්ඨෙ පිච වත්තබ්බමපුබ්බං නත්ථි කිඤ්චිපි.

**වත්ථුට්ඨ ගාමට්ඨ කථා**

---

**162** යාපන, යම්පෘථිවියක්වනාහී, වීහිබීලෙගී, බීලවයකින්; සචෙ, ඉදින්; ගහෙතබ්බාහොති, ගතයුත්තීවීද; ආදෙ, ප්‍රථමබීල සංක්‍රමණයකරවීමෙහි; ථුල්ලච්චයංහොති, ථුලසිවේ; දුතියෙව, දෙවෙනි බීලසංක්‍රමණය කරවීමෙහිම; පරාජයො, පරදිනලද්දේවේ–

163 යොභික්ඛු, යම්භික්ෂුවක්; ඉදං මේපෘථිවිය; මමසන්තකං ඉතිච, (අත්සතුබවදනද)මායතුයයිද; ඤාපෙතුකාමො, අඟවනු කැමැත්තේ; රජ්ජුංවාඅපි, රැහැණක්හෝ; පසාරෙති, (සොරසිතින්) ප්‍රසාරණයකෙරේද; යට්ඨිංවා, යටක්හෝපාතෙති හෙලාද; දුක්කටං, (ඔහට) දුකුළාවේ–

164 යෙහි වීහි පයොගෙහි, යම්ප්‍රයොගදෙකකින්; අත්තනො සන්තකංසියා, තමාසතුවේද; තෙසු, ඒප්‍රයොගයන්අතුරෙන්; ආදෙ, ප්‍රථමප්‍රයොගයෙහි; ථුල්ලච්චයං, ථුලසිවේ; දුතියෙඑව, දෙවන ප්‍රයොගයෙහිම; පරාජයො, පරිජීවේ–

**ක්ෂෙත්‍රස්ථ කථාව නිමියාය**

165 වත්ථුට්ඨස්ස, * (පුෂ්පාරාමාදිය කරවීමටසකස්කළ බිම්ආදී වස්තුව හා එහිභූමිස්ථාදිවශයෙන් සිවුතන්හි සිටිභාණ්ඩයන්ගේද වශයෙන්සිටි) වස්තුවස්තුස්ථයන්ගේ; විනිච්ඡයො,විනිශ්චය තෙම; ඛෙත්තෙ ක්ෂෙත්‍රස්ථ කථාවෙහි; වුත්තනයෙන එව, කියනලද්ක්‍රම යෙන්ම; (දතයුතු) ගාමට්ඨෙපිච, (ගාම) ග්‍රාමස්ථයෙහිද; වත්තබ්බං, කියයුතු; අපුබ්බං,පෙර (ප්‍රකාශ) නොවූ; කිඤ්චිපිනත්ථි, කිසිත් නැත්තේය–

**වස්තු වස්තුස්ථ ග්‍රාම ග්‍රාමස්ථ කථාව නිමියාය**

---

* වත්ථු ච වත්ථුට්ඨං ච වත්ථුවත්ථුට්ඨං යී කියයුතුතන්හි එකශෙෂ සමාසක්‍රමයෙන් වත්ථුට්ඨං යිකාපීතයි. නාමිය-සන්නෙදමෙසේයි.

166 තිණං වා පන පණ්ණං වා ලතං වා කට්ඨමෙව වා
භණ්ඩග්ඝෙනෙව කාතබ්බො ගණ්හන්තො තත්ථ ජාතකං

167 මහග්ඝෙ පන රුක්ඛස්මිං ඡින්නමත්තෙ විනස්සති
තච්ඡෙත්වා ඨපිතො රුක්ඛො ගහෙතබ්බො න කොචිපි

168 ඡින්දිත්වා ඨපිතං මූලෙ රුක්ඛමබ්භගතං පන
ඡඩ්ඩිතො සාමිකෙහීති ගණ්හිතුං පන වට්ටති.

169 ලක්ඛණෙ ඡල්ලියො නට්ඨෙ න දොසො කොචි ගණ්හතො
අඩ්ඪාවුත්ථං කතං වාපි විනස්සන්තං ච ගණ්හතො.

170 යො චාරක්ඛට්ඨානං පත්වා ඤත්වා කම්මට්ඨානාදීනි
චින්තෙන්තො විජානන්තො වා අසුද්ධං භණ්ඩං දෙය්‍යං ගොතෙව්සා.

---

166 තත්ථපන, ඒ (මිනිසුන්අයත්සාරක්ෂිත) වනයෙහිවනාහි; ජාතකං, හටගත්; තිණංවා(කැපුවාවූද කැපියයුතුවූද) ගෘහච්ඡාදනාහී තෘණයෙහෝ; පණ්ණංවා, තල්ආදිඑබඳුපත්‍රයෙහෝ; ලතංවා, වේවැල් ඈ වැලක්හෝ; කට්ඨමෙවවා, කාෂ්ඨමයෙහෝ; ගණ්හන්තො, (සොරසිතින්) ගන්නාවූ භික්ෂුතෙම; භණ්ඩග්ඝෙනඑව, භාණ්ඩාර්ඝ වශයෙන්ම; කාතබ්බො, කටයුත්තේවේ-

167 මහග්ඝෙ, අතිරේකපඤ්චමාසකයක්අගනාවූ; රුක්ඛස්මිංපන, වෘක්ෂයක්වනාහි; ඡින්නමත්තෙ, (සොරසිතින්) සිඳීමාත්‍රයෙක්හි; (ඔහු) නස්සති, (ගුණමරණින්)නැසේ; තච්ඡෙත්වාඨපිතො, සැසනූබුවාවූ; කොචි පි රුක්ඛො, කිසියම්රුකක්; නගහෙතබ්බො, නොගතයුත්තේය-

168 මූලෙඡින්දිත්වා, මුල්සිඳ; ඨපිතං, තබනලද; අබ්භගතං, කල්ගියාවූ; රුක්ඛංපන, වෘක්ෂයක්වනාහි; සාමිකෙහි, ස්වාමියන්විසින්; ඡඩ්ඩිතොඉති, හරනලදැයි; ගණ්හිතුංපන, ගන්ටවනාහි; වට්ටති, වටනේය-

169 ලක්ඛණෙ,(අයිතියදක්වීමටරුක්කඳසිදකළ)සලකුණ; ඡල්ලියොනට්ඨෙ, (පසුවහටගත්) සිවිආදියෙන්වැසීගියකල්හි; ගණ්හතො, ගන්නාහට; නකොචිදොසො, කිසිදොසෙක්නැත්තේය; කතංවාඅපි, [යමෙක්ගෙයක්තනානුපිණිස වනහිමියන්ට මිලදීගස්ගෙනකැපූ දැවයෙන් ගෙයක්] කරනලද්දක්වේද; අඩ්ඪාවුත්ථංවාඅපි, එහිවසනලද්දක්වේද; විනස්සන්තංච, (ගෘහකරණයෙන් ශෙෂවවෙනදීන්දිරා) විනාශවනදූවද ගණ්හතො, ගන්නාහට භාණ්ඩදෙය්‍යවිනා දොසෙක් නැත්තේය-

170 යො, යම්භික්ෂුවක්;(වනහිමියන්ට දියයුතුමිල වන වදීමින් නාදී නික්මෙනකල දෙන්නෙමැයි චිනවැදගස් ගෙන්වාගෙන

171 වරාහබ්‍යග්ඝච්ඡතරච්ඡකාදිතො උපද්දවා මුඤ්චිතුකාමතාය යො සො
තත්ථෙව තං ඨානමතික්කමෙති චෙ න කොචි දොසො පන
භණ්ඩ දෙය්‍යකං.

172 ඉද මාරක්ඛත්ථානං ගරුකං සුඞ්කඝාතතො,
තස්මා දුක්කට මුද්දිට්ඨං න මනොක්කම්ම ගච්ඡතො.

173 එතං පරිහරන්තස්ස ථෙය්‍යචිත්තෙන සත්ථුනා,
පාරාජිකං පනුද්දිට්ඨ මාකාසෙනා'පි ගච්ඡතො.

174 තස්මා එත්ථ විසෙසෙන සතිසම්පන්නචෙතසා,
අප්පමත්තෙන හොතබ්බං පියසීලෙන භික්ඛුනා.

**අරක්ඛට්ඨාන කථා.**

---

නික්මෙන්නේ) ආරක්ඛට්ඨානං, ආරක්ෂා ස්ථානයට; පත්වා, පැමිණ; කම්මට්ඨානාදීනි, කර්මස්ථානාදිය; චින්තෙන්තො වා, සිත්හිතොට හෝ; අඤ්ඤං, අන්කිසිවක්; චින්තෙන්තො වා, සිතමින් හෝ; (ඉක්මවාද) අස්ස, මොහුවිසින්; භණ්ඩං භාණ්ඩය, දෙය්‍යං හොති එව, දියයුතුවේමය.

171 යො, යම් භික්ෂුවක්; වරාහ, හූරැය; බ්‍යග්ඝ, ව්‍යාඝ්‍රය; අච්ඡ, වලස්සුය; තරච්ඡක, කාලසිංහය යන; ආදිතො, මේ ආදීන් කෙරෙන් (ඇතිවන); උපද්දවා, උපද්‍රවයන් කෙරෙන්; මුඤ්චිතුකාමතාය, මිදෙනු කැමැත්තෙන්; චෙ, ඉදින්; තං ඨානං, ඒ (ආරක්ෂා) ස්ථානය; අතික්කමෙති, ඉක්මවාද; න කොචි දොසො, කිසි දොසක් නැත්තේය; තථා එව, එපරිද්දෙන්ම; භණ්ඩදෙය්‍යකං පන, භණ්ඩදෙය්‍යය වනාහි වේ.

172 ඉදං ආරක්ඛත්ථානං, මේ ආරක්ෂා ස්ථානය; සුංකඝාතතො. සුංකග්‍රහණස්ථානයට වඩා; ගරුකං, ගරුවේ; තස්මා, එසේහෙයින්; තං, ඒ ආරක්ෂා ස්ථානයට; අනොක්කම්ම. ප්‍රවිෂ්ටනොව; ගච්ඡතො, (දුරින්) යන්නාහට; දුක්කටං, දුකුලාවේයයි; උද්දිට්ඨං, උදෙසනලදී.

173 එතං, මේ (කියනලද ආරක්ෂා) ස්ථානය; ථෙය්‍යචිත්තෙන, සොරසිතින්; පරිහරන්තස්ස, ඉක්මවා දුරින්යන භික්ෂුවට; ආකාසෙන අපි, අහසින් නමුදු, ගච්ඡතො, යන්නාවූ ඔහට; පාරාජිකං පන, පරිජි වනාහි; සත්ථුනා, ශාස්තෘන් වහන්සේ විසින්; උද්දිට්ඨං, උදෙසනලදී.

174 තස්මා, එසේහෙයින්; එත්ථ, මේ ආරක්ෂා ස්ථානයෙහි; විසෙසෙන, විශෙෂයෙන්; සතිසම්පන්න චෙතසා, ස්මෘතිසම්පන්න සිතින් යුක්තවූ; පියසීලෙන, ප්‍රියශීලී (වීර්‍ය්‍යසම්පන්න)වූ; භික්ඛුනා

175 තොයදුල්ලභකාලස්මිං A භාජනෙ ගොපිතං ජලං,
ආවිඤ්ඡිත්වා පවෙසෙත්වා ඡිද්දං කත්වා පි වා තථා.

176 වාපියං වා තළාකෙ වා භාජනං අත්තනො පන,
ගණ්හන්තස්ස පවෙසෙත්වා භණ්ඩදෙය්‍යෙන විනිද්දිසෙ.

177 ඡින්දතො මරියාදං තු අදින්නාදානපුබ්බතො,
භූතගාමෙන සද්ධිම්පි දුක්කටං පරිදීපිතං.

178 අන්තො ඨත්වා බහි ඨත්වා ඡින්දතො උභයත්ථපි,
බහි අන්තෙන්ත කාතබ්බො අන්තො අන්තෙන්ත මජ්ඣතො.

**උදකට්ඨ කථා.**

---

භික්ෂුව විසින්; අප්පමත්තෙන, ස්මෘතිඅවිප්‍රවාසයෙන් යුක්තවූවකු; හොතබ්බං, වියයුතුවේ.

**අරණ්‍යස්ථ කථාව නිමියෙය.**

175 තොය දුල්ලභ කාලස්මිං, ජල දුර්ලභ කාලයෙහි; භාජනෙ, බඳුනෙහි; (වත්කොට) ගොපිතං, රක්නාලද; ජලං, ජලය; ආවිඤ්ඡිත්වාවා, භාජනය නමා හෝ; පවෙසෙත්වා වා, බඳුනක් එහි දමා හෝ; ඡිද්දං වා, සිදුරක් හෝ; කත්වා අපි, කොටද; තථා, එසේ.

176 වාපියං වා, (ආරක්ෂා සහිත) වැවක හෝ; තළාකෙ වා තඩාගයක හෝ; අත්තනො, තමාගේ; භාජනං පන, භාජනය වනාහි; පවෙසෙත්වා, ප්‍රවේශකොට; ගණ්හන්තස්ස, ජලය ගන්නා භික්ෂුවහට; භණ්ඩදෙය්‍යෙන, භණ්ඩදෙය්‍ය වශයෙන්; විනිද්දිසෙ, ඇවැත් දක්වන්නේය.

177 මරියාදං, වැව් ආදියෙහි මර්‍ය්‍යාදා (සීමා) ව; ඡින්දතො තු. සිඳින්නාවූ භික්ෂුවට වනාහි; අදින්නාදාන පුබ්බතො, අදත්තාදානින් පූර්වප්‍රයොග හෙයින්; භූත ගාමෙන සද්ධිං, භූතගාම විකොපන (පෘථිවි ඛණන) යන්ගෙන් යුක්තවූ; දුක්කටං, දුකුලා ඇවැත්; පරිදීපිතං, දක්වනලදී.

178 අන්තො, වැව ඇතුළත; ඨත්වා, සිට; ඡින්දන්තො (මර්‍ය්‍යාදාව) සිඳින්නේ; බහි, පිටත්හි; අන්තෙන, අන්තයෙන්ද; බහි, පිටත්හි; ඨත්වා, සිට; අන්තො, ඇතුළත; අන්තෙන, අන්තයෙන්ද; උභයත්ථ අපි, (ඇතුළත පිටත) දෙතන්හිද; ඨත්වා, සිට; ඡින්දන්තො, සිඳින්නේ; මජ්ඣතො, මධ්‍යයෙන්ද. (නික්මුනු ජලය අගනා පමණින) කාතබ්බො, (ඒ මහණහට) ඇවැත් කටයුත්තේය.

**උදකස්ථ කථාව නිමියෙය.**

---

A තොයං දුල්ලභං යස්මිං සො තොයදුල්ලභො තොයදුල්ලභො ච සො කාලො චා ති තොයදුල්ලභකාලො-තස්මිං.

179 වාරෙන සාමණෙරා යං දන්තකට්ඨ මරඤ්ඤතො,
ආනෙත්වා'චරියානම්පි ආහරන්ති සචෙ පන. *

180 ඡින්දිත්වා යාව සඞ්ඝස්ස න නිය්‍යා දෙන්ති තෙ පන,
ආභතං තාව තං සබ්බං තෙසමෙව ච සන්තකං.

181 තස්මා තං ථෙය්‍යචිත්තෙන ගණ්හන්තස්ස ච භික්ඛුනො,
ගරුභණ්ඩං ච සඞ්ඝස්ස භණ්ඩග්ඝෙන පරාජයො.

182 යදා නිය්‍යාදිතං තෙහි තතො පට්ඨාය සඞ්ඝිකං,
ගණ්හන්තස්සාපි ථෙය්‍යාය අවහාරො න විජ්ජති.

183 අරක්ඛත්තා යථාවුඩ්ඪං මභාජෙතබ්බතො පි ච.
සබ්බසාධාරණත්තා ච අඤ්ඤං විය න හොති'දං.

දන්තකට්ඨ කථා.

---

179 සාමණෙරා පන, සාමණේරයෝ වනාහි; වාරෙන, වාරයෙන් වාරය; අරඤ්ඤතො, වනයෙන්; යං දන්තකට්ඨං, යම් දැහැටියක්; ආනෙත්වා, (සඞ්ඝයාගේ ප්‍රයෝජනය පිණිස) ගෙනවුත්; සචෙ, ඉදින්; ආචරියානං අපි, (සවකීය) ආචාර්‍ය්‍යයන්ටද; ආහරන්ති, ගෙන එත්ද.

180 තෙ පන, ඒ සාමණේරයෝ වනාහි; ඡින්දිත්වා, සිඳ; සඞ්ඝස්ස, සඞ්ඝයාහට; යාව, යම්තාක්; න නිය්‍යාදෙන්ති, පවරානො දෙත්ද; තාව, ඒතාක්; ආභතං, (ඔවුන් විසින) ගෙනඑනලද; තං සබ්බං, ඒ සියලු දැහැටි; තෙසං එව ච, ඒ දැහැටිගෙනා හෙරණුන්ගේම; සන්තකං, සන්තකවේ.

181 තස්මා, ඒ දැහැටි ඔවුන් සතුහෙයින්; තං ච, ඒ දැහැටිද; සඞ්ඝස්ස, (සඟසතුබිම උපන් සඞ්ඝයා විසින් රක්නාලද) සඞ්ඝයා පිළිබඳවූ; ගරුභණ්ඩං ච, ගරුභාණ්ඩභූත දැහැටිද; ගණ්හන්තස්ස (සොරසිතින්) ගන්නාවූ; භික්ඛුනො ච, භික්ෂුවහටද; භණ්ඩග්ඝෙන, භණ්ඩග්ඝ වශයෙන්; පරාජයො, (සස්නෙන්) පිරිහීමවේ.

182 යදා, යම් කලෙක; තෙහි, ඒ හෙරණුන් විසින්; නිය්‍යාදිතං, (මහසඟනට) පවරනලදද; තතො පට්ඨාය, එතැන්පටන්, සඞ්ඝිකං, (ඒ දැහැටි) සඞ්ඝිකවේ; ථෙය්‍යාය, සොරසිතින්; ගණ්හන්තස්ස අපි, ගන්නා (භික්ෂුව) ටද; අවහාරො, අවහාරයෙක්; න විජ්ජති, නොපැනේ.

183 අරක්ඛත්තාච නොරක්නා හෙයින්ද; යථා වුඩ්ඪං, පිළිවෙල නොඉක්මවා; අභාජෙතබ්බතො අපි, (එල පසුපාදියමෙන්) නො

---

* සාමණෙරා වාරෙන භික්ඛුසඞ්ඝස්ස දන්තකට්ඨං ආහරන්තා ආචරියුපජ්ඣායානම්පි ආහරන්තීති—සමන්තපාසාදිකා.—185

184 අග්ගිං වා දෙති සත්ථෙන ආකොටෙති සමන්තතො,
ආකොටෙති විසං වාපි මණ්ඩූකණ්ටකනාමකං.

185 යෙන වා තෙන වා රුක්ඛො විනස්සති ච ඩය්හති,
සබ්බත්ථ භික්ඛුනො තස්ස භණ්ඩදෙය්‍යං පකාසිතං.

**වනප්පති කථා.**

186 සීසතො කණ්ණතො වාපි ගීවතො හත්ථතො පි වා,
පිළන්ධනං වා පි මොචෙත්වා ගණ්හන්තො ථෙය්‍යචෙතසා.

187 හොති මොචිතමත්තස්මිං සීසාදිහි පරාජයො,
ථුල්ලච්චයං කරොන්තස්ස ආකඩ්ඪන විකඩ්ඪනං.

---

බෙදියයුතු හෙයින්ද; සඞ්ඝසාධාරණත්තාව, (සඞ්ඝයාට ඇතුළත් සියල්ලන්ට සාධාරණහෙයින්ද; ඉදං, මේ (සඟනට පැවරූ)දූහැටි; අඤ්ඤං පිය,අත්‍යවූ(රක්නාලද)දූහැටිමෙන්; නහොති, නොවේ)

**දහන කණ්ඩ කථාව නිමියාය.**

184 (රුක්ඛ, (මනුෂ්‍ය පරිභොගාහී අඹ පනසාදි සාරවත්) වෘක්ෂයෙක්හි;)අග්ගිංවා,ගිනි හෝ; දෙති, දේ(දල්වා)ද;සමන්තතො, (වෘක්ෂය)හාත්පසින්; සත්ථෙන, සැතින්; ආකොටෙති, (කොට)සිඳීද; මණ්ඩූකණ්ටකනාමකං, මඬුකටු නම්වූ; විසංවාපි, විෂදහෝ; ආකොටෙති, (නසනු පිණිස සොරසිතින්) ප්‍රවෙශකෙරේද.

185 තෙනවා, ඒ කියනලද උපායකින් හෝ; යෙනවා, අන් කිසි උපායකින් හෝ; රුක්ඛො,(පරිභොගාහී)වෘක්ෂය; විනස්සති ච, විනාශවනුලැබේද; ඩය්හති ච, දනුලැබේද; සබ්බත්ථ, ඒ සියලු තන්හි; තස්ස භික්ඛුනො, ඒ භික්ෂුවහට; භණ්ඩදෙය්‍යං, භාණ්ඩ දෙය්‍යය වේයයි; පකාසිතං, ප්‍රකාශකරනලදී.

**වනප්පති කථාව නිමියාය.**

186 සීසතො වා. හිසින් හෝ; කණ්ණතො වා අපි, කණින්ද හෝ; ගීවතො වා, ග්‍රීවයෙන් හෝ; හත්ථතො වා අපි, හස්තයෙන්ද හෝ; පිළන්ධනාපිවා, (ග්‍රීවාභරණාදියක්) සිඳ හෝ; මොචෙත්වාඅපි, (කර්ණාභරණාදියක්) මුදා හෝ; ථෙය්‍යචෙතසා, සොරසිතින්; ගණ්හන්තො, ගන්නා (භික්ෂුව) හට.

187 සීසාදිහි, ශීර්ෂකර්ණාදීන්ගෙන්; මොචිතමත්තස්මිං, (ආභරණ) මිදූකල්හි; පරාජයො හොති, (ඒ භික්ෂුවට) පරාජිවේ; ආකඩ්ඪන විකඩ්ඪනං. තමාවෙතට ඇදීම හා තමාවෙතින් ඉවතටඇදීමද; කරොන්තස්ස, කරන්නාවූ (භික්ෂුව) හට; ථුල්ලච්චයං, ථුලසි ඇවැත්වේ.

188 හත්ථා අනීහරිත්වා ච වලයං කටකම්පි වා.
අග්ගබාහුං ච ඝංසෙන්තො වාරෙති * අපරාපරං
189 තමාකාසගතං චොරෙ කරෙති යදි රක්ඛති,
සවිඤ්ඤාණකතො මූලෙ වලයං ව න හොතිදං.
190 නිවත්ථං පන වත්ථං යො අච්ඡින්දති පරස්ස චෙ,
පරෙපි පන ලජ්ජාය සහසා තං න මුඤ්චති.
191 ආකඩ්ඪන්ති ච චොරොපි සො පරෙ තාව රක්ඛති,
පරස්ස හත්ථතො වත්ථෙ මුත්තමත්තෙත පරාජයො.
192 සභණ්ඩහාරකං භණ්ඩං නෙනතස්ස† පඨමෙ පදෙ,
ථුල්ලච්චයමතික්කන්තෙ දුතියෙව චුතො සියා.

---

188 වලයංවා, අවඩක මෑණට වලයම (වලල්ල)ක් හෝ; කට කංපිවා, අනෙකවඩක බුබ්බුලාදීන් යුත් කටකය (වලල්ල)ක්ද හෝ; හත්ථා, හස්තයෙන්; අනීහරිත්වා එව, (ගලවා) නොගෙනම; අග්ගබාහුං ච, (වැලමිටෙන්) අගඅතද; ඝංසෙන්තො; ඝට්ටනය කරමින්, අපරාපරං, ඔබ්මොබ; වාරෙති, වාරණයකෙරේද.

189 චොරො, සොරතෙම; තං, එය; යදි, ඉදින්; අකාසගතං, කරොති, (සියලුදෙසින් හස්තස්පර්ශ නොවනසේ) අකාශගතකෙරේද; රක්ඛති, (ආපත්තීන්) රක්ෂාවේ; (කවරහෙයිනයත්?) සවිඤ්ඤාණකතො. සවිඤ්ඤාණක හෙයින්; මූලෙ, රුක්මුල; වලයං ඉව, තිබාන දම වලයම්මෙන්; ඉදං, (ස්පර්ශනොවනසේ අහස් ගතකළා මේ වලයම; නහොති, පරිජි ඇවැත්නොවේ.

190 යොපන, යමෙක් වනාහි; පරස්ස, අන්‍යයා විසින්; නිවත්ථං, අඳනාලද; වත්ථං, වස්ත්‍රය; චෙ, ඉදින්; අච්ඡින්දති, අසිදීද; පරෙපි, වස්ත්‍ර හිමියාද; ලජ්ජාය, ලජ්ජාවෙන්; තංපන, ඒ වස්ත්‍රය වනාහි; සහසා. වහා; නමුඤ්චති, නොමුදාද.

191 චොරොඅපි, සොරාද; සො පරො අපි, ඒ අන්‍යවූවස්ත්‍ර ස්වාමියාද; ආකඩ්ඪන්තිච, (යම්තාක්) අදීද; තාව, එතාක්; රක්ඛති, (පරිජියෙන්) රැකේ; පරස්ස වස්ත්‍රස්වාමියාගේ; හත්ථතො, අතින්; වත්ථෙ. (අඳනාලද) වස්ත්‍රය; මුත්තමත්තෙත මිදුණුකල්හි; පරාජයො, සොරහුට පරිජිවේ.

192 සභණ්ඩහාරකං, (ආභරණ වස්ත්‍රාදි භාණ්ඩ) ගෙනයන්නහු හා සමග; භණ්ඩං, (වස්ත්‍රාභරණාදි) භාණ්ඩය; නෙනෙන්තා, (සිටි තැනින් තොරකොට තමා කැමැති දෙස) පමුණුවන්නේ; අස්ස, ඒ භාණ්ඩ හාරකයාගේ; පඨමෙපදෙ, පළමු පියවර; අතික්කන්තෙ

---

+ සාරෙති ඉති කත්ථචි.

† නෙනතස්ස-නෙනෙන්තා-අස්ස ඉතිපදච්ඡෙදො.

193 පාතාපෙති සචෙ භණ්ඩං තජ්ජෙත්වා ථෙය්‍යචෙතසො,
පරස්ස හත්ථතො භණ්ඩෙ මුත්තමත්තෙ පරාජයො.

194 අථාපි පරිකප්පෙත්වා පාතාපෙති ච යො පන,
තස්ස පාතාපනෙ වුත්තං දුක්කටා මසනෙ පි ච.

195 ඵන්දාපෙති යථාවත්ථුං ඨානා චාවෙති චෙ චුතො,
තිඨ තිඨාති වදතො න දොසො ඡඩ්ඩිතෙ පිච

196 අංගනත්ථං ථෙය්‍යචිත්තෙන පච්ඡා තං ගණ්හතො සියා,
පාරාජිකං තදුද්ධාරෙ සාලයෙ සාමිකෙ ගතෙ.

197 ගණ්හතො සකසඤ්ඤාය ගහණෙ පන රක්ඛති,
භණ්ඩදෙය්‍යං තථා පංසුකූලසඤ්ඤාය ගණ්හතො.

---

ඉක්මුණු කල්හි; ථුල්ලච්චයංච. ථුලසියටද; (පැමිණ) දුතියෙ, භණ්ඩ හාරකයාගේ දෙවන පියවර ඉක්මුණු කල්හි; චුතො සියා, (සස්නෙන්) චුතවූයේ වන්නේය.

193 සචෙ, ඉදින්, තජ්ජෙත්වා, (භණ්ඩ හාරකයාට) තර්ජනය කොට; භණ්ඩං, භාණ්ඩය; ථෙය්‍ය චෙතසො, සොරසිතින් යුක්ත වූයේ; පාතාපෙති, හෙළවාද; පරස්ස, බඩු හිමියාගේ; හත්ථතො, අතින්; භණ්ඩෙ, භාණ්ඩය; මුත්තමත්තෙ, (කෙසගක් පමණ) මිදුණුකල්හි; පරාජයො, (තර්ජිත භික්ෂුවහට) පරිජිවේ.

194 අථාපි, නොහොත්; යොපන, යම් භික්ෂුවක් වනාහි; පරිකප්පෙත්වා, (රැව්දෙයක් නම්ගන්නෙමැයි) පරිකල්පනාකොට; පාතාපෙතිච, (තර්ජනයකොට) පතනය කරවාද; තස්ස, ඒ භික්ෂුවහට; පාතාපනෙපිච, හෙළුවීමෙහිද; ආමසනෙපිච, භාණ්ඩාමර්ශනයකළ කල්හිද; දුක්කටං, දුකුළා ඇවැත්වේයයි; වුත්තං, කියනලදී.

195 ඵන්දාපෙති, (පාතාපිතභාණ්ඩ) සොලවාද; යථාවත්ථුං, භණ්ඩග්ඝව්‍යක්ති, ක්‍රමානුරූප ථුලසිවේ; චෙ, ඉදින්; ඨානාචාවෙති, ඨානා චාවනයකෙරේද; චුතො, (ඔහු සස්නෙන්) චුතවූයේවේ. තිඨතිඨ ඉති. සිටුව සිටුවයි; වදතො, කියනකල්හි; ඡඩ්ඩිතෙඅපි ච, දැමූ කල්හිද; නදොසො, පාරාජිකා දෝෂයක් නැත්තේය.

196 පච්ඡා, පසුව; අංගනත්ථං, අවුත්; ථෙය්‍යචිත්තෙන, සොරසිතින්; තං, ඒ වස්තුව; ගණ්හතො, ගන්නාභික්ෂුවට; සාමිකෙ, (බියව පලාගිය) වත් හිමියා; සාලයෙ, වස්තුවාලය ඇතිව; ගතෙ පැනගිය කල්හි; තදුද්ධාරෙ, ඒ වස්තුව උඩටගැන්මෙහි: පාරාජිකං, පරිජි ඇවැත්; සියා, වන්නේය.

197 සකසඤ්ඤාය, (ඒ භාණ්ඩය) තමාගේය යන සඤ්ඤාවෙන්; ගණ්හතො, ගන්නා භික්ෂුවහට; ගහණෙ පන, තමහට ගැනීමෙහි

198 තිට්ඨ තිට්ඨාති වුත්තෙව ඡඩ්ඩෙත්වා පන භණ්ඩකං,
කත්වාව ධුරනික්ඛෙපං භීතො චොරො පලායති.

199 ගණ්හතො ථෙය්‍යචිත්තෙන උබ්භාරෙ දුක්කටං පුන,
දාතබ්බමාහරාපෙන්තෙ අදෙන්තස්ස පරාජයො.

200 කස්මා තස්ස පයොගෙන ඡඩ්ඩිතත්තා ති සාදරං,
මහාඅට්ඨකථායන්තු වුත්තමඤ්ඤෙසු තං ගතං.

## හරණ කථා.

201 සම්පජාන මුසාවාදං න ගණ්හාමීති භාසතො,
අදින්නාදානපුබ්බත්තා දුක්කටං හොති භික්ඛුනො.

---

වනාහි; රක්ඛති, (අවහාරාපත්තියෙන්) රැකේ; භණ්ඩදෙය්‍යං, භණ්ඩදෙය්‍යය වේ; තථා, එසේම; පංසුකූල සඤ්ඤාය, පාංශුකූල සඤ්ඤාවෙන්; ගණ්හතො, ගන්නා භික්ෂුවට; තථා, එසේ භණ්ඩදෙය්‍යයම වේ.

198 තිට්ඨ තිට්ඨ ඉති, සිටුව සිටුවයි; වුත්තෙ එව, කියනලදුයේම; චොරො, සොරතෙම; භීතො, බියපත්වූයේ; භණ්ඩකං පන, භාණ්ඩය වනාහි; ධුරනික්ඛෙපං කත්වා එව, (මින් මටකම්නැතැයි) නිරාලයවම; ඡඩ්ඩෙත්වා, හෙළා; පලායති, පැනයේද.

199 ථෙය්‍යචිත්තෙන, සොරසිතින් යුක්තව; ගණ්හතො, ගන්නා භික්ෂුවහට; උබ්භාරෙ, ඒ භාණ්ඩය තුබූතැනින් ඉදිරීමෙහි; දුක්කටං, (නිරවද්‍ය වස්තුව වුවත් සොර සිතින් ගත්හෙයින්) දුකුලාවේ; පුන, යළිත්; ආහරාපෙන්තෙ, † හිමියා විසින් ගෙන්වන කල්හි; දාතබ්බං, දියයුත්තේය; අදෙන්තස්ස, ඉල්වා නොදෙන්නාහට; පරාජයො, පරිජිවේ.

200 කස්මා, කුමක්හෙයිනයත්? තස්ස, ඔහුගේ; පයොගෙන, ප්‍රයොගයෙන්; ඡඩ්ඩිතත්තා ඉති, දමනලද හෙයින්යයි; සාදරං, සාදරතොට; මහාඅට්ඨකථායංතු, මහ අටුවාවෙහි වනාහි; වුත්තං, කියනලදී; අඤ්ඤෙසු, මහාපච්චරිආදි අන්‍යඅට්ඨකථාවන්හි; තංගතං, එය එසේ නායෙය්ය.

## හරණක කථාව නිමියාය.

201 නගණ්හාමි ඉති, (තමාවෙත ප්‍රවේසම පිණිස තුබූ යමක් හිමියා ඉල්වූකල) නොගත්තෙමැයි; සම්පජානමුසාවාදං, දැන දැන

---

† භාවලක්ඛණ සප්තමීයි.

202 රහො මයා පනෙ'තස්ස ඨපිතං කිනනු දස්සති,
ඉච්චෙවං විමතුප්පාදෙ තස්ස ථුල්ලච්චයං සියා.

203 තස්මිං දින්නෙ නිරුස්සාහෙ පරො චෙ නික්ඛිපෙ ධුරං,
උභින්නං ධුරනික්ඛෙපෙ භික්ඛු හොති පරාජිතො.

204 විඤ්ඤත්තනාදාතුකාමොව දස්සාමීති මුඛෙන චෙ,
වදන්තො ධුරනික්ඛෙපෙ සාමිනො හි පරාජයො.

## උපනික්ඛිත්ත කථා.

---

මුසවා; භාසන්තො, කියන්නාවූ; භික්ඛුනො, භික්ෂුවහට; අදින්නාදාන පුබ්බත්තා, අදත්තාදාන පූර්වප්‍රයොගයෙහෙයින්; දුක්කටං හොති, දුෂ්කෘතාපත්ති වේ.

202 මයාපන, මාවිසින් වනාහි; රහො, රහසිගතව; එතස්ස, මොහු සමීපයෙහි; ඨපිතං, තුබූදෙය; කිනනු, කිම හෝ; දස්සති ඉති, දෙන්නේදැයි; එවං, මෙසේ; විමතුප්පාදෙ * විමති, ඉපදවීම් හෙතුවෙන්; තස්ස, ඒ භික්ෂුවහට; ථුල්ලච්චයං, ථුලසි ඇවැත්; සියා, වන්නේය

203 තස්මිං, (තුබූවස්තුව යමෙකුවෙතද) ඒ භික්ෂුව; දින්නෙ, ස්වාමියාට දීමෙහි; නිරුස්සාහෙ, නිරුත්සාහවූකල්හි; පරො, අන්‍යවූ වස්තු ස්වාමිතෙම; චෙ, ඉදින්; ධුරං, ගැනීමෙහි උත්සාහය; නික්ඛිපෙ, හරන්නේද; උභින්නං, දෙදෙනාගේ; ධුරනික්ඛෙපෙ, දීම් ගැනීම් දෙක්හි උත්සාහයහළකල්හි; භික්ඛු,(හිමියාට වස්තුවනුදුන්) භික්ෂුව; පරාජිතො හොති, කෙලෙසුන් විසින් පරදවනලද්දේවේ

204 විඤ්ඤත්තනා, සිතින්; අදාතුකාමො, නොදෙනු කැමැත්තේ; දස්සාමිඉති, දෙන්නෙමියි; මුඛෙන, මුඛයෙන්; වදන්තොචෙ, † කියන භික්ෂුවවද; සාමිනොහි, වස්තු ස්වාමියාගේ වනාහි; ධුරනික්ඛෙපෙ, ධුරනික්ෂෙපයෙහි; පරාජයො එව, පරාජයමවේ.

## උපනිධි කථාව නිමියාය.

---

* හෙතුවෙහි සප්තමිය † චෙ. ති අපිසඤ්ඤපෙ.

205 සුඞ්ක ඝාතස්ස අන්තො'ව ඨත්වා පාතෙති චෙ බහි,
ධුවං පතති චෙ හත්ථා මුත්තමත්තෙ පරාජයො.

206 තං රුක්ඛෙ ඛාණුකෙ වා'පි හුත්වා පටිහතං පන,
වාතුක්ඛිත්තං පි වා අන්තො සචෙ පතති රක්ඛති.

207 පතිත්වා භූමියං පච්ඡා වට්ටන්තම්පන භණ්ඩකං,
සචෙ පවිසති අන්තො'ව තස්ස පාරාජිකං සියා.

208 ඨත්වා ඨත්වා පවට්ටන්තං පවිට්ඨෙ'ව පරාජයො,
අතිට්ඨමානං වට්ටිත්වා පවිට්ඨං පන රක්ඛති.

209 ඉති වුත්තං දළ්හං කත්වා කුරුන්දට්ඨ කථා'දිසු,
සාරතො තං ගහෙතබ්බං යුත්තං විය ච දිස්සති.

---

205 සුඞ්කඝාතස්ස අන්තො එව, (රාජාදීන් විසින් නියමිත සුංවත් දියයුතු) සුඞ්කස්ථානය ඇතුළතම; ඨත්වා, සිට; බහි (සුංවත් දියයුතු ස්ථානයෙන්) පිටත්හි; චෙ, ඉදින්; පාතෙති (හොරසිතින්) හෙළාද: චෙ, ඉදින්; (පස්මසුවක් හෝ ඉන් වැඩියක් සුංවත් දිය යුතු ඒ භාණ්ඩය) ධුවං, ඒකාන්තයෙන්; පතති, (පිටත) වැටේද; හත්ථා, අතින්; මුත්තමත්තෙ, මිදුණුපමණකින්; පරාජයො,(ඔහට) පරිජිවේ.

206 තංපන, (සුංකස්ථානයෙන් පිටතළු) ඒ භාණ්ඩය වනාහි; රුක්ඛෙවා, වෘක්ෂයක හෝ; ඛාණුකෙවා, කණුවක හෝ; පටිහතං හුත්වාඅපි, වැදීමෙන්ද හෝ; වාතුක්ඛිත්තං අපි වා, වාතවේගයෙන් (ආපසු) උක්ෂෙප කර මතලද්දේද හෝ; සචෙ, ඉදින්; අන්තො එව, (සුංකස්ථානය) ඇතුළතම; පතති, වැටේද; රක්ඛති, (පරිජි ඇවතින්) රැකෙන්නේය.

207 සචෙපන, ඉදින් වනාහි; භූමියං, (පිටත) භූමියෙහි; පතිත්වා; වැටී; වට්ටන්තං, පෙරළෙන්නාවූ; භණ්ඩකං, ඒ භාණ්ඩය; අන්තොඑව, (සුංකස්ථානය) ඇතුළතටම; පවිසති, ප්‍රවිෂ්ටවේද; තස්ස, ඒ භික්ෂුවහට; පාරාජිකං සියා, පරිජි ඇවැත් වන්නේය.

208 චෙපන, ඉදින් වනාහි; ඨත්වා ඨත්වා, (පිටතහුණුබඩුව) සිට සිට; පවට්ටන්තං, පෙරළෙන්නේ; පවිට්ඨෙ, ප්‍රවිෂ්ටවූයේද; පරාජයො; පරිජිවේ; අතිට්ඨමානං, නොසිටින්නේ; වට්ටිත්වා, පෙරළී; පවිට්ඨං, ප්‍රවිෂ්ටවීද; රක්ඛති, (ඒ භික්ෂුව) රැකෙන්නේය.

209 කුරුන්දට්ඨකථාදිසු, කුරුන්දිසඞ්ඛෙපපච්චරිකථාදියෙහි; ඉති, (පතිත්වාභූමියං යනාදි ක්‍රමය) මෙසේ; දළ්හං කත්වා, දැඩිකොට; වුත්තං, කියනලදී; තං, ඒකීම; සාරතො, සාර වශයෙන්; ගහෙතබ්බං, ගත යුතුවේ; යුත්තංවිය ච, යුක්තියක් මෙන්ද; දිස්සති, දක්නාලැබේ.

210 සයං වා යදි වට්ටෙති වට්ටාපෙති පරේන වා,
අඨත්වා වට්ටමානං තං ගතං නාසකරං සියා.

211 ඨත්වා ඨත්වා සචෙ අන්තො බහි ගච්ඡති රක්ඛති,
ඨපිතෙ සුද්ධ චිත්තෙන සයං වට්ටෙති වට්ටති.

212 ගච්ඡන්තෙ පන යානෙ වා ගජෙ වා තං ඨපෙති චෙ,
බහි නීහරණත්ථාය නා වහාරො'පි නීයතෙ.

213 ඨපිතෙ ඨිතයානෙ වා පයොගෙන විනා ගතෙ,
සන්තෙපි ථෙය්‍ය චිත්තස්මිං අවහාරො න විජ්ජති.

214 සචෙව පාජෙති තං යානං ඨපෙත්වා යානකෙ මණිං,
සියා පාරාජිකං තස්ස සීමා'තික්කමනෙ පන.

---

210 යදි, ඉදින්; සයංවා, තෙමේ හෝ; වට්ටෙති, (ඇතුළත සිට අත් ආදියෙන්) පෙරළාද; පරේනවා, අනිකෙකු විසින් හෝ, වට්ටාපෙති, පෙරළවාද; අඨත්වා, නොසිට; වට්ටමානං, පෙරළෙන්නාවූ; තං, ඒ භාණ්ඩය; ගතං. ගියේද; නාසකරං සියා, (සීලසම්පත්තිය) විනාශ කරවන්නේය.

211 සචෙ, ඉදින්; අන්තො, සීමාව ඇතුළත; ඨත්වා ඨත්වා, සිට සිට; බහි, සීමාවෙන් පිටත; ගච්ඡති, යේද; රක්ඛති, පරිජි ඇවැතින් රැකේ; සුද්ධචිත්තෙන, සුද්ධ චිත්තයෙන්; ඨපිතෙ, (ඇතුළත) තුබූ කල්හි; සයං, භාණ්ඩය තමා; වට්ටෙති, (වළතැන් හෙයින්) සීමාවෙන් පිටතට පෙරළේද; වට්ටති, වටනේය.

212 ගච්ඡන්තෙ, යන්නාවූ; යානෙ වා, යානාවක හෝ; ගජෙවා ඇතෙකු පිට හෝ; තං, ඒ(සුංවත් දියයුතු) භාණ්ඩය, චෙපන, ඉදින් වනාහි; බහිනීහරණත්ථාය, (සීමාවෙන්) පිටත ගෙනයන පිණිස; ඨපෙති, තබාද, නීහටෙඅපි, පිටත ගෙනගියකල්හිදු; නඅවහාරො, (තමාගේ ප්‍රයොග නැතිහෙයින්) අවහාරයක් නැත්තේ වේ.

213 ඨිතයානෙවා, සිටියානාවක හෝ; ඨපිතෙ, තබනලද කල්හි; පයොගෙන විනා, (ස්වකීය) ප්‍රයොගයෙන් තොරව; ගතෙ, (යානාව) ගිය කල්හි; ථෙය්‍යචිත්තස්මිං සන්තෙපි, සොරසිත ඇතිකල්හිදු; අවහාරො, (ඒ භික්ෂුවට) අවහාරයක්: නවිජ්ජති, නොපැනේ.

214 සචෙපන, ඉදින් වනාහි; මණිං, (පදහීයක් සුංවත් දියයුතු) මැණිකක්; යානකෙ, යානාවෙක්හි; ඨපෙත්වා, තබා; තං යානං, ඒ යානාව; පාජෙති, පදවාද; සීමාතික්කමනෙ, (සුංවත් දියයුතු) සීමාව ඉක්මවූ කල්හි; තස්ස, ඒ භික්ෂුවට; පාරාජිකං සියා, පරිජි වන්නේය.

215 සුඞ්කඝාතෙ මතං සුඞ්කං ගන්තුං දත්වා'ව වට්ටති,
සෙසො ඉධ කථා මග්ගො අරඤ්ඤට්ඨ කථා සමො.

**සුඞ්ක ඝාත කථා.**

216 අනෙනා ජාතං ධනක්කීතං දින්නං වා පන කෙනචි,
දාසං කරමරානීතං හරන්තස්ස පරාජයො.

217 භුජිස්සං වා හරන්තස්ස මනුස්සං මාතරා'පි වා,
පිතරා' ඨපිතං වා'පි අවහාරො න විජ්ජති.

218 තං පලාපෙතු කාමො'ව උක්ඛිපිත්වා භුජෙහි වා,
තං ඨිත ඨානතො කිඤ්චි සඞ්කාමෙති පරාජයො.

219 තජ්ජෙත්වා පදසා දාසං නෙන්තස්ස පද වාරතො,
හොන්ති ආපත්තියො යුත්තා තස්ස ථුල්ලච්චයා'දයො.

---

215 සුඞ්කඝාතෙ, සුංවත් අයකරන තන්හි; මතං,(මෙබඳු වස්තුවට මෙතෙක්දියයුතුයයි) සම්මත කරනලද; සුඞ්කං, සුංවත්; දත්වා එව, දීම; ගන්තුං, යන්ට; වට්ටති, වටනේය; ඉධ, මේ සුඞ්කඝාත කථාවෙහි; සෙසො කථාමග්ගො, සෙසු කථාමාර්ගය; අරඤ්ඤට්ඨකථා සමො, අරණ්‍යස්ථ කථාව හා සමවේ.

**සුඞ්ක ඝාත කථාව නිමියාය.**

216 අනෙනා ජාතං වා,දාසයාට දාව ගෙයි දාසියකුසින් උපන්නා වූ හෝ; ධනක්කීතංවා, ධනයෙන් විකිණ ගන්නාවූ හෝ; කෙනචි, කිසිවකු විසින්; දින්නංවා, දෙනලද්දාවූ හෝ; කරමරානීතං වා, විදෙශ විලොපක රජාදීන් විසින් පරදෙසින් ගෙනවුත් දාසබවට පමුණුවන ලද්දාවූ හෝ; දාසං පන, දාසයෙකු වනාහි; හරන්තස්ස, හරන භික්ෂුවට; පරාජයො, පරිජිවේ.

217 භුජිස්සංවා, දාසනොවූවකු හෝ; මාතරා අපිවා, මව විසින්ද හෝ; පිතරා අපිවා, පියා විසින්ද හෝ; ඨාපිතංවා, (ණය ගනිමින් ඒ ණය ගෙවනතුරු තොප සතුයයි) ණය හිමියන්වෙත තබනලද හෝ; මනුස්සං, මිනිසෙකු; හරන්තස්ස, හරනා භික්ෂුවට; අවහාරො, අවහාරයක්; නවිජ්ජති, නැත්තේය;(ඔවුහු කර්මාන්තයට විනා සිටුවන ලද්දහුට ඊශ්වර නොවන බැවිනි.)

218 තං, ඒ දාසයෙකු; භුජෙහිවා, දෙඅතින් හෝ; උක්ඛිපිත්වා, ඔසවා; පලාපෙතුකාමො එව, පලායවනු කැමැත්තේම;තං, ඒ දාසයා; ඨිතඨානතො, සිටිතැනින්; කිඤ්චි, ස්වල්පයකුදු; සඞ්කාමෙති, ඉක්මවාද; පරාජයො, (ඕහට) පරිජි ඇවැත් වේ.

219 තජ්ජෙත්වා, තර්ජනයකොට; දාසං, ඒ දාසෙකු; පදසා, පාගමනින්; නෙන්තස්ස, (කැමති දෙසකට) පමුණුවන්නාවූ; තස්ස, ඒ භික්ෂුවට; පදවාරතො, පියවර ගණනින්; ථුල්ලච්චයාදයො, ථුලසි

220 හත්ථාදිසු ගහෙත්වා තං කඩ්ඪතොපි පරාජයො,
ගච්ඡ යාහි පලාහීති වදතො'පි අයංනයො

221 වෙගසා'ව පලායන්තං පලාහී'ති ච භාසතො,
හොති පාරාජිකෙනස්ස අනාපත්ති හි භික්ඛුනො.

222 සනිකං පන ගච්ඡන්තං සචෙ වදති සො'පි ච,
සීඝං ගච්ඡති චෙ තස්ස වචනෙන පරාජයො.

223 පලායිත්වා සචෙ අඤ්ඤං ගාමං වා නිගම මපි වා,
ගතං දිස්වා තතො තං චෙ පලාපෙති පරාජයො.

පාණ කථා.

224 ථෙය්‍යා සප්පකරණ්ඩං චෙ පරාමසති දුක්කටං,
ඵන්දාපෙති යථාවත්ථුං ඨානතො චාවනෙ චුතො.

---

ආදිවූ; ථූලතා ආපත්තියො, ථුල්ලතාවූ ඇවැත්; හොන්ති,(පලමු පිය වරෙහිථුලසිදදෙවන පියෙහි පරිජිද) වෙත්.

220 තං, ඒ දාසයා, හත්ථාදිසු, හස්තාදීන්; ගහෙත්වා, (අල්වා) ගෙන; කඩ්ඪතො අපි, අදින මහණහටද; පරාජයො, පරිජිවේ; ගච්ඡ,යව; යාහි, ගමන්කරව; පලාහිඉති, පැන යවයි; වදතොඅපි, කියන මහණහටද; අයංනයො, මේ ක්‍රමය (පරිජි) වේ.

221 වෙගසාඑව, වෙගයෙන්ම; පලායන්තං, පැනයන දාසකු; පලාහි ඉති ච, පැනයවයි කියාද; භාසතො, කියන්නාවූ; අස්ස භික්ඛුනො, ඒ භික්‍ෂුවට; හි, ඒකාන්තයෙන්; පාරාජිකෙන, පරිජි ඇවතින්; අනාපත්ති, ඇවැත් නොවේ.

222 සනිකං, මඳ ගමනින්; පලායන්තං, පැනයන දාසකුට; වදති, වහායවයි කියාද; සචෙපන, ඉදින් වනාහි; සොපිච, හේතෙමේද; තස්ස, ඒ භික්‍ෂුවගේ; වචනෙන, වචනයෙන්; සීඝං, සීඝ්‍රව; ගච්ඡති චෙ, යේනම්; පරාජයො, (භික්‍ෂුවට) පරිජිවේ.

223 සචෙ, ඉදින්; පලායිත්වා, පලාගොස්; අඤ්ඤං, අන්‍යවූ; ගාමං වා, ගමකට හෝ; නිගමංපිවා, නියම් ගමකටද හෝ; ගතං, ගියාවූ දාසකු;දිස්වා,දැක;තතො,එයින්; තං,ඒදාසයා; චෙ,ඉදින්;පලාපෙති පලවාහරීද; පරාජයො, (පලවාහැරි මහණහට)පරිජි ඇවැත්වේ.

ප්‍රාණ කථාව නිමියාය.

224 සප්පකරණ්ඩං, සර්පපෙලාව; චෙ, ඉදින්; ථෙය්‍යා, සොරසිතින්; පරාමසති, ආමර්ශනය කෙරේද; දුක්කටං, දුකුලාවේ; ඵන්දාපෙති, පෙලාව සොලවාද; යථාවත්ථුං, ථුලසි වේ; ඨානතො, තුබූතැනින්; චාවනෙ, චුතකිරීමෙහි;චුතො,(ඔහු ස්තෙන්)චුතවූයේ වේ.

225 උග්ඝාටෙත්වා කරණ්ඩං තු සප්ප මුද්ධරතො පන,
කරණ්ඩතලතො මුත්තෙ නඞ්ගුට්ඨෙ තු පරාජයො.

226 ඝංසිත්වා කඩ්ඪතො සප්පං නඞ්ගුට්ඨෙ මුඛවට්ටිතො,
තස්ස සප්ප කරණ්ඩස්ස මුත්තමත්තෙ පරාජයො.

227 කරණ්ඩං විවරිත්වා වෙ පක්කොසන්තස්ස නාමතො,
සො නික්ඛමති චෙ සප්පො තස්ස පාරාජිකං සියා.

228 තථා කත්වා තු මණ්ඩූක මූසිකානං රවම්පි * වා,
පක්කොසන්තස්ස නාමෙන නික්ඛන්තෙපි පරාජයො.

229 මුඛං අවිවරිත්වා ව කරොන්තස්සෝ'වමෙව ච,
යෙන කෙනචි නික්ඛන්තෙ සප්පෙ පාරාජිකං සියා.

---

225 කරණ්ඩං තු, සර්පපෙළාව වනාහි; උග්ඝාටෙත්වා, විවර කොට; සප්පං, (කෙළවන) සර්පයා; උද්ධරතොපන උඩට ගන්නාහටවනාහි, කරණ්ඩතලතො, සර්ප පෙළාවෙන්; නඞ්ගුට්ඨෙ, නකුට අග; මුත්තෙතු, මෙන්වූ කල්හි වනාහි; පරාජයො, පරිජි වේ.

226 සප්පකරණ්ඩස්ස, සර්පපෙළාවට; ඝංසිත්වා, ඝටා; සප්පං, සර්පයා; කඩ්ඪතො අදින්නාවූ; තස්ස, ඒ භික්ෂුවට; මුඛවට්ටිතො, සර්ප පෙළා මුව විටින්; නඞ්ගුට්ඨෙ, නකුට; මුත්තමත්තෙ, මිදුණු කල්හි; පරාජයො, පරිජි ඇවැත් වේ.

227 කරණ්ඩං, සර්ප පෙළාව; චෙ, ඉදින්; විවරිත්වා, මදක් විවෘත කොට; නාමතො, සර්පයාගේ නාම වශයෙන්; පක්කොසන්තස්ස, කැඳවන්නාවූ; තස්ස, ඒ භික්ෂුවහට; චෙ, ඉදින්; සො සප්පො, ඒ සර්පතෙමේ; නික්ඛමති, ඉන් පිටතටඒද; පාරාජිකං සියා, පරිජි ඇවැත් වන්නේය.

228 තථා, එසේ සර්පපෙළාව හැර; මණ්ඩූක මූසිකානං තු, මැඩියන්ගේද මීයන්ගේද; රවං කත්වා අපි වා, ශබ්දකොට හෝ; නාමෙන, (සර්පයාගේ) නාමයෙන්; පක්කොසන්තස්සඅපි. කැඳවන්නාහටද; නික්ඛන්තෙ, නික්මුනු කල්හි; පරාජයො, පරිජි ඇවැත් වේ.

229 මුඛං, (සප්පේළා) මුඛය; අවිවරිත්වා වා, විවෘත නොකොට හෝ; එවමෙව, (මණ්ඩූකශබ්දකිරීම් ආදි)මෙපරිදිම; කරොන්තස්ස ච, කරන භික්ෂුවටද; යෙනකෙනචි, කියනලද පරිදි යම්කිසි උපායකින්; සප්පෙ, සර්පයා; නික්ඛන්තෙ, නික්මුනු කල්හි; පාරාජිකං, පරිජි; සියා, වන්නේය.

---

* වා සද්දෙන ලාජාවිකිරණ අච්ඡර පහාරාදීනං සඞ්ගණ්හාති.

130 මුඛෙ විවරිතෙ සප්පො සයමෙව පලායති,
න පක්කොසති චෙ තස්ස භණ්ඩදෙය්‍යං මුදීරිතං.

### අපාදකථා.

231 ථෙය්‍යචිත්තෙන යො හත්ථිං † කරොතා'මසනාදයො,
හොන්ති ආපත්තියො තස්ස තිවිධා දුක්කටාදයො.

232 සාලායං ඨිතහත්ථිස්ස අන්තොවත්ථඞ්ගණෙසු X පි,
ඨානං සාලා ච වත්ථුං ච අඞ්ගණං සකලං සියා.

233 අබද්ධස්ස හි බද්ධස්ස ඨිතට්ඨානං ච බන්ධනං,
තස්මා තෙසං වසා හත්ථිං හරතො කාරයෙ බුධො.

234 නගරස්ස බහිද්ධා තු ඨිතස්ස පන හත්ථිනො,
ඨිතට්ඨානං භවෙ ඨානං පදවාරෙන කාරයෙ.

---

230 මුඛෙ, (සර්පකරණ්ඩ) මුඛය; විවරිතෙ, විවරකළ කල්හි; චෙ, ඉදින්; සප්පො, සර්පතෙම; සයං එව, (අන්‍ය ප්‍රයොගනැතිව) තෙමේම; පලායති, පැනයේද; න පක්කොසති, නොකැඳවාද; තස්ස, ඒ භික්ෂුවහට; භණ්ඩදෙය්‍යං, භාණ්ඩදෙය්‍යය; උදීරිතං, කියනලදී.

### අපාද කථාව නිමියාය.

231 යො, යම් භික්ෂුවක්; හත්ථිං, ඇතු විෂයෙහි; ථෙය්‍යචිත්තෙන, සොරසිතින් යුක්තව; ආමසනාදයො, ආමර්ශන ඵන්දන ඨානාචාවන යනමොහු; කරොති, කෙරේද; තස්ස. ඒ භික්ෂුවහට; දුක්කටාදයො, දුකුළා ථූලසි පරිජියයි; තිවිධා, තුන්වැදෑරුම්වූ; ආපත්තියො, ආපත්තීහු; හොන්ති, වෙත්.

232 සාලායං අපි, ඇත්හලද; අන්තොවත්ථඞ්ගණෙසු අපි, රාජ මන්දිරය හා රජමිදුල ඇතුළතද; ඨිතහත්ථිස්ස, සිටි ඇතුට; සාලාව, ඇත්හලද; වත්ථුංච, රජමැදුරද; අඞ්ගණංච, රජමිදුලද; සකලං, (හස්ති සංචාරයොග්‍ය)සකලස්ථාන;ඨානං සියා, ස්ථානයවන්නේය.

233 අබද්ධස්සහි, නොබඳනාලද ඇතුට වනාහි; ඨිතට්ඨානංච, සිටි තැනද; බද්ධස්සහි, බඳනාලද ඇතුට; බන්ධනංච, බන්ධනයද; (ස්ථානයවන්නේය) තස්මා; එසේහෙයින්; තෙසං වසා, ඒ ස්ථාන (පරිච්ඡෙද)වශයෙන්; හත්ථිං, ඇතු;හරතො,(හස්තිශාලාදීන්සොරා) හරනා භික්ෂුවට; බුධො, විනයඥතෙමේ; කාරයෙ,(ඇවැත්) තබන්නේය.

234 නගරස්ස බහිද්ධා පන, නගරයෙන් පිටත වනාහි; ඨිතස්ස, සිටියාවූ; හත්ථිනො, ඇතුට; ඨිතට්ඨානං තු, (සතරපාදයෙන් ආක්‍ර

---

† භුම්මෙපෙ උපයොග වචනං X අපිසද්දො, අන්තොනාගරෙ ති අවුත්තං පි සම්පිණ්ඩෙති

235 නිපන්නස්ස ගජස්සෙකං ඨානං තං උට්ඨපෙති චෙ,
තස්මිං උට්ඨිතමත්තෙතු තස්ස පාරාජිකං සියා.

236 එසෙව ච නයො ඤෙය්‍යො තුරඞ්ගමහිංසාදිසු,
නත්ථි කිඤ්චිපි වත්තබ්බං ද්විපදෙපි බහුප්පදෙ.

**චතුප්පදකථා.**

237 පරෙසන්ති විජානිත්වා පරෙසං සන්තකං ධනං,
ගරුකං ථෙය්‍යචිත්තෙන ඨානා චාවෙති චෙ චුතො.

238 අනාපත්ති සසඤ්ඤිස්ස තිරච්ඡානපරිග්ගහෙ,
තාවකාලික විස්සාස ගාහෙ පෙතපරිග්ගහෙ.

239 යො පනෙත්ථ ච වත්තබ්බො පාළිමුත්තවිනිච්ඡයො,
තං මයං පරතො යෙව භණිස්සාම පකිණ්ණකෙ.

---

නතාස්ථානය) සිටිතැනම්; ඨානං, ස්ථානය; භවෙ, වන්නේය; පදවාරෙන, පියවරගණිතින්; කාරයෙ, ඇවැත් තබන්නේය.

235 නිපන්නස්ස, හොත්තාවූ; ගජස්ස, ඇතුට; එකංඨානං, (හොත්තාවූ) එකම්ස්ථානය වේ; චෙ, ඉදින්; තං, ඒ ඇතු; උට්ඨපෙති, (සොරසිතින්) නගාසිටුවාද; තස්මිං, ඔහු; උට්ඨිතමත්තෙතු, නැගිටිකෙණෙහිම වනාහි; තස්ස, ඒ භික්‍ෂුවට; පාරාජිකං සියා, පාරාජිකාවේ.

236 තුරඞ්ග මහිංසාදිසු ච, අශ්ව මහීෂාදීන් විෂයෙහිද; එසෙව නයො එව, මේ ක්‍රමයම්; ඤෙය්‍යො, දතයුත්තේය; දිපදෙ අපි, (මනුෂ්‍ය පක්‍ෂි ආදි) ද්විපදිකයන් කෙරෙහිද; බහුප්පදෙ අපි, (මිවුලිකාදි) බහුප්පද සත්වයන් කෙරෙහිද; වත්තබ්බං, කියයුතුවූ; කිංචි අපි, කිසිවකුදු; නත්ථි, නැත්තේය.

**චතුප්පද කථාව නිමියාය.**

237 පරෙසං සන්තකං, අන්සතුවූ; ධනං, ධනය; පරෙසං ඉති, අන්‍යයන්ගේයයි; විජානිත්වා, දැන; ගරුකං, පාදයක් හෝ අතිරෙක පාදයක් අගනා භාණ්ඩයක්; චෙ, ඉදින්; ථෙය්‍යචිත්තෙන, සොර සිතින්; ඨානා, තුබූතැනින්; චාවෙති, චුතකෙරේද; චුතො, (ඔහු සස්නෙන්) චුතවූයේ වේ.

238 සසඤ්ඤිස්ස, (අන්සතු වූවද තමන් සතුය යන සඤ්ඤාවෙන් ගන්නා භික්‍ෂුවටද; තිරච්ඡාන පරිග්ගහෙ, තිරිසනුන් විසින් පරිග්‍රහීතවස්තුවෙහිද; තාවකාලිකගාහෙ, තාවකාලික ග්‍රාහයෙහිද; විස්සාසගාහෙ, විශ්වාස ග්‍රාහයෙහිද; පෙතපරිග්ගහෙ, ප්‍රෙතපරිග්‍රහ වස්තුවෙහිද; අනාපත්ති; ඇවැත් නොවේ.

239 එත්ථ, මේ ද්විතීය පාරාජිකා විනිශ්චයෙහිද; වත්තබ්බො, (අවසානයෙහි) කියයුතුවූ; යො පන පාළිමුත්තවිනිච්ඡයො, ශික්‍ෂාපද

240 පරාජිතානෙකමලෙන වුත්තං පාරාජිකං යං දුතියං ජිනෙන,
වුත්තො සමාසෙන මයායං වණ්ණො එත්තාවං අසෙසෙන සියා නො
සමෙච්චං.

ඉති විනයවිනිච්ඡයෙ දුතියපාරාජිකකථා නිට්ඨිතා.

---

පාළියෙහි නොඑනලද යම් විනිශ්චයක් වනාහි; (වෙස්ද) තං, (සමුච්චයාද්‍ය) ඒ විනිශ්චය; මයං, අපි, පරතො, මත්තෙහි; පකිණ්ණකෙ එව, ප්‍රකීර්ණකයෙහි ම; භණිස්සාම, කියන්නෙමු.

240 පරාජිතා'නෙකමලෙන, පරාජිත, (සමුච්ඡෙදප්‍රහාණාදීන්) පරදවනලද; අනෙකමලෙන, (රාගාදි) නොයෙක් මල ඇත්තාවූ; ජිනෙන, (පස් මරුන් දිනූ) සර්වඥයන්වහන්සේ විසින්; දුතියං, දෙවනවූ; යං පාරාජිකං, (අදත්තාදාන නම්) යම් පාරාජිකාවක්; වුත්තං, වදාරනලද; අයම්,† ඒ දෙවනපාරාජිකාවගේද; අයං, (මේ)අර්ථයතෙම;(මාවිසින් කියනලදී) අසෙසතො, නිඃශෙෂයෙන්; එත්තාවං, සියන්ව; හොයි, * නවෙරත්නම්; සමෙච්චං, සමර්ථවේද.?

---

A අංසවසාඛ්‍යාසූණෙන සහවංසනාය සමුච්ඡෙදප්පහාණෙන පරාජිතා රාගාදයො අනෙකා කිලෙසමලා යෙන-සො පරාජිතා'නෙකමලො-තෙන—


---

† ච. ශබ්දය සමුච්චයාර්ථ හෙයින් ප්‍රථම පාරාජිකාවද්‍යගැනේ * හි ශබ්දය අවධාරණාර්ථයෙහි වේ.

---

රත්දෙණෙඩි මහාචෛත්‍ය පරිවෙණාධිපති
ගෞරවාහී ගණාචාර්ය තොටගමුවේ පඤ්ඤාසේඛරමොලිතිස්ස මහාස්ථවිර
ස්වාමීන්ද්‍රයන් වහන්සේගේ ශිෂ්‍යවූ
වලගෙදර සොමාලොක තිස්ස ස්වාමීන්විසින් ලියනලද
—— විනයාර්ථදීපිකා ——
විනයවිනිශ්චය ව්‍යාඛ්‍යාවෙහි ද්විතීය පාරාජිකාර්ථ ව්‍යාඛ්‍යානය
මෙතෙකින් නිමියේය.

# සබ්බ දානං ධම්ම දානං ජිනාති



නිබ්බාන පච්චයෝ හෝතු